SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

# නිරවද්‍යභාවය උසස් කිරීම

ආර්ථිකය වර්ධනය වන අවස්ථාවකදී සාධාරණභාවය හා නිරවද්‍යභාවය කෙරෙහි දක්වන අවධානය අඩුවිය හැක. ඒසේම අපගේ වර්ධනය වන ආර්ථිකය තුළ ආයෝජනය කිරීමට බලාපොරොත්තුවෙන් සාමාජයේ බහුතර කොටසක් බලාසිටීම නිසා අපගේ නියාමන භූමිකාව වඩාත් තීරණාත්මක වී ඇත. එමනිසා ආයෝජකයින්ගේ අයිතීන් ආරක්‍ෂාවන පරිසරයක් නිර්මාණය කිරීම අපගේ රාජකාරිය වේ. ඒ සඳහා අවධානය යොමුකරමින් උසස් නිරවද්‍යභාවයෙන්, සථිරභාවයෙන් හා විශ්වාසනීයත්වයෙන් යුතුව නියාමන පද්ධතිය ශක්තිමත් කිරීම අපගේ බලාපොරොත්තුවයි.

වාර්ෂික වාර්තාව
2014

## අපගේ දැක්ම

ඵලදායී කාර්යක්ෂම සහ ක්‍රියාකාරී සුරැකුම්පත් වෙළෙඳපොළ විධිමත්කරණයෙහි දකුණු ආසියාවේ ප්‍රමුඛයා බවට පත්වීම

## අපගේ මෙහෙවර

සාධාරණ සහ කාර්යක්ෂමවූත්, නියාමානුකූල සහ පාරදෘශ්‍යවූත්, සුරැකුම්පත් වෙළෙඳපොළක් ප්‍රවර්ධනය. සංවර්ධනය සහ පවත්වාගෙන යෑම

## පටුන


| | |
|---|---|
| අපගේ දැක්ම සහ මෙහෙවර | 1 |
| සභාපතිතුමන්ගේ සමාලෝචනය | 3 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය | 7 |
| කොමිෂන් සභා සාමාජිකයන් | 10 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය | 14 |
| ආර්ථික සමාලෝචනය | 16 |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සමාලෝචනය | 19 |
| කළමනාකාරීත්වය | 21 |
| කාර්ය මණ්ඩලය | 22 |
| මෙහෙයුම් සමාලෝචනය | 26 |
| අතිරේක තොරතුරු | 53 |
| දත්ත ගොනුව | 58 |

මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 62 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 64 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 65 |
| සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 66 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 67 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සෙස් අරමුදල | 68 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය - වන්දි අරමුදල | 69 |
| ගිණුම්කරණ ප්‍රතිපත්තීන් | 70 |
| මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් | 72 |

මූල්‍ය ප්‍රකාශන - පියවීම සහතික කිරීමේ අරමුදල

| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 82 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 84 |
| මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය | 85 |
| ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 86 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 87 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 88 |


| | |
|---|---|
| සටහන් | 91 |
| ආයතනික තොරතුරු | ඇතුල් පිටකවරය |



## සභාපතිතුමන්ගේ සමාලෝචනය



"තව දුරටත් මා විශ්වාස කරන්නේ සැලකිය යුතු කාල සීමාවක් තුළ විවිධ වැදගත් අංශ ආවරණය වන පරිදි ශක්තිමත් ප්‍රතිඵල අත් කර ගැනීමට ප්‍රමුඛතාවයක් ලබාදීම අනිවාර්ය බව ය. 2016 අවසාන වීමට පෙර මධ්‍යම ප්‍රතිපාර්ශවීය ආයතනයක් ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම හා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අසාමූහීකරණය සිදු කිරීම සාර්ථක කරගත හැකි බවට මා තුළ දැඩි විශ්වාසයක් පවතී."



**තිලක් කරුණාරත්න**
*සභාපති*

දිගුකාලීන අරමුදල් සම්පාදනයේ ඉතා වැදගත් මෙවලමක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ සලකන අතර, එය ආර්ථික වර්ධනයේ ප්‍රධාන මෙහෙයවන්නකු ලෙස ද කටයුතු කරයි. ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතනය ලෙස අප කොටස් නිකුත් කරන්නන් සඳහා අරමුදල් සම්පාදනය සමඟ ආයෝජකයින්ගේ ආයෝජන අයිතිවාසිකම් ප්‍රමාණාත්මකව ආරක්ෂා වන ක්‍රමවේද හා ප්‍රතිපත්ති සහිත සාධාරණ, කාර්යක්ෂම හා ක්‍රමානුකූල වෙළෙඳපොළක් බිහි කිරීමට හා පවත්වා ගැනීමට බලාපොරොත්තු වේ. එම නිසා ඉහත අවශ්‍යතාව ඉෂ්ඨ කිරීමට සහ විශ්වාසනීය මිල තීරණය කිරීමේ යාන්ත්‍රණයක් සහතික වීම, සියලුම ආයෝජකයින්ට වෙළෙඳපොළට ඇතුළත්වීමේ හැකියාව නිර්මාණයට, වෙළෙඳපොළ ඇණහිටීම් මැඩ පැවැත්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට හා වෙළෙඳපොළ අනාවරණයන් කාර්යක්ෂමව ප්‍රචාරණය කිරීම සඳහා සුරැකුම්පත් වෙළෙඳපොළෙහි නියාමන විෂය පථය නිර්මාණය වී ඇත. ප්‍රමාණය ඉක්මවා නියාමන ක්‍රියාමාර්ග තර කිරීම වෙළෙඳපොළෙහි වර්ධනයට බාධා කළ හැකි බැවින් හා ක්‍රියාකාරී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අධෛර්යයට පත් කළ හැකි බැවින් ඉතා සමබර නියාමන පරිසරයක් බිහි කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරය වේ.

ආයෝජකයින් ආරක්ෂා කිරීමට මෙන්ම වෙළෙඳපොළෙහි විශ්වාසනීයභාවය පවත්වා ගැනීමේ ප්‍රධානතම හා වැදගත්ම සාධකය වන්නේ නිරන්තරව ගුණාත්මකභාවයෙන් හා වගකීමෙන් යුතු තොරතුරු ලබා දීමයි. අනාවරණයන් නැතහොත් විශ්වාසදායී හෙළිදරව් කිරීම් තුළින් ආයෝජකයින්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීමේ හැකියාව ඉහළ දැමීම, කොටස් හිමියන්ගේ ආයෝජන ආකල්පය උසස් කිරීම මෙන්ම සමාගම් කළමනාකාරීත්වයන්ට අනිසි කටයුතුවල යෙදීමට ඇති ඉඩකඩ අවම කිරීමත් සිදු වේ. ප්‍රමාණාත්මක තොරතුරු කාලානුරූපීව ලබා දෙන විට බොහෝ ආයෝජකයින් වගකීමෙන් ආයෝජනය කරනු ඇත. කාලෝචිත හා විශ්වාසනීය තොරතුරුවල හිඟකම හේතුවෙන් වෙළෙඳපොළ සංවර්ධනය මෙන්ම ආයෝජකයින් තුළ පවතින පැහැදීමට ද බාධා පැමිණෙන නිසා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් දැඩි නීතිරීති ක්‍රියාත්මක කරන අතර, අනුකූල නොවන තත්ත්වයන් වලදී දැඩි බලාත්මක ක්‍රියාමාර්ග ගනු ලබයි. අපගේ ප්‍රධාන භූමිකාවට සමගාමීව වෙළෙඳපොළෙහි විශ්වාසය ඉහළ දැමීම සඳහා අවදානම් නිරීක්ෂණය සහ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ඉදිරියටත් ගනු ලැබේ. පද්ධතිය තුළ පවතින අවදානම හේතුවෙන් අනාගතයේ දී වෙළෙඳපොළට මෙන්ම සමස්ථ ආර්ථිකයට බලපෑම් කළ හැකි නිසා අපගේ සුපරීක්ෂණ රාමුව තුළ නියාමනයට ලක්වන ආයතනවල නිකුත් කරන්නාගේ, ගණුදෙනුවල හා වෙළෙඳපොළෙහි අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීමට බලාපොරොත්තු වේ.

ආයෝජකයින්ගේ වත්කම් ආරක්ෂා කිරීමට හා නිතිපතා අභ්‍යන්තර පාලන ක්‍රම සමඟ අනුකූලතාවය සඳහා අපගේ අවදානම් මත වූ සුපරීක්ෂණ රාමුව තුළ වෙළෙඳපොළ අතරමැදියන්ගේ ප්‍රාග්ධන හා අනෙකුත් වැදගත් අවශ්‍යතා සඳහා අවධානය අප යොමු කර ඇත. සුරැකුම්පත් වෙළෙඳපොළ පවතින ගණුදෙනු පියවීමේ අවදානම අවම කිරීම සඳහා අපගේ සුපරීක්ෂණ භූමිකාව තව දුරටත් පුළුල් කරන ලදී. මෙම අරමුණ ඉෂ්ඨ කර ගැනීම සඳහා කොළඹ කොටස්

# සභාපතිතුමන්ගේ සමාලෝචනය

වෙළෙඳපොළ හා ඒකාබද්ධ වී සුරැකුම්පත්, කොටස්, සාංගමික බැඳුම්කර හා අපගේ විෂය පථය තුළ ඉදිරියේ දී පැමිණීමට අපේක්ෂිත මූල්‍ය උපකරණවල පියවීම් කටයුතු සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශවකරණ ආයතනයක් (CCP) ලෙස නිෂ්කාශන ආයතනයක් ස්ථාපනය කිරීම ආරම්භ කර ඇත. එම නිසා ගෝලීය වශයෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළට සම්බන්ධ ව්‍යාපෘති සඳහා ම විශේෂීකරණය වූ උපදේශන සමාග මක සහාය සියලු පහසුකම් සහිත මධ්‍යම ප්‍රතිපාර්ශවීය ආයතනයක් ස්ථාපිත කිරීමට ලබාගෙන ඇත. මේ තුළින් පියවීම් අකර්මන්‍ය අවදානම් හා ප්‍රතිපාර්ශව අවදානම ප්‍රමාණාත්මක ලෙස අවම කිරීමට බලාපොරොත්තු වේ.

වෙළෙඳපොළ අක්‍රමිකතා, නියාමනයට ලක්වන ආයතනවල වැරදි භාවිතයන් මෙන්ම සාංගමික හෙළිදරව් කිරීම්වලට අදාළ වැරදි ඇතුළුව සියලුම නියාමන තත්ත්වයන් කඩ කරන අය සඳහා දැඩි බලාත්මක ක්‍රියාමාර්ග ගැනීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව බැඳී සිටී. කෙසේ වෙතත් වර්තමාන ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් නීතිය අවුරුදු 28 පෙර හඳුන්වා දුන් එකක් වන අතර, එහි බලාත්මක විෂය පථය අපරාධ නීතිය මත ගොඩනැගීම හා වැරදි සමථයට පත් කිරීම මත ගොඩනැගීම වැනි අඩුපාඩු රාශියක් පවතී. ඒ හේතුවෙන් අතීතයේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රධාන වශයෙන් අනතුර ඇඟවීමේ ලිපි නිකුත් කිරීම, ආයෝජන උපදේශකයින් සඳහා තාවකාලික තහනම් කිරීම් සිදු කිරීම හා සමථයකට පත් කිරීම සිදු කරන ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රසාරණය වීම තුළ බලාත්මක කටයුතු සඳහා හැකියාව පුළුල් පරාසයකට විහිදුවීම සඳහා සුරැ කුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතට අත්‍යාවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතුව ඇත. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතෙහි යෝජිත සංශෝධන තුළින් අගතියට පත් ඕනෑම පුද්ගලයෙකුට යුක්තිය ඉෂ්ඨ කර ගත හැකිවීම ඇතුළුව පරිපාලන හා සිවිල් නීති පරාසයක් හඳුන්වා දෙනු ලැබේ.

මෙම සංශෝධන තුළින් නියාමන විශ්වසනීයභාවය හා වෙළෙඳපොළ විශ්වසනීයභාවය සඳහා පැහැදිලි මාවතක් බිහිවීම නිසා එම සංශෝධන කඩිනම් කිරීමේ උත්සාහය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආරම්භ කර ඇත. එසේම මෙම සංශෝධන තුළින් නව වර්ගවල වෙළෙඳපොළ අතරමැදියන් හඳුන්වාදීමටත්, ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු නියාමනය කිරීමට සහ ව්‍යුත්පන්න උපකරණ සඳහා නියාමන පහසුකම් සැපයීම වැනි දෑ සඳහා අවශ්‍ය වන අන්තර්ජාතික සුරැකුම්පත් කොමිෂන් සභා සංවිධානයේ ප්‍රමිතීන්වලට සමගාමී ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පාලන ව්‍යුහය සැකසෙනු ඇත.

ආයෝජකයින් තුළ පවතින විශ්වාසය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි පදනම වන අතර, ශක්තිමත් යහපාලනයක් තුළින් හා දේශීය හා විදේශීය ආයෝජකයින් ආකර්ශනය කිරීම හා ආර්ථික වර්ධනය වේගවත් කළ හැකිය. ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමන ආයතනය ලෙස නීති හා රෙගුලාසි රාමුවක් හරහා වගවීම, සාධාරණත්වය හා විනිවිදභාවය සහතික කරන සාංගමික යහපාලන පරිචයන් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දැඩි වෙහෙසක් ගනී. කෙසේ වෙතත් සාංගමික යහපාලනය උසස් කිරීමට ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි සියලුම පාර්ශවකරුවන්ගේ දායකත්වය අවශ්‍ය වේ. අප මේ වන විට ඉහත තත්වයන් තුළ බොහොමයක් ක්ෂේත්‍ර ආවරණය කර ඇතත් තවත් සිදු කිරීමට ඉතිරිව බොහෝ දෑ පවතී. එම නිසා ප්‍රාග්ධන වෙළෙඳපොළ හවුල්කරුවන් සමඟ සාංගමික යහපාලන ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමට අප බලාපොරොත්තු වෙමු.

නියාමන ආයතනය ලෙස ආයෝජක අධ්‍යාපනයෙහි හා මූල්‍ය සාක්ෂරතාවයෙහි අවශ්‍යතාවය අද තරම් කිසිදාක වැදගත් නොවන බව අපගේ සිතුවිල්ල වී ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ආයෝජන ආරක්ෂාව ඉහළ දැමීම, ආයෝජකයින් තුළ විශ්වාසය ප්‍රවර්ධනය හා ආයෝජක සහභාගීත්වය ධෛර්යමත් කිරීමට අවශ්‍ය මූලික දක්ෂතා හා දැනුම සම්පාදනය කිරීම වටා අපගේ ආයෝජක අධ්‍යාපන ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක වේ.

ආයෝජක අධ්‍යාපනය අත්‍යවශ්‍ය නියාමන ක්‍රමයක් වීම නිසා ආයෝජකයින් දැනුමෙන් බලගැන්වීම සඳහා විවිධ ක්‍රම ක්‍රියාවට නංවා ඇති අතර, සම්මන්ත්‍රණ, වෙළෙඳ ප්‍රදර්ශන, ගුවන් විදුලි හා රූපවාහිනී සංවාද මගින් සමාජයේ විවිධ ප්‍රජා කොටස් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජන කිරීමට අවශ්‍ය දැනුම ලබා දී ඇත. අප බලාපොරොත්තු වන්නේ දැනුමෙන් බල ගැන් වූ ආයෝජකයින් ඔවුන්ගේ ආයෝජන තීරණ වඩා වගකීමෙන් ගනු ලබන බවයි. ආයෝජක අධ්‍යාපනය යනු සාමූහිකව ඉෂ්ඨ කළ යුතු වගකීමක් බැවින් එහි අරමුණු ඉෂ්ඨ කර ගැනීමට අනෙකුත් පාර්ශවකරුවන් සමග සාමූහිකව අප ක්‍රියා කළ යුතුය.

ආයෝජකයින්ට ලබාදෙන ආයෝජන උපදෙස්වල ගුණාත්මකභාවය ආයෝජන උපදේශකයින්ගේ ගුණාත්මකභාවය මත රඳා පවතින බැවින් කර්මාන්තය තුළ රාජකාරී කටයුතු කිරීමට අවශ්‍ය දක්ෂතා හා වෘත්තීය නිපුණත්වයෙන් යුතු ප්‍රාග්ධන වෙළෙඳපොළ වෘත්තිකයින් බිහි කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සිදු කරනු ලබයි. ආයෝජකයින්ගේ යහපත වෙනුවෙන් කොටස් තැරැව්කාර ආයතන තම ආයෝජන උපදේශකයින් සඳහා ශක්තිමත් පුහුණු පරිසරයක් බිහි කරනු ඇතැයි කොමිෂන් සභාව ඉහළ බලාපොරොත්තු තබාගෙන ඇත.

සැලකිය යුතු කාලයක් තිස්සේ කොළඹ කොටස් හුවමාරුව අසාමූහීකරණය කරන ක්‍රියාමාර්ගයට පහසුකම් සැලසීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රමුඛතාවයක් වී ඇත. ප්‍රබල නෛතික වෙනස්කම් මෙන්ම රජයේ සහයෝගය අවශ්‍ය මෙම වැදගත් ක්‍රියාමාර්ගය තුළින් කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ව්‍යාපාර ආකෘතිය ලාභ බලාපොරොත්තුවෙන් කටයුතු කරන හුවමාරුවක් බවට පරිවර්තනය කිරීම, එහි පාලන ව්‍යුහය වෙනස් කිරීම හා වටිනාකම ප්‍රසාරණය සඳහා හුවමාරුවේ හැකියාව ඉහළ දැමීමටත් බලාපොරොත්තු වේ. වර්ෂය තුළ දී නීති කෙටුම්පත් සම්පාදක විසින් අසාමූහීකරණ පනතෙහි කෙටුම්පත අවසාන කර ඇති අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එය අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ආයෝජකයින්ගේ ආයෝජන කැමැත්ත ආරක්ෂා කිරීම සඳහා වූ සංග්‍රහ හා මාර්ගෝපදේශ මෙන්ම වෙළෙඳපොළ අතරමැදියන් විසින් සිදු කළ යුතු අනුකූලතා සඳහා ඉතා සමබර ප්‍රමිත හා නීතිරීති සම්පාදනයට අප නිරන්තරයෙන් බලාපොරොත්තු වේ.

අතරමැදියන් තුළ වූ අවදානම නිරූපනය කරන අයුරින් ඇතුල්වීම සඳහා වූ අවම ප්‍රමිතීන් මෙන්ම මූලික හා පවත්වාගත යුතු ප්‍රාග්ධන අවශ්‍යතා හා අනෙකුත් අවශ්‍යතා සම්බන්ධයෙන් ද අප විසින් නියාමන සම්පාදනය කර ඇත.


අන්තර්ජාතික ප්‍රමිතීන් සමඟ ගැලපීමට සහ ශක්තිමත් ව්‍යාපාර පරිචයන් සහතික කිරීම සඳහා මෙන්ම ආයෝජකයින්ගේ හා වෙළෙඳපොළ විශ්වාසදායී බව සඳහා ගැලපෙන ආරක්ෂාවක් සඳහා කොටස් තැරැව්කාර ආයතන ඇතුළු අතරමැදියන්ගේ ඇතුල්වීමේ අවම ප්‍රමිතීන් සහ පවත්වාගත යුතු අවම අවශ්‍යතා තව දුරටත් උසස් කිරීමට අප බලාපොරොත්තු වෙමු.

සාංගමික ණය සුරැකුම්පත් නිකුතුන් වල දී ආයෝජකයින්ට වඩා දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා නිකුතුන් සිදු කරන සමාගම්වල මූල්‍ය ශක්‍යතාව හා ණය යෝග්‍යතාව පිළිබඳ විෂය මූලික හා ස්වාධීන නිගමනයන් ලබාදීමට ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන පත් කර ඇත. ඊට අමතරව එකිනෙක ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන ඔවුන්ට ආවේණික වූ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් පවත්වා ගනී. එම නිසා තොරතුරුවල නොගැලපීම අවම කිරීම සඳහා ශ්‍රේණිගත වූ සුරැකුම්පත්වල ශ්‍රේණීන්වල තාර්කිකභාවය සංස්ථා ප්‍රකාශ තුළ අඩංගු කිරීම අනිවාර්ය කිරීමේ වැදගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෙන ඇත.

ආයෝජකයින් සඳහා ගණුදෙනු කිරීමට පහසුකම් සලසමින් ප්‍රාග්ධන වෙළෙඳපොළ ඉතා වැදගත් භූමිකාවක් කොටස් තැරැව්කාර ආයතන විසින් ඉෂ්ඨ කරනු ලැබේ. පසුගිය කාලය තුළ සේවා සැපයීම තුළ කොටස් තැරැව්කාර කර්මාන්තය සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළ අතරම වෙළෙඳපොළෙහි වූ එම තැරැව්කාර ආයතන ප්‍රමාණයේ ද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. විශේෂයෙන් සුළු පරිමාණ ආයෝජකයින්ට ආයතනයේ විශ්වාසවන්තභාවය විනිශ්චය කිරීමෙන් තැරැව්කාර සමාගමක් තෝරා ගැනීම සඳහා තැරැව්කාර සමාගම්වලට ශ්‍රේණිගත කිරීමක් අනිවාර්ය කිරීමේ හැකියාව අප නිරීක්ෂණය කරමින් සිටී. එම ශ්‍රේණිගත කිරීම තුළින් වෙළෙඳපොළෙහි විශ්වාසනීයභාවය රැක ගැනීමට හා ආයෝජකයින්ගේ ආයෝජන අයිතීන් ආරක්ෂා කිරීම බලාපොරොත්තු වේ. එය ක්‍රියාත්මක කිරීමට පෙර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කර්මාන්තයේ උපදේශන ලබා ගැනීමට අපේක්ෂා කරයි.

තව දුරටත් මා විශ්වාස කරන්නේ සැලකිය යුතු කාල සීමාවක් තුළ විවිධ වැදගත් අංශ ආවරණය වන පරිදි ශක්තිමත් ප්‍රතිඵල අත් කර ගැනීමට ප්‍රමුඛතාවයක් ලබාදීම අනිවාර්ය බව ය. 2016 අවසාන වීමට පෙර මධ්‍යම ප්‍රතිපාර්ශවීය ආයතනයක් ස්ථාපිත කිරීම, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම හා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අසාමූහීකරණය සිදු කිරීම සාර්ථක කරගත හැකි බවට මා තුළ දැඩි විශ්වාසයක් පවතී.

ඉතා දක්ෂ හා නිපුණත්වයෙන් යුක්ත වෘත්තිකයින් පිරිසක් කොමිෂන් සභාවට පත් කිරීම පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ විෂය භාර ගරු අගමැතිතුමන්ට මාගේ ස්තුතිය පුද කර සිටිනවා. එසේම ගරු නියෝජ්‍ය ඇමති ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමන්ටත්, අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කිත්සිරි ලියනගේ මැතිතුමන්ටත් ලබාදුන් සහයෝගය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි. 2014 වර්ෂයේදී ලබාදුන් දායකත්වය සඳහා හිටපු සභාපති තුමන් ඇතුළු කොමිෂන් සභා සාමාජිකයන්ටද මාගේ ස්තූතිය පුද කරමි. අප හට අපගේ අරමුණු වඩාත් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමට ප්‍රධාන හේතූන් ලෙස ලේකම් කාර්යාලයේ සේවක මණ්ඩලය තුළ වූ දැඩි කැපවීම හා සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය හඳුනාගත හැක. ශ්‍රී ලංකා ආර්ථිකයේ අවශ්‍යතාවය සම්පූර්ණ කළ හැකි ක්‍රමවත් සුරැකුම්පත් වෙළෙඳපොළක් ලඟා කර ගැනීම සඳහා ඵලදායී සුපරීක්ෂණය, ආවේක්ෂණ සහ බලාත්මක ක්‍රියාමාර්ග සමග දූරදර්ශී නියාමන රාමුවක් තුළ ඉදිරියටත් අප කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගෙන සිටිමු.



**තිලක් කරුණාරත්න**
*සභාපති*


2015 මැයි 23 වෙනි දිනදීය.



## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



"මා විශ්වාස කරන්නේ මහජනතාවගේ විශ්වාසය හා පැහැදීම නැවත ලබාගැනීමට එකිනෙක සහභාගීකරුවන්ගේ ක්‍රියාමාර්ග තුළ ශක්තිමත් ආචාරධර්ම ප්‍රමිතීන් ඇතුළත් විය යුතුය යන්නයි. මනා ක්‍රියාපටිපාටි නීතියක් තුළින් හෝ නියාමනයන් තුළින් ස්ථාපිත කළ නොහැකි අතර එය සමාගම් වල අභ්‍යන්තර දිරිගැන්වීම් හා ප්‍රතිපත්ති තුළින් ඇති විය යුතු දෙයකි. සියළුම පාර්ශවයන්ගේ වගකීම් හා යෝග්‍යතා මගින් අපගේ නියාමන හා පාලන රාමුව නැවත ශක්තිමත් කිරීමට හැකිවනු අතර ප්‍රාග්ධන වෙළෙඳපොළේ අභිප්‍රායන් සහතික කිරීමටද හැකියාව ලැබේ."



**වජිර විජේගුණවර්ධන**
*අධ්‍යක්ෂ ජනරාල්*

ආයෝජකයින්ගේ ආයෝජන අයිතීන් ආරක්ෂා කිරීම, සාධාරණ, ඵලදායී හා විනිවිදභාවයෙන් යුතු ප්‍රාග්ධන වෙළෙඳපොළකට පහසුකම් සැපයිය හැකි ක්‍රියාමාර්ග රාශියක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ක්‍රියාවට නැංවූ වර්ෂයක වර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මා ඉතා සතුටට පත්වෙමි.

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයා ලෙස අපගේ මූලික වගකීම වනූයේ මූර්ත ආර්ථිකයට මූල්‍ය සම්පාදනය කළ හැකි ලෙස ඉතුරුම් සහ ආයෝජන යොදාගැනීමේ යාන්ත්‍රණය ක්‍රමවත්භාවයෙන් යුතුව කාර්යක්ෂම හා ඵලදායීව පවත්වා ගැනීම සහතික කිරීම වේ.

වර්ෂය සඳහා අපගේ සංවර්ධන වැඩසටහනේ අරමුණ වූයේ තවදුරටත් වෙළෙඳපොළ වර්ධනය සහ තිරසාරභාවය ප්‍රවර්ධනය පිළිබඳ දැඩි අවධානයෙන් කටයුතු කිරීමයි. රටේ ආර්ථික වර්ධනයට විශාල දායකත්වයක් ලබාදීමට හැකිවන ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළ භූමිකාව පුළුල් කිරීමේ දැක්මක් ඇතිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය වේගවත් කිරීම සඳහා 2006-2015 සඳහා ප්‍රධාන සැලැස්ම ක්‍රියාවට නංවන ලදී. එහිදී 2012 වර්ෂයේදී ක්‍රියාවට නැංවූ දස වැදෑරුම් ව්‍යාපෘති සඳහා විශාල ප්‍රමුඛතාවයක් 2006 දී ඇරඹූ ප්‍රාග්ධන වෙළෙඳපොළ සැලැස්මෙන් ලැබිණි.

මීට වසර 28 කට පමණ පෙර ස්ථාපිත කළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත මගින් (1991, 2003 හා 2009 සංශෝධිත) නවීන ප්‍රාග්ධන වෙළෙඳපොළක මතුවන අභියෝග හා ගැටළු වලට මුහුණදීමට හා අනාගත අවශ්‍යතා වලට මුහුණදීමට හැකියාවක් නොමැත. අපගේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත් සංශෝධන වලට පසුව වර්තමාන නීතියේ පවතින අඩුපාඩු වලට විසඳුම් ලබාගැනීමට සහ අපගේ නියාමන බලතල පුළුල් කරගැනීමට හැකිවනු ඇත. මෙම පනත් සංශෝධන තුළින් සිවිල් සහ පරිපාලන බලතල හඳුන්වාදීම, වැරදි සඳහා දැඩි දඬුවම් ලබාදීම හා අයථා ක්‍රියාකාරකම් හේතුවෙන් පාඩු විඳීමට සිදුවූ ආයෝජකයින්ට වන්දි ක්‍රම ඇතිකිරීම පිළිබඳ ඉතාමත් විධිමත් විසඳුම් ලබාදී ඇත. එමෙන්ම මේ දක්වා නියාමනයට භාජනය නොවූ ආයෝජන බැංකු සහ ලැයිස්තුගත නොකළ සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ වැනි පාර්ශව මෙන්ම ඒ ඒ සහභාගීකරුවන්ගේ ව්‍යාපාර පවත්වා ගැනීම නියාමනයටද හැකියාව ලැබේ.

අපගේ සුපරීක්ෂණ භූමිකාව ශක්තිමත් කිරීම තුළින් වෙළෙඳපොළ ස්ථායීභාවය තහවුරු කිරීමටත් ගණුදෙනු නිශ්කාෂණයේ හා පියවීමේ වැදගත් අංගයක් වන මූල්‍ය වෙළෙඳපොළ යටිතළ පහසුකම් පුළුල් කිරීමටත් බලාපොරොත්තු වේ. වර්තමාන ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ගණුදෙනු පියවීම කඩවීමේ අවදානම අවම කිරීම සහ ප්‍රතිපාර්ශව අවදානම හා වත්කම් කැපවීමේ අවදානමට පිළියම් ලෙස මධ්‍යම ප්‍රතිපාර්ශවකරණ ආයතනක වැදගත්කම පිළිබඳ වසර ගණනාවක් සාකච්ඡා කළ අතර එය වර්තමානයේදී යතාර්ථයක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව හා ශ්‍රී ලංකා මහබැංකුව ඒකාබද්ධ වී කොටස්, සාංගමික ණයකර සහ රජයේ සුරැකුම්පත් වල පියවීම් සඳහා මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් නිර්මාණය කර එයින් ශ්‍රී ලංකාවේ වර්ධනය වන ප්‍රාග්ධන වෙළෙඳපොළ සඳහා ජාතික මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතයක් ස්ථාපිත කිරීමට හැකිවනු ඇත. 2014 වර්ෂය තුළදී උපදේශන සමාගමක් සමඟ ගිවිසුම්

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය

අත්සන් කළ අතර ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් ගණුදෙනු වලද නව යුගයක් සනිටුහන් කරමින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ ජාත්‍යන්තර පියවීම් සඳහා බැංකුවේ සහ මධ්‍යම ප්‍රතිපාර්ශවකරණ නිශ්කාෂණ ආයතන පිළිබඳ යුරෝපීය සංවිධානයේ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව එහි විශේෂිත ආකෘතිය සකස් කොට අත. මධ්‍යම ප්‍රතිපාර්ෂවකරණ ආයතනයක් පිහිටුවීම හරහා ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට G20 සංවිධානයේ අන්තර්ජාතික කොන්දේසි සපුරාලීමට හැකිවීමෙන් මධ්‍යගත පියවීම් පරිසරයක් ඇති සියළුම රටවල් වලට පිවිසීමේ හැකියාවද ලැබෙන අතර ව්‍යුත්පන්න වැනි උපකරණ හඳුන්වාදීම සඳහා අවශ්‍ය පරිසරයද නිර්මාණය වනු ඇත.

සාංගමික අංශයේ දිගුකාලීන ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු පද්ධතියට අමතරව ආර්ථික සංවර්ධනයට සහයෝගය දීමට හැකියාව ඇති දැවැන්ත භූමිකාවක් ලෙස ශක්තිමත් බැඳුම්කර වෙළෙඳපොළක් තිබීම වැදගත්ය. එසේම වඩාත් සංවර්ධිත බැඳුම්කර වෙළෙඳපොළක් මගින් මූල්‍ය පද්ධතිය තුළ අවදානම විවිධාංගීකරණය කිරීමටත්, ණය ගන්නන් සඳහා විශිෂ්ඨ ඵලදායීතාවයෙන් යුක්ත අරමුදල් වෙන්කිරීම සහතික කරන ණය මිල කිරීම් හා වෙන්කිරීම් සිදුකරන වෙළෙඳපොළ යාන්ත්‍රණයක් යොදාගැනීමටත් හැකිවේ. සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තුළ නිකුතුන් සඳහා රඳවාගත් බදු නිදහස් කිරීම් ලබාදීමට හැකිවීම තුළ 2013 හා 2014 වර්ෂ වල පිළිවෙලින් රුපියල් බිලියන 68.3 හා රුපියල් බිලියන 54.2 ක් ණය සම්පාදනය කරගන්නා ලදී.

ගෝලීය වශයෙන් ණය ගෙවීම පැහැරහැරීමේ අවදානම සඳහා අවධානය වැඩවීම නිසා ප්‍රාථමික වෙළෙඳුන්ට සහ අනෙකුත් ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන්ට සාංගමික ණය සුරැකුම්පත් ගණුදෙනු සඳහා ඉඩ සලස්වාදීම, නිකුත් කරන්නන් සඳහා වූ නිකුතු ක්‍රියාවලි හා ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා නවීකරණය කිරීම, ගණුදෙනු සහ වාර්තාකරණ යටිතළ පහසුකම් උසස් කිරීම, ද්විතියික වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ දැමීමට පාර්ශවකරුවන් අතර සාංගමික බැඳුම්කර සඳහා ප්‍රතිමිලදී ගැනීම් පහසුකම් ලබාදීම සහ ශ්‍රී ලංකාවේ සාංගමික බඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය සඳහා ලැයිස්තුගත නොකළ බැඳුම්කර නිකුතුන් වලට සම්බන්ධ තොරතුරු ප්‍රසිද්ධ කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම වැනි ප්‍රතිපත්තිමය තීරණ ගණනාවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වර්ෂය තුළදී ගනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග තුළින් බැඳුම්කර නිකුතුන් ව්‍යූහගත කිරමේදී හා උපක්‍රමශීලී කිරීමේදී ඉහළ නම්‍යශීලීත්වයක් සමඟ නිකුත් කරන්නන් හා අතරමැදියන් සැපයීමත් සිදුකරයි.

තරඟකාරී ගෝලීය පරිසරය තුළදී හා වෙනස්වන තත්ත්වයන් හමුවේ පැමිණෙන අභියෝගවලට මුහුණදීම සමඟ සියළුම පාර්ශවකරුවන්ගේ අභිලාෂයන් ඉෂ්ඨ කිරීමට වේගවත් හා කාර්යක්ෂම අයුරින් වන කොටස් හුවමාරුවක උපායශීලී අභිලාෂයන් වෙනුවෙන් අවශ්‍ය වන්නාවූ ප්‍රධාන ක්‍රියාමාර්ගයක් ලෙස කොළඹ කොටස් හුවමාරුවේ අසාමූහිකරණ ක්‍රියාවලිය හඳුනාගත හැකිය. වර්ෂය තුළදී අසාමූහිකරණ කෙටුම්පත සකස් කිරීම අවසන් කර ඇති අතර මෙම අසාමූහිකරණය ක්‍රියාත්මක කළ හැක්කේ එය පාර්ලිමේන්තුව තුළ නීතියක් බවට ස්ථාපිත වූ පසුවය. කොමිසමේ අනුමැතිය අවශ්‍ය වන්නාවූ වටිනාකම බෙදා වෙන්කිරීම හා අසාමූහිකරණයේදී අනුගමනය කළයුතු පිළිවෙත වර්ෂය තුළදී සාකච්ඡාවට භාජනය කරන ලදී. අසාමූහිකරණය කිරීමෙන් පසුව කොළඹ කොටස් හුවමාරුව එහි උපායශීලී අභිලාෂය කරා හඹායන, නවීකරණය වූ තීරණ ගැනීමට සහ ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියාකිරීමට හැකි උසස් තත්ත්වයකට පත්වනු ඇත.

ඉතුරුම් සාර්ථක ආයෝජන බවට පරිවර්තනය කළ හැකි ඵලදායී හා කාර්යක්ෂම ප්‍රාග්ධන වෙළෙඳපොළවල් මත ආර්ථික වර්ධනය බොහෝවිට තීරණය වේ. සාර්ථක ඉදිරි ගමනක් සඳහා තීරණාත්මක වන්නාවූ දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කරගැනීමට හා විදේශීය කළඹ ආයෝජකයින්ට සුදුසු ආකර්ෂණීය පරිසරයක් විවර කරදීමට ප්‍රාග්ධන වෙළෙඳපොළ මහත් සේ උපකාරී වනු ඇත. මෙම අරමුණ ඇතිව ප්‍රාග්ධන වෙළෙඳපොළ අවස්ථාවන් පිළිබඳ දේශීය හා විදේශීය ආයෝජකයින් දැනුවත් කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හා කොළඹ කොටස් හුවමාරුව ඒකාබද්ධ වී 2014 වර්ෂයේදී විවිධ වැඩමුළු පවත්වන ලදී. ඒවා අතර 2014 වර්ෂයේ ඔක්තෝබර් මස කොළඹදී පැවැත්වූ ප්‍රාග්ධන වෙළෙඳපොළ සමුළුව ප්‍රධාන තැනක් ගන්නා ලදී.

විශේෂයෙන් එහිදී අන්තරජාතික අරමුදල් කළමනාකරුවන්ට ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළේ ආයෝජන අවස්ථා පිළිබඳ ගැඹුරින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. ඒ අතරතුර සිංගප්පූරුව, ලන්ඩන් සහ නිව්යෝර්ක් සහ හඳුනාගත් ස්ථාන වලදී විදේශීය දායකත්වය වර්ධනය කිරීමට අවශ්‍ය විදේශීය වැඩමුළු දියත් කරන ලදී.

තවදුරටත් වෙළෙඳපොළ සහභාගීකරුවන් අතර මනා චර්යාවන් දිරිමත් කිරීම සිදු කරන අතර වඩා වැදගත් වන ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ දැමීමටද විශාල බලපෑමක් සිදුකළ යුතුය. අවදානම් තත්වයන් අවම කිරීමේ අවශ්‍යතාවයන් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වෙළෙඳපොළ අතරමැදියන්ගේ අභ්‍යන්තර පාලන සඳහා යහපාලනයේ සඵලදායීත්වය තුළ අවදානම් මත වූ සුපරීක්ෂණ පසුබිමක් ක්‍රියාත්මක කරනු ඇත.

මුදල් විශුද්ධිකරණයට විරුද්ධව වීම සඳහා ඉහළ ප්‍රමිතීන්ගෙන් යුත් ක්‍රියාමාර්ග ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන් දියත් කිරීම සහතික කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිරතුරුවම බැඳී සිටී. වර්ෂය තුළදී මූල්‍ය ක්‍රියාමාර්ග කාර්ය බාලකායේ (FATF) නිර්දේශ සමඟ ශ්‍රී ලංකාව සිදුකළ තක්සේරුවකට අප සහභාගී වූ අතර මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදීන්ට මුදල් සම්පාදනය කිරීමට එරෙහිව ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීමට ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සඳහා ස්වාධීන අන්තර්-රාජ්‍ය ආයතනයක් වගකීම දරයි. ආයෝජක ආරක්ෂාව හා ඔවුන් බලගැන්වීම තවදුරටත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූලික ප්‍රමුඛතාවයක් වනු ඇත. ආයෝජකයින් අතර වඩාත් දැනුවත් හා මනා සම්බන්ධතාවයක් ඇති සහභාගීත්වයන් දිරිමත් කිරීම අපගේ අරමුණයි. අධ්‍යාපනික සම්මන්ත්‍රණ, පුවත්පත් ලිපි, රේඩියෝ මාධ්‍ය හරහා සාකච්ඡා වැඩසටහන්, රූපවාහිනී සාක්ච්ඡාමය වැඩසටහන් මගින් අපගේ ආයෝජකයින් දැනුවත් කිරීමට අප මහත් පරිශ්‍රමයක් දරන ලදී.

ඊට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් හුවමාරුව සිරස රූපවාහිනිය සමඟ ඒකාබද්ධ වී ප්‍රාග්ධන වෙළෙඳපොළ දැනුවත් භාවය ඉහළ නැංවීම සඳහා සකස් කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම රියැලිටි ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන පවත්වන ලදී.

එම වැඩසටහන් වල ප්‍රතිචාර අප ඇගයීම තුළින් ලබාගැනීමට හැකිවූ අතර එම ප්‍රතිචාර වලින් නිරූපණය වන්නේ අපගේ ආයෝජක අධ්‍යාපන උපායමාර්ගයන් වල දැවැන්ත සාර්ථකත්වයයි.

ශ්‍රී ලංකාවේ දැනට අරමුදල් සම්පාදනයේ හා ආයෝජන කටයුතු වල ඉහළින් සිටින්නේ බැංකු අංශයයි. සමස්ථ ප්‍රාග්ධන වෙළෙඳපොළ දළ දේශීය නිෂ්පාදනයෙන් 30% ක පමණ ප්‍රමාණයක් නියෝජනය කරන අතර එය සියළුම පාර්ශවකරුවන් සඳහා අද්විතීය අවස්ථාවක් ලබාදී ඇත. ප්‍රාග්ධන වෙළෙඳපොළ බැංකු ක්ෂේත්‍රයේ අඩුව පුරවා රටේ වර්ධන ඉලක්ක සඳහා සහාය වීමට හැකි තත්ත්වයකට පත්විය යුතුය. බොහෝ රටවල සීඝ්‍ර ආර්ථික ප්‍රසාරණය සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි සංවර්ධනය තීරණාත්මක වී ඇති අතර එය අත්පත් කර ගැනීම සඳහා ආයෝජක හා මහජන විශ්වාසය මෙන්ම වෙළෙඳපොළවල හා ඒවායේ සහභාගීකරුවන්ගේ විශ්වාසවන්තභාවය අත්‍යවශ්‍ය වී ඇත.

නියාමන සාර්ථකත්වයට, කර්මාන්ත තුළ පවතින ඉහළ ආචාරධර්ම ඉතාමත් වැදගත් වෙයි. වෙළෙඳපොළෙහි වර්ධනය, ස්ථායීභාවය හා තිරසාරභාවය වටා රොක්වූ ආචාරධර්ම හා මනා වෘත්තීය සංස්කෘතියක් ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීකරුවන් සහතික කළයුතුයි. මෙම කර්මාන්තය තුළ තිරසාර සම්බන්ධතා නිර්මාණය කිරීමට හා පවත්වාගැනීමට පාරිභෝගිකයින් සහ ආයතන අතර පවතින විශ්වාසය අත්‍යාවශ්‍ය සාධයකි.

සමස්ථයක් ලෙස ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි වර්ධනය තුළින් වෙළෙඳපොළ කෙරෙහි පවතින විශ්වාසවන්තභාවය හා පැහැදීම නිරූපණය වේ. බොහෝමයක් වෙළෙඳපොළවල් වල එම විශ්වාසය නැතිවීම කෙතරම් එම වෙළෙඳපොළවල් වලට බලපෑම් කළා ද යන්න ලොව වටා වූ ආර්ථික අවපාත වලින් අපට දැකගත හැකිවිය. ඒවා බොහෝමයක් යහපාලනය හා ආචාරධර්ම නොමැතිකම, වැරදි ක්‍රියාමාර්ග හා කෙටිකාලීන ලාභ අපේක්ෂාවෙන් වෘත්තීයභාවය නොතකා ක්‍රියාකිරීම වැනි මූල්‍ය පද්ධතියක වෙළෙඳපොළවල් වල විශ්වාසය හා පැහැදීම් මත දැඩි සේ සම්බන්ධ වූ ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු වූ ඒවා වේ.

මා විශ්වාස කරන්නේ මහජනතාවගේ විශ්වාසය හා පැහැදීම නැවත ලබාගැනීමට එකිනෙක සහභාගීකරුවන්ගේ ක්‍රියාමාර්ග තුළ ශක්තිමත් ආචාරධර්ම ප්‍රමිතීන් ඇතුළත් විය යුතුය යන්නයි. මනා ක්‍රියාපටිපාටි නීතියක් තුළින් හෝ නියාමනයන් තුළින් ස්ථාපිත කළ නොහැකි අතර එය සමාගම් වල අභ්‍යන්තර දිරිගැන්වීම් හා ප්‍රතිපත්ති තුළින් ඇති විය යුතු දෙයකි. සියළුම පාර්ශවයන්ගේ වගකීම් හා යෝග්‍යතා මගින් අපගේ නියාමන හා පාලන රාමුව නැවත ශක්තිමත් කිරීමට හැකිවනු අතර ප්‍රාග්ධන වෙළෙඳපොළේ අභිප්‍රායන් සහතික කිරීමටද හැකියාව ලැබේ.

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමකයා ලෙස අපගේ ඉලක්කය වනුයේ ආයෝජකයින්ගේ ආයෝජන අයිතීන් ආරක්ෂා කිරීම මූලික කරගනිමින් සාධාරණ, ඵලදායී හා විනිවිදභාවයෙන් යුතු වෙළෙඳපොළක් පවත්වාගැනීම සහතික වීමයි. මෙම කාර්යය ඉතා කාර්යක්ෂමව ඉෂ්ඨ කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව තුළ හැකි තරම් ස්වාධීනභාවය ඉහළ නැංවිය යුතු අතර අනවශ්‍ය බාහිර බලපෑම් වලින් තොරව ලේකම් කාර්යාලයට එහි කටයුතු සාධාරණව හා අපක්ෂපාතීව පවත්වාගෙන යාමට බලය ලබාදිය යුතුය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ආයෝජකයින්ගේ ආරක්ෂාව, අතරමැදි සේවාවන්හි ඵලදායීතාවය, සාධාරණ හා ක්‍රමවත් වෙළෙඳපොළක් මෙන්ම පද්ධතියේ අවදානම අවම කිරීම සහ අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහතික කරන නියාමන රාමුවක් ළඟාකර ගැනීමට අපේක්ෂා කරයි. එහිදී අපගේ ප්‍රතිපත්ති උසස් කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා අන්තර්ජාතික සංවිධානයේ නිර්දේශිත ප්‍රමිති ආදේශ කරගැනීමක් සිදුකරන අතර ඒ තුළින් විදේශ ආයෝජන ආකර්ෂණයටද තීරණාත්මක පසුබිමක් නිර්මාණය කරනු ඇත.

නිවැරදි යහපාලන යාන්ත්‍රණයක් තුළ ආයෝජකයින්ගේ අවශ්‍යතා සඳහා ප්‍රමුඛතාවය ලබාදීම හා වඩාත් ගැලපෙන හා යෝග්‍ය ලෙස ආයතන විසින් ඒවා කළමනාකරණය කිරීමටත් නියාමනයට ලක්වන ආයතන මනා අයුරින් තම කටයුතු පවත්වාගෙන යාමට දිරිමත් කිරීමටත් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව නිරන්තරව අවධානය යොමුකරනු ලබයි. එසේම නියාමනයට ලක්වන ආයතන සිදුකරන වැරදි ක්‍රියාවන් හඳුනා ගැනීමටත් හා ඒවා වැළැක්වීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විවිධ දියුණු තාක්ෂණික ක්‍රම භාවිතා කොට ඵලාදායී නිරීක්ෂණ සිදුකිරී මත් ශක්තිමත් පාලනය පිහිටුවීමත් සිදුකරනු ලැබේ. එසේ කිසියම් අක්‍රමිකතාවයක් නිරීක්ෂණ වූ වහාම ඒ සඳහා ක්ෂණිකව නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබන අතර ප්‍රමාදවීමකින් සිදුවන්නේ එවැනි ආචාරශීලී නොවන හැසිරීම් දිරිගැන්වීම පමණි.

නියාමන හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ සේවක මණ්ඩලය සතු හැකියාවන් උසස් කිරීම සඳහා අභිප්‍රේරණයක් ඇති කරමින් ඔවුන්ගේ රාජකාරී කටයුතු සිදුකිරීමට අවශ්‍ය දැනුමෙන් සවිබල ගැන්වීම අප නිරතුරුරවම සිදුකරයි. අප මෙම වසරේ ළඟාකරගත් ප්‍රගතිය තුළින් ප්‍රාග්ධන වෙළෙඳපොළ තවදුරටත් ශක්තිමත් කිරීම යතාර්ථයක් වූයේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කළමනාකාරීත්වයේ හා සේවා මණ්ඩලයේ කැපවීම, තීක්ෂණ බුද්ධිය හා විශේෂඥභාවය හේතුවෙනි.

අවසාන වශයෙන් සභාපතිතුමා ඇතුළු කොමිෂන් සභා සාමාජිකයින්ටත් කොළඹ කොටස් හුවමාරුවටත්, ප්‍රාග්ධන වෙළෙඳපොළ අතරමැදියන්ට හා අනෙකුත් පාර්ශවකරුවන්ට මාගේ ගෞරවණීය ස්තූතිය පුදකර සිටිමි. එසේම 2014 වර්ෂයේදී ලබාදුන් දායකත්වය සඳහා හිටපු සභාපතිතුමා ඇතුළු කොමිෂන් සභා සාමාජිකයින්ටද මාගේ ස්තූතිය පුදකරමි. ප්‍රාග්ධන වෙළෙඳපොළ තවදුරටත් සාධාරණ, ක්‍රමවත් හා විනිවිදභාවයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා වූ, අපගේ වගකීම ඉෂ්ඨ කිරීම සඳහා සියළුම පාර්ශවකරුවන්ගේ උපකාරය හා සහායෝගීතාවය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.



**වජිර විජේගුණවර්ධන**
*අධ්‍යක්ෂ ජනරාල්*


2015 මැයි 23 වෙනි දිනදීය.

# කොමිෂන් සභා සාමාජිකයන්

*2015 මැයි 20 වන දිනට*



1. අර්ජුන හේරත් මහතා
2. සුරේෂ් ෂා මහතා
3. එස්.ආර්. ආටිගල මහතා
4. රනිල් තිස්ස විජේසිංහ මහතා
5. තිලක් කරුණාරත්න මහතා
6. ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා
7. පී. සමරසිරි මහතා
8. රජීව් අමරසූරිය මහතා
9. දිල්ෂානි විජේවර්ධන මිය
10. මරීනා ප්‍රනාන්දු මිය



### තිලක් කරුණාරත්න මහතා - සභාපති

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් තම ද්විතීයික අධ්‍යාපනය අවසන් කරමින් (එවකට) ලංකා විශ්වවිද්‍යාලයට (වර්තමානයේ කොළඹ විශ්වවිද්‍යාලයේ) ඇතුළත් වූ අතර, එහිදී රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හිමිකර ගන්නා ලදී. ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියට පෙර කාල සීමාව තුළ ඔහු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ගෙන ඇත. ඔහු වරලත් රසායනඥයෙකු ද වේ. කරුණාරත්න මහතා එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, ජපානය, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය හා අනෙකුත් බොහෝ රටවල විවිධ පුහුණු වැඩසටහන්වලට ද සහභාගී වී ඇත. ඔහු 1991 වසරේ දී ජපානයේ **AOTS** උසස් කළමනාකරණ පාඨමාලාව, 1993 දී ඉන්දියාවේ අලහාබාද් **IIM** හී උපායශීලී කළමනාකරණ පාඨමාලාව හා 1997 දී එංගලන්තයේ රෙඩින් විශ්වවිද්‍යාලයේ උසස් කළමනාකරණ වැඩ සටහන ද සාර්ථකව නිම කර ඇත.

කරුණාරත්න මහතා තම වෘත්තීය ජීවිතය ආරම්භ කරන ලද්දේ එවකට රාජකීය ලංකා ගුවන් හමුදාවෙහි අධිකාරිලත් නිලධාරියෙකු ලෙස ය. පසුව ඒ මහතා කළමනාකරණ පුහුණුවන්නෙකු ලෙස බහු ජාතික සමාගමකට සම්බන්ධ වූ අතර, කෙටි කලකින් එහි ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු ලෙස ඉහළට පැමිණියේ ය. ඉන් අනතුරුව ඔහු තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, ක්ෂේත්‍රයේ වසර 37 ක අත්දැකීම් බහුල නායකයෙකු බවට ද පත් විය. ඔහු ප්ලාස්ටික් හා රබර් ආයතන අලෙවි විශිෂ්ඨතා පිළිබඳ විශේෂ තිළිණයක් ද ජයග්‍රහණය කර ඇත. එමෙන්ම ව්‍යාපාර හා ප්‍රජා සේවා සඳහා සම්මාන රැසකට ද උරුමකම් කියයි.

කරුණාරත්න මහතා 1983 වර්ෂයේ දී ස්කැන්ඩිනේවියානු රටවල් සඳහා වූ ලංකා වාණිජ මණ්ඩලයේ අනුග්‍රහය දක්වන ආයෝජන ප්‍රවර්ධන සභාවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කර ඇත. ඔහු 2000 වර්ෂය දක්වා පෞද්ගලික අංශයට නැවත සම්බන්ධ වනතුරුම වසර 12 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් ද කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ යාවජීව සාමාජිකයෙකු, කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු සභාපතිවරයෙකු, සිංහ සමාජයේ හිටපු නියෝජ්‍ය දිස්ත්‍රික් අධිපතිවරයෙකු හා හිටපු කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ සභාපතිවරයා ද වේ. ඔහු වර්ෂ 2008 සිට කොළඹ විශ්වවිද්‍යාලයේ කවුන්සල සාමාජිකයෙකු හා 2009-2011 කාලය තුළ බ්‍රිජ් තරඟ පාලන ආයතනය වන ශ්‍රී ලංකා බ්‍රිජ් ෆෙඩරේෂනයේ සභාපතිවරයා ද විය. ඔහු බ්‍රිජ් ක්‍රීඩාවට තදින් ඇලුම් කරන්නෙක් ද වේ. එමෙන්ම වන සතුන්ට ද තදින් ප්‍රිය කරන සහ පාරිසරික විද්‍යාඥයෙකු ද වේ.

### ඩී. එන්. ආර්. සිරිවර්ධන මහතා

සිරිවර්ධන මහතා පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් ද, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් නීතිය පිළිබඳ උපාධියක් ද ලබාගෙන තිබෙන අතර, කොළඹ විශ්වවිද්‍යාලය විසින් පවත්වන නීතිපති උපාධි පාඨමාලාව සඳහා ද ලියාපදිංචි වී ඇත. ඔහු වෘත්තියෙන් නීතිඥවරයෙකි. සිරිවර්ධන මහතා 1988 වසරේ දී සමාගම් පරීක්ෂකවරයෙකු වශයෙන් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ අතර, 2001 වසරේ දී සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයෙකු ලෙස උසස් කරන ලදී. වර්තමානයේ දී ඔහු වැඩ බලන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වශයෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරනු ලබයි.

### අර්ජුන හේරත් මහතා

අර්ජුන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සභාපතිවරයා වන අතර, අර්න්ස්ට් සහ යංග් ආයතනයේ කොටස්කරුවෙකු මෙන්ම උපදේශන සේවා අංශයේ ප්‍රධානියා ද වෙයි. ඔහු දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරන අතර, ආසියා පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ අධ්‍යක්ෂවරයෙකු ද වෙයි. ඔහු ව්‍යවස්ථාපිත ගණකාධිකරණ ප්‍රමිති කමිටුවේ සහ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිති කමිටුවේ සාමාජිකයෙකු ද වෙයි. ඔහු ජාත්‍යන්තර ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ වෘත්තීය ගණකාධිකරණ සංවිධාන සංවර්ධන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරයි. අර්ජුන හේරත් මහතා වරලත් ගණකාධිකාරීවරයෙකු හා කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයෙකු මෙන්ම මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු ද වෙයි. එමෙන්ම ඒ මහතා එක්සත් රාජධානියේ ස්ට්‍රැච්ක්ලයිඩ් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරියෙකු ද වෙයි.

### රජීව් අමරසූරිය මහතා

රජීව් අමරසූරිය මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිය පිළිබඳ ගෞරව උපාධිධාරියෙකි. එමෙන්ම ඔහු නීතිඥවරයෙකි. එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ **(CIMA)** සාමාජිකයෙකු හා ගෝලීය කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ **(CGMA)** සාමාජිකයෙකු ද වේ.

අමරසූරිය මහතා ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ ශ්‍රී ලංකා අභියාචනාධිකරණයේ වෘත්තියෙහි නියුතු නීතිඥවරයෙකු මෙන්ම සාංගමික හා නීති උපදේශකවරයෙකු ද වේ.

ඔහු 2013 වසරේ දී අවුරුදු 40 න් පහළ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන් අතර කැපී පෙනෙන සාමාජිකයා ලෙස වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙන් පිරිනැමෙන **CIMA Star** රන් සම්මානයෙන් ද පිදුම් ලැබූවෙකි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2003 වසරේ නීතිඥ අවසන් විභාගයෙන් කණ්ඩායමේ පළමුවැනියා වෙමින් රන් පදක්කමක් ද දිනා ගෙන ඇත.

අමරසූරිය මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ බදු නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු මෙන්ම විභාග පරීක්ෂකවරයෙකු ලෙස කටයුතු කරන අතර, ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ විභාග පරීක්ෂකවරයෙකු ද වේ. ඔහු ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ 2015 ජාතික නීති සමුළුවේ සභාපතිවරයා ද විය. එමෙන්ම 2014 ජාතික නීති සමුළුවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පූර්ණ අදියරේ සභාපතිවරයා ද විය. අමරසූරිය මහතා වර්තමානයේ දී කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරීන්ගේ සංගමයේ සභාපතිවරයා ද වේ.

### දිල්ෂානි විජේවර්ධන මිය

දිල්ෂානි විජේවර්ධන මිය ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් වන අතර, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ වාණිජ නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිධාරිනියක් ද වෙයි. ඇය නීති විද්‍යාල ප්‍රවේශ විභාග යෙන් කුසලතා අනුපිළිවෙල අනුව දිවයිනේ පළමු දස දෙනා අතරට පැමිණ මහපොළ ශිෂ්‍යත්වයක් ද දිනාගෙන

## කොමිෂන් සභා සාමාජිකයන්

ඇත. එමෙන්ම ඇය ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් විභාගයෙන් කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම 2% ක අතරට ද පත් විය. ඇය මේ වන විට අවුරුදු 18 ක් නීති කටයුතුවල නිරත වී සිටින අතර, කේ. කනග-ඊස්වරන් මණ්ඩලයේ, ජනාධිපති උපදේශක, ප්‍රාථමික හා අභියාචනාධිකරණයේ ව්‍යාපාර බැංකු නඩු කටයුතු, හා බුද්ධිමය දේපළ සහ රක්ෂණ පිළිබඳ ව්‍යාපාර නීති කටයුතු, සාංගමික බැංකු, රක්ෂණ, සුරැකුම්පත් සහ අනෙකුත් ව්‍යාපාර ගැටළුවලට අදාළ ව්‍යාපාර බේරුම්කරණ සහ නීති කටයුතු සම්පාදනය කිරීම සහ ව්‍යාපාර නීතිය, බැංකු සහ බේරුම්කරණයන් සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාදීම යන ක්ෂේත්‍රයන් ඉන් ප්‍රධාන වේ. ඇය සිංගප්පූරුවේ ප්‍රසිද්ධ නීති ආයතනයක් වන **"Shook Lin & Bok"** ආයතනයේ, අධිනීතිඥවරියක් සහ සොලිසිටර්වරියක් වශයෙන් ද කටයුතු කර වෘත්තීය අත්දැකීම් ලබා ඇත. දිල්ෂානි මිය බේරුම්කරණයන්, බුද්ධිමය දේපළ, සමාගම් නීතිය හා ව්‍යාපාර නීතියේ විවිධ පැති යනාදී මාතෘකා පිළිබඳව සම්මන්ත්‍රණවලට සහභාගී වී ඇති අතර, පුවත්පත් ගණනාවකම ඒ පිළිබඳව දැකගත හැකි විය. එමෙන්ම 2007 සමාගම් පනතේ ඇතුළත් නියෝගයන් පිළිබඳව ජනාධිපති උපදේශක කේ. කනග-ඊස්වරන් මහතා ලියූ ''සමාගම් නීතිය'' කෘතියේ සමකර්තෘවරියක් ද වෙයි.

### මරීනා ප්‍රනාන්දු මිය

ප්‍රනාන්දු මිය කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිය පිළිබඳ උපාධිධාරිනියක් වන අතර, රාජ්‍ය නීතිය පිළිබඳ පශ්චාත් උපාධිධාරිනියක් ද වෙයි. ඇය 1993 වසරේ දෙසැම්බර් මස දී ශ්‍රී ලංකා නීතිඥ සංගමයට ඇතුළත් විය.

ඇය වර්තමානයේ දී වාණිජ නීතිය සම්බන්ධ සියලුම පැති ආවරණය වන අයුරින් උපදෙස් ලබාදීමේ කාර්යයන්හි නිරත වී සිටියි.

2004 ජනවාරි මස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නීති සහ බලාත්මක අංශයේ අධ්‍යක්ෂ ධූරයට පත් විය.

ඉන් අනතුරුව 2007 ජුනි මස දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පදවියට පත් වූ අතර, 2007 සිට 2009 දක්වා එම තනතුරෙහි කටයුතු කරන ලදී. එමෙන්ම 2007 සිට 2008 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරිය වශයෙන් ද කටයුතු කරන ලදී.

ඇය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගනු ලැබූ පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා නායකත්වය ලබා දෙන ලදී.

- සුරැකුම්පත්කරණය නියාමනයට අදාළ නීති සම්පාදනය (2009 මාර්තු මස ගැසට් කරන ලදී.)
- ලැයිස්තුගත සමාගම් සඳහා සාංග මික යහපාලනය පිළිබඳ ප්‍රමිතීන් හඳුන්වාදීම.
- ආන්තික ණය සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන් සහ ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන සඳහා නියාමනයන් හඳුන්වාදීම.

ඇය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කරන ලද කාලය තුළ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නීති සහ බලාත්මක අංශයේ අධ්‍යක්ෂ ධූරයෙහි ද කටයුතු කරන ලදී.

ඇය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙම තනතුරු දැරීමට පෙර නීතිඥවරියක් ලෙසත්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි පූර්ණ හිමිකාරීත්වයක් ඇති සීමාසහිත මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි ද නීති උපදේශකවරියක් ලෙසත් කටයුතු කරන ලදී.

### එස්.ආර්. ආටිගල මහතා

එස්.ආර්. ආටිගල මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකු වන අතර, වර්තමානයේ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරයි. ඔහු මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති යන අංශයන් පිළිබඳව අවුරුදු 23 කට අධික පළපුරුද්දක් ඇති අයෙකි.

ආටිගල මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් හිමි කර ගෙන ඇති අතර, එංගලන්තයේ වොවික් විශ්වවිද්‍යාලයෙන් ප්‍රමාණාත්මක සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි කර ගෙන ඇත.

මහ බැංකුවේ නියෝජ්‍ය ලේකම් ධූරයට පත්වීමට ප්‍රථමව ආටිගල මහතා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ පිස්කල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය ව්‍යවසාය යන දෙපාර්තමේන්තුවල අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ද කටයුතු කර ඇත. එමෙන්ම පිස්කල් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ රජයේ වැයමට ද සැලකිය යුතු ලෙස දායක වී ඇත.

ආටිගල මහතා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හා වැඩ බලන සභාපතිවරයෙකු වශයෙන් ද කලක් සේවය කර ඇත. තවද ඔහු ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය, විශ්ව විද්‍යාල ප්‍රතිසම්පාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යන රජයේ ප්‍රධාන පෙළේ ආයතන ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත.

වර්තමානයේ දී ආටිගල මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, ගුවන්තොටුපළ හා ගුවන්සේවා සමාගම හා සෙවන අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබයි.

### සුරේෂ් ෂා මහතා

සුරේෂ් ෂා මහතා සිලෝන් බෙවරේජ් හෝල්ඩිංග්ස් පී එල් සී සමාගමේ සහ ලයන් බෲවරි සිලෝන් පී එල් සී සමාගමේ අධ්‍යක්ෂවරයෙකු මෙන්ම ප්‍රධාන විධායක නිලධාරීවරයා ද වේ. එමෙන්ම ඔහු කාර්සන්ස් කම්බර්බැච්, බුකිට් ධාරා සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ද වේ.

ඔහු වර්තමානයේ ලංකා වාණිජ මණ්ඩලයේ සභාපතිවරයා මෙන්ම ලංකා සේවායෝජකයන්ගේ සම්මේලනයේ උප සභාපතිවරයා ද වේ.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ.

### රනිල් තිස්ස විජේසිංහ මහතා

රනිල් තිස්ස විජේසිංහ මහතා වරලත් ගණකාධිකාරීවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ඔහු එක්සත් ජනපදයේ පෙනිසිල්වේනියාවේ පීට්ස්බර්ග් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධරයෙකු ද වේ. ඔහු අග්නිදිග ආසියා කලාපීය ජාතීන් කිහිපයකගේ ජාතික ආර්ථික උපායමාර්ග සහ ක්‍රියාකාරී

සැලසුම් සම්බන්ධව පර්යේෂණයන් ද සිදුකර ඇති අතර, විශ්ව විද්‍යාලයේ මහජන හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ උපාධි විද්‍යාලයෙන් බහුපාර්ශවීය සමාගම් හා දේශපාලන අවදානම සම්බන්ධ විශ්ලේෂණයන් හා සම්බන්ධ විශේෂ අධ්‍යයනයන් ද සිදු කර ඇත. ඉහත කී කරුණු අනුව පදනම් වෙමින් ඔහු ජාතික ආර්ථික ප්‍රතිපත්ති සාකච්ඡාවන් සඳහා පෘථුල ලෙස දායක වී ඇති අතර ආයෝජන, පිස්කල් දිරිදීමනා සහ ආයතන ප්‍රතිසංස්කරණ උපායමාර්ගයන් සඳහා ස්ථාපිත කළ ගරු උපදේශන කමිටුවල ද සේවය කර ඇත.

ඔහු **KPMG** ආයතනයේ පුහුණුවීම් ලබාගනිමින් පශ්චාද් පළපුරුදු ලබා ඇති ආයතන ලෙස ශ්‍රී ලංකාවේ විශාලතම විවිධාංගීකරණය වූ ලැයිස්තුගත සමාගම වන ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස්, බහාමාස් හි ඩිලොයිට් සහ ශ්‍රී ලංකා ප්‍රයිස්වෝටර්කූපර්ස් ආයතනයේ හවුල්කරුවෙකු මෙන්ම උපදේශක ප්‍රධානියා ලෙස ද කටයුතු කර ඇත. ඔහු ව්‍යවසායක ප්‍රාග්ධන සහ අරමුදල් කළමනාකරණ කර්මාන්තයේ සභාපතිවරයෙකු ලෙසත්, ආයෝජන අරමුදල් කළමනාකරණ ආරම්භක අධ්‍යක්ෂවරයෙකු ලෙසත්, නැෂනල් වෙල්ත් කෝපරේෂන් හි ආරම්භක අධ්‍යක්ෂවරයෙකු ලෙසත් කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ, පළමු පාරිභෝගික කටයුතු සභාවේ සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිති මණ්ඩලයේ ද සේවය කර ඇත. ඔහු ආසියානු සංවර්ධන බැංකුවේ ස්වාධීන ජාත්‍යන්තර උපදේශකයෙකු ලෙස ද කටයුතු කර ඇති අතර, ඇෆ්ගනිස්ථානය, ඉන්දියාව, ආමේනියාව, කයිරිස්ථානය සහ අසර්බයිජානය යන රටවල රාජ්‍ය අංශය පිළිබඳ පැවරුම් කිහිපයක් ද සිදු කර ඇත.

එපමණක් නොව දශක 3 කට වඩා අධික වෘත්තීය කාලසීමාව තුළ ඔහු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් මෙන්ම විදේශ රටවල් කිහිපයක් සම්බන්ධ අත්දැකීම් රාශියක් ලබා ඇති අයෙකු වන අතර, පෞද්ගලික අංශය සහ පෞද්ගලික වෘත්තීයමය පුහුණුවීම් මෙන්ම ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල් කිහිපයක රාජ්‍ය අංශයෙහි උපදේශන සහ නියාමනය අතර වෘත්තීයමය පළපුරුදුලත් අයෙකු ද වෙයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හිටපු සභාපතිවරයෙකු ද වන අතර, ආසියා සහ පැසිෆික් කලාපීය ගණකාධිකාරීවරුන්ගේ 23 වන ජාතික සම්මේලනයේ හිටපු සභාපතිවරයා ද වෙයි. එපමණක් නොව වසර 40 කට පසුව එම තනතුරට පත් වූ පළමු ශ්‍රී ලාංකිකයා ද ඔහු වේ.

ඔහු වර්තමානයේ ජෝන් කීල්ස් හොටෙල්ස් පී එල් සී හි අධ්‍යක්ෂ වරයෙකු ලෙස කටයුතු කරන අතර, එහි විගණන කමිටුවෙහි සභාපතිවරයා ද වෙයි.

2015 පෙබරවාරි මාසයේ දී ඔහු ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීම් ලැබූ අතර, එහි විගණන කමිටුවේ සභාපතිවරයා මෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සභා සාමාජිකයෙකු ද වෙයි.

### පී. සමරසිරි මහතා

සමරසිරි මහතා වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක් වේ. ඔහු නියෝජ්‍ය අධිපතිවරයෙකු වීමට පෙර, සහකාර අධිපතිවරයෙකු, මුදල් මණ්ඩලයේ ලේකම්, අනුකූලතා නිලධාරිවරයෙකු සහ බැංකු අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හොබවන ලදී. ඔහු පසුගිය අවුරුදු 4 ක කාලය තුළ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උප සභාපතිවරයා වශයෙන් ද, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ සහ ගිණුම්කරණ ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් 2015 පෙබරවාරි මාසය දක්වා වසර 5 ක් කටයුතු කර ඇත.

සමරසිරි මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙකු මෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ කැන්සාස් විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිකරගෙන ඇත. සමරසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ අවුරුදු 33 ක් අත්දැකීම් සහිත අයෙකු වන අතර, විශේෂයෙන් සංඛ්‍යාලේඛන, ආර්ථික ප්‍රතිපත්ති, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය, මූල්‍ය ක්‍රමයේ ස්ථායීතාවය, සාංගමික යහපාලනය, මුදල් කළමනාකරණය, විදේශ විනිමය ප්‍රතිපත්ති, මූල්‍ය බුද්ධි අංශය සහ ප්‍රාදේශීය සංවර්ධනය යන අංශ ඉන් ප්‍රධාන වේ.

සමරසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කළ පොත් ත්‍රිත්වයක් වන ''මුදල් ගණුදෙනු, බැංකු සහ ආර්ථිකය'', ''මූලික ආර්ථික විද්‍යා මූලධර්ම'' සහ ''ආර්ථික විද්‍යා මූලධර්ම සහ ප්‍රතිපත්ති'' යන කෘතිවල කර්තෘවරයා ද වෙයි. එමෙන්ම ඔහු විසින් ආර්ථික සහ මූල්‍යය පිළිබඳව ලිපි කිහිපයක් ම විවිධ ප්‍රකාශන සහ පුවත්පත්වල පළ කර ඇත.

# ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය

*2015 මැයි 20 වන දිනට*




1. වජිර විජේගුණවර්ධන මහතා (අධ්‍යක්ෂ ජනරාල්)
2. ධම්මික පෙරේරා (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)
3. අයන්ති ජයරත්න මිය (අධ්‍යක්ෂ - මුදල් සහ පරිපාලන)
4. සුරනා ප්‍රනාන්දු මෙනවිය (අධ්‍යක්ෂ - අධීක්ෂණ කටයුතු)
5. තුෂාර ජයරත්න මහතා (අධ්‍යක්ෂ බාහිර සම්බන්දතා සහ ආවේක්ෂණ)
6. රොහාන් සෙනෙවිරත්න (උපදේශක විශේෂ ව්‍යාපෘති)
7. අයන්ති අබේවික්‍රම (අධ්‍යක්ෂ - නීති සහ බලාත්මක කිරීම්)
8. ඌෂා සිවගුරුනාතන් (සහකාර අධ්‍යක්ෂ - අධීක්ෂණ කටයුතු)
9. චින්තක මෙන්ඩිස් (අධ්‍යක්ෂ - විමර්ශණ කටයුතු)
10. හර්ෂණ සූරියප්පෙරුම (අධ්‍යක්ෂ - සාංගමික කටයුතු)

*නොපැමිණි*

ඉන්තිකාබ් සමීන් (අධ්‍යක්ෂ - පරීක්ෂණ සහ ප්‍රතිපත්ති)




1 2 3 4 5 6 7 8 9 10

# ආර්ථික සමාලෝචනය

## ගෝලීය ආර්ථිකය

ගෙවී ගිය වසර තුළ ගෝලීය ආර්ථිකය පිළිබඳව විමසීමේදී එය අපේක්ෂාවන් පහළ දමූ වසරක් ලෙස මෙන්ම ශක්තිමත් ධනාත්මක ප්‍රවණතා පෙන්නුම් කළ වසරක් ලෙස ද සැලකිය හැකිය. චීනය සහ ජපානය වැනි ආර්ථිකයන්හි පෙර පැවති ඉහල වර්ධන වේගයන් මන්දගාමී වීම අතරතුර යුරෝපා කලාපයේ නැවත පිබිදීම සහ ඉන්දියානු ආර්ථිකයේ දැකගතහැකි වූ වර්ධනය හරහා ගෙන දුන් සහයෙන් 2014 වසරේ දී ගෝලීය ආර්ථිකය සුළු අගයකින් ඉහළ ගිය වර්ධන වේගයකින් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වනු දැක ගත හැකි විය.

## G20 ආර්ථිකයන්

මහ පරිමාණ ආර්ථිකයන් 20 න් සමන්විත ''ආර්ථික සහයෝගීතා සහ වර්ධනය සඳහා වූ සංවිධානය'', එහි සමූහ දළ දේශීය නිෂ්පාදනය 2013 වසරේ දී වාර්තා කළ 3.2% වර්ධනයට සාපේක්ෂව 2014 වසරේ දී ඉතා සුළු අගයකින් එනම් 3.4% ක වර්ධනයක් පෙන්නුම් කළේය. එකී සංවිධානය යටතේ පවතින ආර්ථිකයන් සමස්තය එක්ව ගත් කළ එය ගෝලීය නිෂ්පාදිතයෙන් 90% ක් ආවරණය කරයි.

2013 වසරේ දී 0.5% කින් සංකෝචනය වූ යුරෝපා කලාපය නැවත වර්ධනාත්මක අදියරට පැමිණ 2014 වසරේ දී 0.9% ක අගයකින් වර්ධනය වීම ගෝලීය ආර්ථිකයේ වර්ධනයට හේතු විය. ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථික වර්ධන වේගය මද වශයෙන් වර්ධනය වූ අතර චීනයේ වර්ධනය 7.8% සිට 7.4% දක්වා අඩු විය. ජපාන ආර්ථිකය පැහැදිලිව පෙනෙන පරිදි පසුබසින අතරතුර ඉන්දියාව සහ එක්සත් ජනපදය සැලකිය යුතු වර්ධන වේගයක් වාර්තා කළේය. (සංඛ්‍යා සටහන 01)

## ඛණිජ තෙල් ආනයනය කරන්නා වූ රාජ්‍යයන්හි සංවිධානය (OPEC) සහ ඛණිජ තෙල් මිල ගණන්

ගෝලීය ආර්ථිකයට මාතෘකා මැවූ වසරක් ලෙසට ද මෙම වසර සැලකිය හැකිය. BRICS රටවල් (බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය සහ දකුණු අප්‍රිකාව) ඇතුළුව වෙනත් ප්‍රධාන සහ නැගී එන ආර්ථිකයන්හි ඛණිජ තෙල් සඳහා පැවති ඉල්ලුම අනපේක්ෂිත ලෙස පහත වැටීම හමුවේ ඛණිජ තෙල් මිල පහත වැටුණි. ඒ සමඟ යමින් ලෝහ මිල ගණන් ද සැලකිය යුතු ලෙස පහත වැටුණි. OPEC සංවිධානය විසින් සිය ස්ථාවරයන් තව දුරටත් පවත්වා ගැනීමට ගන්නා ලද තීරණය සහ විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය ඇතුළුව OPEC සංවිධානයට අයත් නොවන්නා වූ තෙල් නිපදවන රාජ්‍යයන් විසින් සිය තෙල් නිෂ්පාදන ඉහළ නැංවීම ඒ හා බැඳි අනෙකුත් සාධකයන් ය.

සංවර්ධිත ආර්ථිකයන්හි දක්නට ලැබූ ඉහළ පුද්ගලික හා රාජ්‍ය ණය වගකීම් තත්වයන් සහ ඒ හා බැඳි අනෙකුත් සෘණාත්මක සාධකයන් ගෝලීය ආර්ථිකයේ ප්‍රගමන අවස්ථාවන් සඳහා බාධා ගෙන දුනි. එසේම, සංවර්ධිත රාජ්‍යයන් විසින් ප්‍රමාණාත්මක ආර්ථික ලිහිල්කරණ ප්‍රතිපත්ති (quantitative easing) ක්‍රියාත්මක කරන අවධිවල ප්‍රාග්ධන ගලා ඒම් හරහා නැගී එන ආර්ථිකයන් එහි ප්‍රතිලාභ අත්පත් කර ගන්නා ලදී. කෙසේ වෙතත්, එකී ප්‍රතිපත්ති වෙනස් කිරීමත් සමඟ සිදුවන්නා වූ වෙනස්කම් සඳහා සූදානම් වීමට නැගී එන ආර්ථිකයන්ට යම් යම් සකස්වීම් සිදු කර ගැනීමට සිදුවීම ද පසුගිය වසරේ දී දැක ගත හැකි විය.

## ප්‍රධාන ආර්ථිකයන්හි ආර්ථික වර්ධන වේගයන්හි දැඩි උස් පහත් බවක්

ගෙවී ගිය වසරේ දී සමස්තයක් වශයෙන් ගෝලීය ආර්ථිකය 3.4% ක අගයකින් වර්ධනය වුව ද, ප්‍රධාන ආර්ථිකයන්වල වර්ධන වේගයන්හි දැඩි උස් පහත් බවක් දැකගත හැකි විය. සුළු වශයෙන් දැක ගත හැකි වූ විචලතාවයන් මධ්‍යයේ පවා සාධාරණව අගය කිරීමට ලක් වූ මිල ගණන් සමඟ තව දුරටත් ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ උද්යෝගශීලී විය. කෙසේ වෙතත්, ආයෝජනයන්හි ප්‍රමාණවත් වර්ධනයක් ගෙවුණු වසර තුළ වාර්තා නොවීය. විශේෂයෙන් සංවර්ධිත ආර්ථිකයන්හි ආයෝජන කටයුතු (ආයෝජන දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස) තව දුරටත් නිහඬ ප්‍රවණතාවයක පැවතිණ. ප්‍රධාන සංවර්ධිත ආර්ථිකයන්හි දිගුකාලීන රාජ්‍ය බැඳුම්කර ඉපැයීම් තව දුරටත් අඩුවන අතරතුර, නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි පොළී අනුපාත පරාසය (Interest rate spreads) සහ ඒ හා සමගාමී අවදානම් පරාසය (risk spreads) ඉහළට යොමු වීමක් දිස් විය.

**සංඛ්‍යා සටහන 01: ආර්ථික වර්ධන වේගයන්**


| | 2013 % | 2014 % |
|---|---|---|
| ගෝලීය නිෂ්පාදනය | 3.4 | **3.4** |
| සංවර්ධිත ආර්ථිකයන් | 1.4 | **1.8** |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.2 | **2.4** |
| යුරෝපා කලාපය | -0.5 | **0.9** |
| ජපානය | 1.6 | **-0.1** |
| එක්සත් රාජධානිය | 1.7 | **2.6** |
| නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආසියාව | 7.0 | **6.8** |
| රුසියාව | 1.3 | **0.6** |
| චීනය | 7.8 | **7.4** |
| ඉන්දියාව | 6.9 | **7.2** |
| ASEAN-5 | 5.2 | **4.6** |

*මූලාශ්‍රය- අන්තර්ජාතික මූල්‍ය අරමුදල - World Economic outlook*


## දේශීය ආර්ථිකය

දේශීය ආර්ථිකය කෙරෙහි විදේශීය අංශයෙන් පීඩනයක් පැවතුණත්, ශක්තිමත් ධනාත්මක සාර්ව ආර්ථික ලක්ෂණ පෙන්නුම් කළ වසරක් ලෙස 2014 වසර සැලකිය හැකිය. යුධ ජයග්‍රහණයත් සමඟ ආරම්භ වූ ධනාත්මක ආර්ථික ප්‍රවණතාවය තවදුරටත් ගෙවී ගිය වසර තුළ ද ක්‍රියාත්මක වෙමින් ආසියානු කලාපය තුළ ඉතා වේගයෙන් වර්ධනය වන්නා වූ ආර්ථිකයක් බවට ශ්‍රී ලංකාව පත් විය. වේගවත් ආර්ථික වර්ධනයක් පැවතියත්, අනෙක් අතට පැවති අභියෝග සහ සලකා බැලීම් තව දුරටත් නොවෙනස්ව පැවතිණ. දුර්වල විදේශීය අංශය, නොසැලකිය යුතු තරම් වන ගෙවුම් ශේෂ තත්ත්වය සහ කාලයක් සිට පැවත එන්නා වූ වෙළෙඳ ගිණුමේ හිඟය වැනි සාධක තවදුරටත් ශ්‍රී ලංකා රුපියල මත බලපෑම් ගෙන දුන් අතර දිගින් දිගටම පෙන්නුම් කළ ජංගම ගිණුමේ හිඟය ආර්ථිකයේ අවධානය යොමු කළ යුතු සාධක අතුරින් ප්‍රමුඛ විය.


රූප සටහන 01: මූර්ත දළ දේශීය නිපැයුම් වර්ධනය





රූප සටහන 02: ව්‍යාපාර කිරීමේ පහසුතා දර්ශක - 2014




රූප සටහන 03: උද්ධමනය




රූප සටහන 04: පොළී අනුපාතය




## දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය සහ ආංශික සංයුතිය

යුධ ජයග්‍රහණයක් සමඟ ඇති වූ සාමකාමී ආර්ථික වාතාවරණය තුළ දැක ගත හැකි වූ ඉහළ ආර්ථික වර්ධන ප්‍රවණතාවය තව දුරටත් ක්‍රියාත්මක වෙමින් ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය 2013 වසරේ දී වාර්තා වූ 7.2% ට සාපේක්ෂව ඉතා සුළු අගයකින් වර්ධනය වී 2014 වසරේ දී 7.4% ක වර්ධනයක් වාර්තා විය. නැගී එන ආර්ථිකයන් **(Emerging Economies)** වාර්තා කළ 6.8%, අසල්වැසි ඉන්දියාව වාර්තා කළ 7.2% සහ **ASEAN-5** ආර්ථිකයන් වාර්තා කළ 4.6% ක වර්ධන වේගයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාව 7.4% ක වර්ධන වේගයක් වාර්තා කරමින් පෙරමුණ ගෙන ඇත.

සුපුරුදු පරිදි සමස්ත දළ දේශීය නිෂ්පාදනයට 58% ක දායකත්වයක් දක්වමින් සේවා අංශය සාර්ව ආර්ථිකයේ ප්‍රධාන හසුරවන්නා විය. සේවා අංශයේ දැක ගත හැකි වූ 6.5% ක වර්ධනයට මූලික වශයෙන් සංචාරක කර්මාන්තය සහ හෝටල් අංශයේ සිදු වූ ආර්ථික කටයුතු හේතු විය. දළ දේශීය නිෂ්පාදනයෙන් 10% කට දායක වූ ඉදිකිරීම් ක්ෂේත්‍රය සහ වර්ධනය වෙමින් පවතින විදේශීය සංචාරකයන් සංඛ්‍යාව හරහා ගෙන දුන් ප්‍රතිලාභ ශ්‍රී ලංකා ආර්ථික වර්ධනයට සහාය විය. (රූප සටහන 01)

## දළ දේශීය නිෂ්පාදිතය සහ එහි පරිමාණය

2013 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 67 ක් වූ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය 2014 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 75 ක් දක්වා ඉහළ ගියේය. තවද, ශ්‍රී ලංකාව මධ්‍ය ආදායම් ආර්ථික කාණ්ඩය තුළ ඉහළ අදියරයට ඔසවා තැබීම සහ ''2020 වන විට එ.ජ. ඩොලර් 7,000 ක ඒක පුද්ගල ආදායමක්'' නැමැති ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්කය කෙරෙහි යොමුවීම සනාථ කරමින් ඒක පුද්ගල දළ දේශිය නිෂ්පාදනය එ.ජ. ඩොලර් 3,600 සීමාව පසු කරලීය.

## ලෝක බැංකු ශ්‍රේණිගත කිරීම්


ලෝක බැංකුව විසින් සකස් කරනු ලබන ගෝලීය තරගකාරීත්ව දර්ශකයට **(Global Competiveness Index)** අනුව 2014 වසරේ දී ශ්‍රී ලංකාව 65 වැනි ස්ථානයේ රැඳී සිටිය නමුත් ''ව්‍යාපාර කිරීමේ පහසුතා දර්ශකයට'' **(Ease of Doing Business Index)** අනුව 2013 වසරේ දී 81 වැනි ස්ථානයේ රැඳී සිටි ශ්‍රී ලංකාව පියවර හතරක් පසුපසට යමින් 2014 වසරේ දී 85 වැනියා ලෙස ස්ථානගත විය. එසේම, ස්වෛරී බැඳුම්කර ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකාව තවමත් ශක්තිමත් දක්මක් සහිතව ආයෝජන නොවන මට්ටමේ පවතින අතර ෆිච් ශ්‍රේණිගත කිරීම් අනුව **BB-** සහ **S&P** ශ්‍රේණිගත කිරීම අනුව **B+** යනුවෙන් ඇගයීම් ලබා ඇත. (රූප සටහන 02)

## උද්ධමනය

ශ්‍රී ලංකාවේ උද්ධමනය අඛණ්ඩව 71 වැනි මාසයටත් එක් අංකයක රැඳී සිටීමට සමත් විය. 2014 දෙසැම්බර් වන විට කොළඹ පාරිභෝගික මිල දර්ශකය 2.1% ක පහළ මට්ටමක පැවතුණි. උද්ධමනයේ අගය එලෙස පහත් අගයක පැවතීමට මූලික වශයෙන් බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහත වැටීම, ලෝක වෙළෙඳපොළේ වෙළෙඳ භාණ්ඩ මිල පහළ වැටීම, සැපයුම් අංශයෙන් බලපෑමක් ඇති නොවීම සහ සැලකිය යුතු දේශගුණික විපර්යාස බලපෑමක් සිදු නොවීම වැනි සාධක සැලකිය හැකිය. (රූප සටහන 03)

# ආර්ථික සමාලෝචනය

**රූප සටහන 05: පෞද්ගලික අංශයට සැපයූ බැංකු ණය**




## මූල්‍ය ප්‍රතිපත්තිය සහ පොළී අනුපාත

ආර්ථික වර්ධනයට පහසුකම් සලසන වූ පරිදි රටේ මූල්‍ය ප්‍රතිපත්තිය පවත්වා ගැනීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වර්තමාන ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක වීම 2014 වසර තුළ ද දැක ගත හැකි විය. පෞද්ගලික අංශයට ගලා යන්නා වූ ණය ප්‍රමාණය ඉහළ නැංවීම හරහා වක්‍රව දළ දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා 2014 වසරේ දී පොළී අනුපාත තව දුරටත් පහත දමන ලදී. එසේම, ණය සහ තැන්පතු සඳහා ගෙවන පොළී අනුපාතයන් හා සංසන්දනාත්මකව රාජ්‍ය සුරැකුම්පත් සඳහා අදාළ වන පොළී අනුපාතද සැලකිය යුතු පරිදි පහත වැටුණි. 2013 වසරේ දෙසැම්බර් මාසය වන විට 8.29% ක් ව පැවති දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය 2014 දෙසැම්බර් වන විට 6.0% දක්වා පදනම් අංක 229කින් පහත වැටුණි. ඊට අමතරව, 2014 වසර තුළ වසර පහක් සඳහා වන භාණ්ඩාගාර බැඳුම්කර පොළී අනුපාතය පදනම් අංක 250ක අගයකින් පහත වැටුණි. (රූප සටහන 04)

## ණය වර්ධනය

ආර්ථික වර්ධනය කිරීමට ක්‍රියාත්මක කල විවිධ උත්සාහයන් මධ්‍යයේ පවා පෞද්ගලික අංශය විසින් ලබා ගන්නා බැංකු ණය පසුගාමී මට්ටමක පැවති අතර, 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී ඉතා සුළු වර්ධනයක් පමණක් දැක ගත හැකි විය. 2013 වසරේ දී 7% ක් ව පැවති පෞද්ගලික අංශයේ ණය ගැනීම් ගෙවී ගිය වසරේ දී 9% දක්වා වර්ධනය වූ අතර, පුළුල් මුදල් සැපයුමේ **(M2b)** වර්ධනය ද ස්ථාවරව පැවතුණි. (රූප සටහන 05)

## වෙළෙඳ ගිණුමේ ශේෂය සහ ගෙවුම් තුලනය

ගෙවී ගිය වසරේ දී වෙළෙඳ ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 8.2 දක්වා පුළුල් වූ අතර, 2013 එහි අගය වූයේ එ.ජ. ඩොලර් බිලියන 7.6 කි. එසේම 2013 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 0.98 ක් ව පැවති සමස්ත ගෙවුම් ශේෂයට සාපේක්ෂව 2014 වසරේ දී එහි අගය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා එ.ජ. ඩොලර් බිලියන 1.37 ක් ලෙස වාර්තා විය. මේ සඳහා අපනයන වෙළෙඳ කටයුතු යහපත්වීම, ආනයන වර්ධනය මන්දගාමී වීම සහ සේවා ගිණුමට සිදු වූ ගලා ඒම් මූලික වශයෙන් දායක විය. වසර ගණනාවක් පුරාවට සම්ප්‍රදායක් වශයෙන් ශ්‍රී ලංකාවේ වෙළෙඳ ගිණුමේ හිඟය පියවීම සඳහා මූලික වශයෙන් දායක වූයේ විදේශීය ශ්‍රමිකයින් විසින් එවනු ලබන ප්‍රේෂණයන්ය.

විදේශීය ශ්‍රමිකයින් විසින් එවන ලද ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම්වලට අමතරව විදේශ ජංගම ගිණුමේ හිඟය පහත වැටීම සහ අන්තර්ජාතික වශයෙන් සිදු කළ බැඳුම්කර නිකුත් කිරීම් වැනි සාධක විදේශීය තැන්පතු අඩු නොවී පවත්වා ගැනීමට දායක විය. 2013 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 8.5 ක් ව පැවති විදේශීය වත්කම් ගෙවී ගිය වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 9.8 දක්වා වර්ධනය විය. ඒ අනුව විදේශීය වත්කම්වලින් කළ හැකි ආනයනික මාස ගණන 2013 වසරේ දී පැවති මාස 5.7 ට සාපේක්ෂව ගෙවී ගිය වසරේ දී මාස 6.1 දක්වා ඉහළ ගොස් තිබුණි.

## විදේශීය විනිමය වෙළෙඳපොළ

ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට එරෙහිව ගෙවී ගිය වසරේ දී ශක්තිමත්ව පැවති අතර **130-132** දක්වා වූ ඉතා පටු පරාසයක පමණක් විචලනය විය. ඒ අනුව 2014 වසර තුළ ශ්‍රී ලංකා රුපියල අනවශ්‍ය අවප්‍රමාණයකින් තොරව 0.79% ක සුළු අගයකින් පමණක් පහළ වැටුණි. තවද, වෙනත් රාජ්‍යයන් අතර විනිමය අනුපාත සැලකීමේදී යූරෝ මුදල් ඒකකය, ජපාන යෙන් සහ එක්සත් රාජධානි රන් පවුමට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ගෙවී ගිය වසරේ දී වර්ධනය විය.

# ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සමාලෝචනය

## කොටස් වෙළෙඳපොළ තුළ සාර්ථකත්වයන් රැසක් පෙන් වූ වසරක්


අනෙකුත් නැගී එන වෙළෙඳපොළ වර්ධන වේගයන්හි **(emerging markets)** විවිධ මට්ටමින් විචලතාවයන් පැවතියත්, කොළඹ කොටස් වෙළෙඳපොළ 2014 වසරේ දී ප්‍රශංසනීය ලෙස ධනාත්මක ප්‍රතිඵල ජනනය කිරීමට සමත් විය. වෙළෙඳපොළ වර්ධනයට අඩිතාලම දැමූ වසර ලෙස 2013 වසර සැලකියහොත්, ආයෝජන මනෝභාවයන් තව දුරටත් වර්ධනය කරමින් වෙළෙඳපොළ වඩා ඉහළට ගෙන ගිය වසර ලෙස 2014 වසර සැලකිය හැකිය. (රූප සටහන 06)

තවදුරටත් සියලු කොටස් මිල දර්ශකය **(ASPI)** ඒකක 7000 සීමාව ද, **S&P** ශ්‍රී ලංකා 20 දර්ශකය ඒකක 4000 සීමාව ද පසු කළ බැවින් 2014 වසර වැදගත් වසරක් ලෙස සැලකීමට හැකිය. එසේම වෙළෙඳපොළ විශාලත්වය නිරූපනය කරන්නාවූ මිණුමක් ලෙස සලකන වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 3104 ක් හෙවත් දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත් කල 31% සීමාවට ලඟා වීමට එකී වසරේ දී හැකි විය. තවද, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය ඉහළ නන්වමින් අඛණ්ඩව තෙවැනි වසරටත් දැක ගත හැකි වූ ධනාත්මක ශුද්ධ විදේශීය ආයෝජන ගලා ඒම් විදේශීය ආයෝජකයින් කොළඹ කොටස් වෙළෙඳපොළ කෙරෙහි දැක් වූ සුභවාදී ආයෝජන මතය තහවුරු කළේය. වර්ධනාත්මක සාර්ව ආර්ථික විචල්‍යයන්, ධනාත්මක සාංගමික ඉපැයුම් සහ ශක්තිමත් ශේෂපත්‍ර තත්වයන් මෙම ධනාත්මක ප්‍රවණතාවයන් සඳහා පසුබිම සකස් කළේය. එසේම දැඩි ලෙස අවප්‍රමාණයට භාජනය නොවී ශක්තිමත්ව පැවති විනිමය අනුපාතිකය (ඇමරිකානු එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව) වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතාවය ඉහළ නැංවීමට හේතු විය. ඊට අමතරව, 2013 වසරට සාපේක්ෂව 2014 වසරේ දී සාමාන්‍ය දෛනික පිරිවැටුම ද 70% අගයකින් වර්ධනය විය.


## වෙළෙඳපොළ ප්‍රතිලාභ

බොහෝ කලකට පසුව ආර්ථිකය තුළ දක්නට ලැබුණු ඉතා පහළ මට්ටමේ පොලී අනුපාත වාතාවරණය මධ්‍යයේ ගෙවුනු වසර තුළ කොළඹ කොටස් වෙළෙඳපොළ ඉහළ ප්‍රතිලාභ වාර්තා කළේය. 2013 වසරේ දී වාර්තා වූ 4.78% ක සුළු වර්ධනයට සාපේක්ෂව, 2014 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ එහි


රූප සටහන 06: සියළු කොටස් මිල දර්ශකය සහ භාණ්ඩාගාර බිල්පත් අනුපාතය




රූප සටහන 07: වෙළෙඳපොළ ප්‍රතිලාභය - 2014




රූප සටහන 08: වෙළෙඳපොළ ප්‍රතිලාභ



# ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සමාලෝචනය

ආයෝජකයින්ට 23.5% ක ඉතා ඉහළ ප්‍රතිලාභ ලබාදීමට සමත් විය. මෝගන් ස්ටැන්ලි වර්ගීකරණයට අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ අයත් වන්නේ පුළුල් නැගී එන වෙළෙඳපොළ වර්ගීකරණයේ (Broader Emerging Market Classification) අනු කොටසක් වන ඉදිරිපෙළ වෙළෙඳපොළ (Frontier Market) කාණ්ඩයට ය. එකී කාණ්ඩයේ සිටින අනෙකුත් සමීපතම රටවල් වන්නේ බංගලාදේශය, වියට්නාමය සහ පාකිස්ථානයයි. (රූප සටහන 07)

2014 වසරේ දී 4.71% ක් වූ MSCI ඉදිරිපෙළ දර්ශකය (MSCI Frontier Index) සහ 1.97% ක සෘණ අගයක් වූ නැගී එන වෙළෙඳපොළ දර්ශකය ද (Emerging Market Index) පහසුවෙන් පසුකරලීමට සියලු කොටස් මිල දර්ශකය (ASPI) සමත් විය. එසේම, ඉදිරිපෙළ කාණ්ඩයේ පසුවන අනෙකුත් සගයින් වන ඉන්දුනීසියාව (22.3%), වියට්නාමය (8.1%) සහ පිලිපීනය (18%) අභිබවා කොළඹ කොටස් වෙළෙඳපොළ ඉහළ ප්‍රතිලාභ වාර්තා කර ඇත. ගෙවී ගිය වසරේ දී ගෝලීය ප්‍රාග්ධන ආර්ථිකයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධයෙන් දක ගත හැකි වූ වැදගත් සිදුවීමක් වූයේ ඩුබායි සහ කටාර් යන වෙළෙඳපොළවල් ඉදිරිපෙළ වෙළෙඳපොළ තත්වයේ සිට නැගී එන වෙළෙඳපොළ කාණ්ඩයට උසස් වීමයි. (රූප සටහන 08)


## හිමිකම් සුරැකුම්පත් සහ ණය සුරැකුම්පත් හරහා අරමුදල් සම්පාදනය

2013 වසරේ දී පැවති මන්දගාමී වෙළෙඳපොළ වාතාවරණයට සාපේක්ෂව 2014 වසරේ දී දක්නට ලැබුණු ශක්තිමත් ආයෝජක මනෝභාවය හේතුවෙන් වෙළෙඳපොළ සාපේක්ෂව වඩා ක්‍රියාකාරී තත්වයක පැවතිණ. මූලික නිකුතුන් හරහා 2013 වසරේ දී සම්පාදනය කර ගත් රුපියල් මිලියන 494 ක සුළු අගයට සාපේක්ෂව ගෙවුනු වසරේ දී මූලික නිකුතුන් පහක් හරහා රුපියල් මිලියන 2,694 ක් රැස් කර ගන්නා ලදී. එසේම සාංගමික බැඳුම්කර හරහා රුපියල් මිලියන 54,234 ක නව අරමුදල් රැස් කර ගැනීමට වෙළෙඳපොළ සමත් විය. ඊට අමතරව, හිමිකම් නිකුතු හරහා රුපියල් මිලියන 8,099 ක් සමාගම් ශේෂපත්‍රයන්ට යොමු විය. පසුගිය වසර පුරාවට දක ගත හැකි වූ පහළ පොළී අනුපාත මධ්‍යයේ පවා ප්‍රාග්ධන වෙළෙඳපොළ හරහා අරමුදල් රැස් කර ගැනීම කෙරෙහි සමාගම් දක්වූ උනන්දුව කැපී පෙනුනි.

## විදේශීය ආයෝජන සහභාගීත්වය සහ වෙළෙඳපොළ අගය කිරීම

ගෙවුනු වසරේ දී ඉතා ඉහළ විදේශීය ආයෝජක සහභාගීත්වයක් දකගත හැකි විය. 2013 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 647 ක් ව පැවති විදේශීය ආයෝජක මිල දී ගැනීම් 2014 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 805 දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, මූලික වශයෙන් ලාභ ඉවත්කර ගැනීම සහ හෝ ක්‍රමෝපායික ගණුදෙනු හේතුවෙන් විදේශීය විකුණුම් එ.ජ. ඩොලර් මිලියන 637 ක් ලෙස වාර්තාගත වී එ.ජ. ඩොලර් මිලියන 168 ක ධනාත්මක ශුද්ධ අගයක් ශේෂ විය. මෙම අගයන් එතරම් ප්‍රශංසනීය නොවන නමුත් එමගින් විදේශීය ආයෝජකයින් අප වෙළෙඳපොළ කෙරෙහි දක්වූ ධනාත්මක ආයෝජක මනෝභාවය පෙන්නුම් කරයි.

**රූප සටහන 09: වෙළෙඳපොළ අගය කිරීම**




එසේම, 2013 වසරේ දී 15.9x ක් ව පැවති වෙළෙඳපොළ මිල-ඉපැයුම් අනුපාතයට සාපේක්ෂව මෙම වසරේ දී එහි අගය 19x ක් ලෙස ඉදිරිපෙළ වෙළෙඳපොළ සීමාවේ තවදුරටත් පැවතිණ. (රූප සටහන 09)

## ආංශික ප්‍රතිඵල


ගෙවී ගිය වසරේ දී තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය හැර අනෙකුත් සෑම ව්‍යාපාරික ක්ෂේත්‍රයක්ම ධනාත්මක ප්‍රතිඵල වාර්තා කිරීමට සමත් විය. එසේම, සියලු ව්‍යාපාරික ක්ෂේත්‍ර අතුරින් ක්ෂේත්‍රයන් 12 ක් 20% ඉක්ම වූ ප්‍රතිලාභ ගෙනදීම කැපී පෙනුනු ලක්ෂණයක් විය. බලශක්ති ක්ෂේත්‍රය 55% ක් ප්‍රතිඵල ජනිත කරමින් සාර්ථකම ක්ෂේත්‍රය ලෙස ඉහළින්ම සිටි අතර, දෙවැනි සහ තෙවැනි ස්ථාන හිමි කර ගත්තේ පිළිවෙලින් නිෂ්පාදන සහ විදුලි සංදේශ යන ව්‍යාපාරික ක්ෂේත්‍රයන් ය. විවිධාංගික ක්ෂේත්‍රය 19% ක ප්‍රතිඵල ජනිත කරන අතරතුර, මන්දගාමීව පැවති පුද්ගලික අංශ ණය ගැනීම් මධ්‍යයේ පවා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය 40% ක ප්‍රතිඵල ජනිත කිරීමට සමත් විය.

## ඒකකභාර කර්මාන්ත අංශය

2014 වසර ඒකකභාර කර්මාන්ත අංශයට ද වැදගත් වසරක් විය. 2013 වසරේ දී රුපියල් මිලියන 54,304 ක් ව පැවති ඒකකභාර අරමුදල් හි ශුද්ධ වත්කම් අගය (Net Asset Value) 2014 දෙසැම්බර් වන විට රුපියල් මිලියන 127,356 ක් දක්වා වර්ධනය විය. රාජ්‍ය අයවැය මගින් ඒකකභාර සඳහා අදාළ වූ රැඳවුම් බදු ඉවත් කිරීම ඒකකභාර කෙරෙහි ආයෝජක අවධානය වර්ධනය කිරීමට හේතු විය. ඒකකභාර අරමුදල් සංඛ්‍යාව 2013 දී 62 ක් ව තිබූ නමුත් පසුගිය වසරේ දී එය 74 දක්වා ඉහළ ගියේ ය. එසේම, ඒකකභාර හිමියන් සංඛ්‍යාව ද (වසරින් වසරට ගණන් බැලූ) 29,648 සිට 32,619 දක්වා 10% කින් වර්ධනය විය.

# කළමනාකාරීත්වය






1. සුනෙත් පෙරේරා (කළමනාකරු, ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන සහ පුහුණු කටයුතු)
2. මධුගයනි බලපිටිය (කළමනාකාරිණී, විමර්ශන කටයුතු)
3. ෂර්මිලා පණ්ඩිතරත්න (කළමනාකාරිණී, නීති සහ බලාත්මක කිරීම්)
4. රන්මිණි ජයතිලක (කළමනාකාරිණී, තොරතුරු පද්ධති)

# කාර්ය මණ්ඩලය


සජීවනී බක්මීදෙනිය


සෞමී කොඩිප්පිලි


මීනා ගුණරත්න


මංජුලා චන්ද්‍රරත්න


ඩී. එම්. ජී. ප්‍රියන්ත


ලක්ෂ්මී වික්‍රමනායක


ප්‍රභාෂිනී සමරකෝන්


සුගත් අල්විස්


අශෝකා කේ. දයාරත්න


ආර්. කේ. වසන්ත සුනිමල්


මේබලා ජයපාල


අනුලා විජේසිංහ


ප්‍රතිභානී හේරත්


රබිත බණ්ඩාර


පී. එම්. නිරෝෂිකා උදයංගනී


මහේෂ් අබේසේකර


තක්ෂිලා ෆ්‍රැන්සිස්


රශ්මි මනතුංග


සුහදිනී වික්‍රමසිංහ


බිම්බා ගමඇතිගේ


වයි. ඩී. සඳමාලි


බුද්ධිනී හේරත්


නිමල් කුමාරසිංහ


ජේ. කේ. ප්‍රියදර්ශනී


චමරි එරංගා මන්ත්‍රීරත්න


සී. එරන්දතී වෛද්‍යසේකර


ධනේෂා රාජපුර


ප්‍රීනිකා නිලක්ෂි පෙරේරා


සමන්ති ගුණවර්ධන


ඉන්දික එස්. ජයවීර

# කාර්ය මණ්ඩලය


යොහාන් එදිරිසිංහ


ඒ. සී. ඩයස්


නිසන්සලා යූ. හේරත්


ජී. ඩී. කපිල කුමාර


එල්. සිවනේෂරාජා


එම්. එම්. ඉම්රාන්


රෝෂිනී පීරිස්


තනිෂ්ක තිලකරත්න


ලලින්ද දයාරත්න


තාරක කුලතිලක


ක්‍රිස්ටෝබල් සිල්වා


ක්‍රිෂාන්ති මුතුතන්ත්‍රිගේ


ශලිනි පෙරේරා


ජුලි අලගකෝන්


කුමාරි සිරිවර්ධන



නිශෝකා ජයතුංග



නුවාලා තේවතාසන්



ලක්ෂ්මි අතපත්තු



ඇන් ක්‍රිෂාන්ති



එස්. ඩී. ධර්මසිරි



එම්. ජයසේකර



පී. ඩබ්. පියතිස්ස



චන්ද්‍රන් නාගේන්ද්‍රන්



ඩබ්. ආරියරත්න



අනුර පෙරේරා



ඩී. පැතුම් නිරෝෂන



සඳරුවන් විජේරත්න



පී. ඩී. පත්මරාණි



කේ. එම්. රංජිත්



ජී. ආර්. සරත් ජයසිංහ

නොපැමිණි : ඒෂිණී බණ්ඩාර, ප්‍රියන්ත හේරත්, ඔලිව් සොලංගාරච්චි

# මෙහෙයුම් සමාලෝචනය

## නියාමනය

ප්‍රාග්ධන වෙළෙඳපොළට වඩා කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් යුතුව, සාධාරණව සහ ආර්ථික සංවර්ධනය කරා ඉක්මනින් ළඟාවීමට හැකි අයුරින් ක්‍රියාත්මකවීමට නියාමනය තුළින් බලයක් ලබා දෙයි. ඊට අමතරව වෙළෙඳපොළ සහභාගීකරුවන්, ආයතන සහ වෙළෙඳපොළ ගණුදෙනු උපකරණ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ නියාමන අධිකරණ බලසීමාවට අයත් වේ.

## බලපත්‍ර නිකුත් කිරීම් සහ ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත සඳහන් ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයතන වලට ලබාදී තිබෙන අතර, ඔවුන්ට බලපත්‍ර සහ ලියාපදිංචි කිරීම් නිකුත් කරනු ලබයි. (සංඛ්‍යා සටහන 02)

**සංඛ්‍යා සටහන 02: වෙළෙඳපොළ සහභාගීකරුවන්ට බලපත්‍ර නිකුත් කිරීම් සහ ලියාපදිංචි කිරීම්**

| වෙළෙඳපොළ සහභාගීකරුවන් | මුළු බලපත්‍රලාභී / ලියාපදිංචි ආයතන සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ නිකුත් කරන ලද බලපත්‍ර / ලියාපදිංචි කිරීම් |
|---|---|---|
| ව්‍යාපාර වස්තු හුවමාරු | 01 | 0 |
| කොටස් තැරැව්කාර සමාගම් | 35 | 05 |
| කොටස් වෙළෙඳ සමාගම් | 14 | 08 |
| ඒකක භාර කළමනාකරණ සමාගම් | 14 | 01 |
| ඒකක භාර අරමුදල් සංඛ්‍යාව | 74 | 14 |
| ආයෝජන කළමනාකරුවන් | 38 | 03 |
| ආන්තික සැපයුම්කරුවන් | 32 | 01 |
| කොටස් ප්‍රාරක්ෂකයන් | 10 | 0 |
| ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන | 03 | 0 |
| නිෂ්කාෂන ආයතන | 01 | 0 |

## ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විෂය සීමාව තුළ පාලනය කෙරෙන සියල්ලන් නියාමනය කිරීම සඳහා පවතින්නා වූ නීතිමය රාමුව වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුන්වාදීම කරනු ලබයි.

**1986 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා වන සංශෝධනයන්**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සඳහා වන යෝජිත සංශෝධනයන් 2013 වසරේ දී මූල්‍ය හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී. කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට පෙර යෝජිත සංශෝධන නැවත සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් සජිත් ආටිගල මහතා විසින් මෙහෙයවන ලද විශේෂිත කමිටුවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පිහිටුවන ලදී. වසර තුළ යෝජිත සංශෝධනයන් නැවත සලකා බැලීමේ දී පනතේ III වන කොටස දක්වා වූ සංශෝධන සලකා බැලීමට එකී විශේෂිත කමිටුව සමත් විය.

මෙම යෝජිත සංශෝධනයන් ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වැඩිදියුණු කිරීම අතරතුර ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රවර්ධනයේ ඉදිරි පියවර කරා ගෙන යාම සඳහා අවශ්‍ය වන නීති රාමුව සම්බන්ධයෙන් වේ.

2014 වර්ෂය අවසාන වන විට පනතේ IV වන කොටස දක්වා වූ යෝජිත සංශෝධනයන් සලකා බලා අවසාන කිරීමට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් පත් කරන ලද විශේෂිත කමිටුව සමත් විය.

**කොළඹ කොටස් වෙළෙඳපොළ අසමූහීකරණය කිරීමේ බිල්පත**

නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද කොළඹ කොටස් වෙළෙඳපොළ අසමූහීකරණය කිරීමේ බිල්පතෙහි අවසාන ඉංග්‍රීසි කෙටුම්පත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කරන ලදී. මේ වන විට එකී බිල්පතෙහි සිංහල සහ දමිළ කෙටුම්පත් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කිරීම අවසන් කරමින් පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ අනුකූලතාව දැක්වීමේ සහතිකය ගරු නීතිපතිතුමා විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත අදාළ සලකා බැලීමේ කාලය තුළ තහවුරු කරන ලදී.

## සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා යෝජිත නව සංශෝධනයන්:

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරු ජනාධිපති නීතිඥ සලීම් මර්සූෆ් මහතාගේ මග පෙන්වීම යටතේ සමාගම් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය සඳහා යෝජිත නව සංශෝධනයන් නීති අංශය විසින් මෙම වසරේ දී සකස් කොට අවසන් කළ අතර, එකී සම්පාදනය කිරීම් යෝජිත සංශෝධනයන් නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට ප්‍රථමයෙන් මහජන මත විමසීමක් සඳහා යොමු කරන ලදී.

**නව සංග්‍රහයෙහි විශේෂතා:**

- ඒකාබද්ධ කිරීම් සම්බන්ධයෙන් පැන නගින සංකීර්ණ ගැටලු සහගත අවස්ථා නිරාකරණය කිරීමටත්, අවශ්‍ය අවස්ථාවලදී නියමයන්, ව්‍යවහාරික/ප්‍රතිපත්තිමය ප්‍රකාශයන් සහ මාර්ගෝපදේශනයන් නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාවට නිර්දේශ ලබාදීම පිණිසත් පවරා ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් පිළිබඳ උපදේශක මණ්ඩලයක් ප්‍රථම වතාවට හඳුන්වා දීම.

  එකී උපදේශක මණ්ඩලය මගින් ලබා දෙන නිර්දේශයන් බලාත්මක වන්නේ කොමිෂන් සභාව මගින් අනුමත කළ පසුව පමණි.

- සමාගම් පවරා ගැනීමේදී අදාළ වන නීති, මූලික සිද්ධාන්ත සහ හරය නව සංශෝධිත සංග්‍රහය යටතේ පැහැදිලිව දැක්වීම.

- පවරා ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ අර්පනයක දී අර්පනකරුත්, අර්පනලාභී සමාගමත්, එහි අධ්‍යක්‍ෂ මණ්ඩලයත් ක්‍රියා කළ යුතු ආකාරය ඉතා පැහැදිලිව දැක්වීම මගින් පවරා ගැනීමේ හෝ ඒකාබද්ධ කිරීමේ අර්පන කාල සීමාව තුළ අර්පනලාභී සමාගමේ සුළුතර කොටස්කරුවන්ගේ ආරක්ෂාව වඩා වර්ධනය කිරීම.

- අනිවාර්ය අර්පනයන් සඳහා "දාම මූලධර්මය" ප්‍රකාශිතව හඳුන්වාදීම සහ අර්පන මිල තීරණය කිරීම සඳහා ක්‍රමවේදයක් සැපයීම.

- අර්පනකරු සහ අර්පනලාභී සමාගම මගින් පවරා ගැනීමේ ක්‍රියාවලිය සංග්‍රහයට අනුකූලව සිදු කරන බවට සහතික වීම සඳහා "අනුකූලතා විගණකවරු" හඳුන්වාදීම.

- ලැයිස්තුගත පොදු සමාගමක සුළුතර කොටස්කරුවන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා, ඡන්ද හිමි කොටස් අත්පත් කර ගැනීම පමණක් නොව ඡන්ද අයිතිය ඇති කොටස් විෂයෙහි සම්බන්ධතා (interests in shares) ද අන්තර්ගත වන ආකාරයට පවරා ගැනීමේ අර්පනයක විෂය පථය පුළුල් කිරීම.

- පවත්නා කරුණු අනුව කොමිෂන් සභාවට සුදුසු යයි හැඟෙන අවස්ථාවල දී අනිවාර්ය අර්පනයන් කිරීමේ වගකීමෙන් නිදහස් කළ හැකි ප්‍රකාශිත අවස්ථා හඳුන්වා දීම සහ මවාපෑමේ යෝජනා සම්මතයක් (white wash resolution) මගින් අනිවාර්ය අර්පනයන් කිරීමේ වගකීමෙන් නිදහස් වීමේ ක්‍රමවේදය හඳුන්වාදීම.

- ඒකාබද්ධ කිරීම සම්බන්ධ විශේෂිත ප්‍රතිපාදන හඳුන්වාදීම.

- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ දක්වා ඇති ප්‍රතිපාදනවලට යටත්ව, පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීම් සම්බන්ධව කොමිෂන් සභාව සතු බලතල පුළුල් කිරීම.

- කොමිෂන් සභාව සුදුසු යයි සලකනු ලබන අවස්ථාවල දී සංග්‍රහයෙන් බැහැරව කටයුතු කිරීම සඳහා අවසර ලබාදීමේ බලය කොමිෂන් සභාවට ලබා දීම. එවන් අවස්ථාවක දී ලබා දුන් අනුමැතිය සඳහා කොමිෂන් සභාව පදනම් කර ගත් හේතු වාර්තා කර ප්‍රසිද්ධ කළ යුතුය.

### කොටස් වෙළෙඳපොළ අතරමැදියන් පිළිබඳ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා සකස් කිරීම:

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 53 (2) යටතේ සකස් කරන ලද කොටස් වෙළෙඳපොළ අතරමැදියන් පිළිබඳ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා කොමිෂන් සභාව තීරණය කිරීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් අනුමත කළ රීති, එම රීති නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද අතර, අදාළ සංශෝධන කිරීමෙන් පසුව ඒවා නැවත කොමිෂන් සභාවට ලැබීමට නියමිතය.

### විධානයන්

**අඛණ්ඩ ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවයක් ලෙස අවම කොටස් හිමිකාරත්වයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෙටුම්පත් කරන ලද රීති**
මෙම කෙටුම්පත් කරන ලද රීති ශ්‍රී ලංකා සුරැකුම්පත් සභා නියෝග අංක **SEC/LEG/13/12/37** මගින් 2014 ජනවාරි 01 වැනි දින සිට හඳුන්වාදෙන ලදී. මෙකී කෙටුම්පත් කරන ලද රීති කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරනු ලදුව කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත කිරීමේ රීතිවලට අන්තර්ගත කරන ලදී.

එම රීතිවල 7.13.1 (ඇ) රීතිය ප්‍රකාරව ලැයිස්තුගත සමාගම් විසින් 2014 ජනවාරි 01 වැනි දිනට සිය කොටස් නිකුතුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත දන්වා එවන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ලැයිස්තුගත සමාගම් 179 ක ප්‍රතිචාර ලැබුණු අතර, එලෙස ප්‍රතිචාර නොදැක්වූ ලැයිස්තුගත සමාගම්වලට 2015 මැයි 13 වන දිනට ප්‍රථම සිය ප්‍රතිචාරයන් එවීමෙන් ඉහත කී රීති කෙරෙහි අනුකූලතාව දක්වන ලෙස දන්වා සිටින මෙන් කොළඹ කොටස් වෙළෙඳපොළෙන් ඉල්ලා සිටින ලදී.

### ආයෝජකයන්ගේ අභිවෘද්ධිය ආරක්ෂා කිරීම සඳහා වූ නියාමන මැදිහත්වීම.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණුවලට අනුව ආයෝජකයන්ගේ අභිවෘද්ධිය සුරක්ෂිත කිරීම උදෙසා සහ උසස් තත්ත්වයේ වෙළෙඳපොළක් නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීම සඳහා පහත සඳහන් නියාමන ක්‍රියාකාරකම් ඉටු කරන ලදී.

- **ලැයිස්තුගත පොදු සමාගමක ස්ථාවර වත්කම් අන්සතුවීම වැළැක්වීම සහ වෙළෙඳාම් කිරීම තාවකාලිකව නැවැත්වීම.**

ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී සමාගම සම්බන්ධව විමර්ශනයක් සිදු කර ගෙන යනු ලබන අතර, එකී සමාගමේ ස්ථාවර වත්කම් අන්සතු කිරීම වැළැක්වීම සඳහා ද වෙළෙඳාම් කිරීම තාවකාලිකව නැවැත්වීම සඳහා ද කොමිෂන් සභාව විසින් නියෝග යක් නිකුත් කරන ලදී. එකී සමාගම සම්බන්ධයෙන් වූ විමර්ශන අවසාන වූ පසුව ද ආයෝජකයන්ගේ ආරක්ෂාව උදෙසා තව දුරටත් ඉහත කී නියෝගය දීර්ඝ කරන ලදී. ණය හිමියන් විසින් වාණිජ මහාධිකරණය වෙත ගොනු කරන ලද ඉල්ලීමකට අනුව එකී සමාගම ඈවර කිරීම සිදු කරන ලදී.

ආයෝජකයන්ට සිදු වූ බරපතල ප්‍රතිවිපාක මෙන්ම විමර්ශන වාර්තාවෙහි සොයා ගැනීම් පිළිබඳව සලකා බැලීමෙන් පසු කොමිසම විසින් අදාළ සමාගම සිය සමාගම් වාර්තා ඉවත් කිරීම හෝ විනාශ කිරීම වළක්වාලීම සඳහා නියෝගයක් නිකුත් කිරීමට තීරණය කරනු ලැබීය.

එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. සමාගම විසින් එකී සමාගමේ අතුරු මූල්‍ය වාර්තා වෙළෙඳපොළ වෙත නිකුත් කරන තෙක් එකී සමාගමේ කොටස් වෙළෙඳාම තාවකාලිකව නැවැත්වීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළ මෙහෙයවනු ලැබීය. එකී නියෝගය නිකුත් කිරීමේ දී කොමිෂන් සභාව අනෙකුත් කරුණු අතර අදාළ සමාගම අතුරු මූල්‍ය වාර්තා වෙළෙඳපොළ වෙත නිකුත් නොකිරීම හේතුවෙන් කොළඹ කොටස් වෙළෙඳපොළේ කඩකල පුවරුවට ඇතුළත් කිරීම සහ අදාළ සමාගම ඈවර කිරීමේ දී ඈවරකරුවකු පත් කිරීමේ සම්භාවිතාව යන කරුණු ද සලකා බලනු ලැබීය.

## මෙහෙයුම් සමාලෝචනය

**ආයෝජකයන් වෙනුවෙන් අධිකරණමය මැදිහත්වීම.**
ආයෝජකයන්ගේ අභිවෘද්ධිය සුරක්ෂිත කිරීම උදෙසා කොමිෂන් සභාව, ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. සමාගම ඈවර කිරීම පිළිබඳ අධිකරණය ඉදිරියේ පැවති නඩු කටයුතු සඳහා මැදිහත් විය. මෙවැනි මැදිහත්වීමක් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ප්‍රථම අවස්ථාව ද මෙය වේ. මෙහිදී අදාළ සමාගමේ ව්‍යාපාර කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයේ දී සිදු කළ සොයා ගැනීම් අධිකරණයේ අවධානය පිණිස යොමු කරන ලදී.

විමර්ශන වාර්තාවෙහි උධෘතයක් අධිකරණයේ සහ ඈවරකරුගේ තොරතුරු දැනගැනීම පිණිස වාණිජ මහාධිකරණයේ ගොනු කරනු ලැබීය.

**වෙළෙඳාම ආපසු හැරවීම.**
ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. සමාගම විසින් පී.සී. ෆාර්මා පී.එල්.සී. සමාගම අත්කර ගැනීම සඳහා සිදු කරන ලද කොටස් ගණුදෙනුව අතරතුර දී ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. සමාගම විසින් සමාගම් ඒකාබද්ධ කිරීම් සහ පවරා ගැනීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීම හේතුවෙන් ඉහත කී කොටස් ගණුදෙනුව ආපසු හැරවීම සිදු කරන ලදී. එමෙන්ම කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත පූර්ව දැනුම් දීමකින් තොරව සිදු කරන ලද කොටස් අත්සතු කිරීම හේතුවෙන් අගතියට පත් වූ ආයෝජකයින් වෙත වන්දි ගෙවීමට නියම කරන ලදී.

ඒ අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත පූර්ව දැනුම් දීමකින් තොරව ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් පී.එල්.සී. සමාගම විසින් සිදු කරන ලද පී.සී. ෆාර්මා පී.එල්.සී. සමාගමේ කොටස් මිල දී ගැනීම අවලංගු කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත විධානයක් නිකුත් කරන ලදී.

### අනෙකුත් විධානයන්

**වෙළෙඳපොළ අතරමැදියන්**
ආයෝජන කළමනාකරුවන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත ලියාපදිංචි වීමෙන් පසු මාස 06 ක් ඇතුළත සිය ක්‍රියාකාරකම් ආරම්භ කළ යුතු බවට නියෝගයක් නිකුත් කරන ලදී. මෙලෙස ආයෝජන කළමනාකරුවන්ගේ ක්‍රියාකාරකම් මෙහෙයවීමට හේතු පාදක වී ඇත්තේ ඇතැම් ආයෝජන කළමනාකරුවන් කොමිෂන් සභාව වෙත ලියාපදිංචි වුවද ඔවුන් ආයෝජන කළමනාකරුවන් ලෙස සිය කටයුතු ආරම්භ කිරීමට අසමත් වී ඇති බවට වූ අනාවරණයන් ය.

**ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ඒකාබද්ධ කිරීමේ සැලසුම් සඳහා පහසුකම් සැලසීම.**
ක්‍රොසින්ග්ස් පුවරුව මත මිල සංශෝධනය ඉවත් කිරීම උදෙසා නියෝගයක් නිකුත් කරන ලදී.

බැංකු සහ මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ දී ඊට පහසුකම් සැලසීමක් වශයෙන් අවස්ථානුකූලව අවශ්‍ය වේ නම් එකී සැලසුමේ විෂය සීමාව තුළට ගැනෙන කොටස් ගණුදෙනු සඳහා ක්‍රොසින්ග්ස් පුවරුව මත ආරෝපණය කර ඇති මිල සීමාවන් සම්බන්ධයෙන් වන 5% ක අවමය වෙනස් කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළ මෙහෙයවන ලදී.

**ඒකක භාර ක්ෂේත්‍රයේ සංවර්ධනය**
සියලු කළමනාකාර සමාගම් සහ ඒකක භාර අරමුදල්වල භාරකරුවන් වෙත ශ්‍රී ලංකා ඒකක භාර ක්ෂේත්‍රයේ පුළුල් පදනමක් සඳහා පහසුකම් සැලසීමක් ලෙස අවම වශයෙන් ඒකක භාර හිමියන් 50 දෙනෙක් අනිවාර්යයෙන් පවත්වා ගත යුතු බවට නියෝග කරන ලදී.

**මූලික මහජන අර්පණයන්හි කොටස්වල මිල අධි-තක්සේරු කිරීම සහ අව-තක්සේරු කිරීම නිසා වෙළෙඳපොළ වෙත ඇතිවන්නා වූ සෘණාත්මක බලපෑම අවම කිරීම.**
මූලික මහජන අර්පණයන්හිදී කොටස්වල මිල සඳහා වන පදනම සඳහා කොමිෂන් සභාව විසින් නියෝගයක් නිකුත් කරන ලදී.

මූලික මහජන අර්පණයක දී, සංස්ථා ප්‍රකාශයේ කොටස් වෙනුවෙන් අර්පණ මිල සඳහා වන පදනම අනාවරණය කළ යුතු බව අනිවාර්ය කරමින් මෙම නියෝගය කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත නිකුත් කරන ලදී. මෙම නියෝගය නිකුත් කිරීමට හේතු පාදක වී ඇත්තේ මූලික මහජන අර්පණයක දී අර්පණ මිල අධි තක්සේරු හෝ අව තක්සේරු කිරීමෙන් වෙළෙඳපොළ වෙත ඇති විය හැකි වන්නා වූ සෘණාත්මක බලපෑම අඩු කිරීමයි.

**මහජන නිකුතුව සඳහා අර්ථ දැක්වීම.**
කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති වල "මහජන නිකුතුව" සම්බන්ධයෙන් වූ අර්ථ දැක්වීම පිළිබඳ පැවති ගැටලු සහගත තත්ත්වය නිරාකරණය කිරීම සඳහා නියෝගයක් නිකුත් කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අවම මහජන නිකුතුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නිකුත් කළ නියෝගයේ සඳහන් "මහජන නිකුතුව" සම්බන්ධ අර්ථ දැක්වීම පිළිගෙන එය "මහජන නිකුතුව" සම්බන්ධයෙන් වූ පොදු අර්ථ දැක්වීමට අන්තර්ගත කරන ලෙසටත් ඒ අනුව "මහජන-නොවන කොටස්කරුවන්" පිළිබඳ අර්ථ දැක්වීම සංශෝධනය කරන ලෙසටත් කොළඹ කොටස් වෙළෙඳපොළ මෙහෙයවනු ලැබීය.

කොමිෂමේ අනුමැතිය පරිදි මෙම නියෝගය නිකුත් කරන ලද්දේ අගුළු දැමීමේ රීති සහ ලැයිස්තුගත සමාගම්වල අවම මහජන නිකුතුව සම්බන්ධ රීතිවල ඇතුළත් වන්නා වූ මහජන කොටස් හිමිකාරත්වය සම්බන්ධයෙන් වන සංඛ්‍යා ගණනය හා ප්‍රතිශතය සම්බන්ධයෙන් පැන නගින ප්‍රායෝගික ගැටලු ආමන්ත්‍රණය කිරීම වෙනුවෙනි.

**ලැයිස්තුගතභාවය ඉවත් කිරීම්**
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතිවල 5 (4) වන රීතිය පැහැදිළි කිරීම උදෙසා නියෝගයක් නිකුත් කරන ලදී. මෙහිදී ස්වේච්ඡාවෙන් සිදු කරන ලැයිස්තුගතභාවය ඉවත් කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීති වල 5 (4) වන රීතිය පැහැදිළි කරමින් දැක්වූයේ කොමිෂන් සභාව අදාළ සමාගමේ ලැයිස්තුගතභාවය ඉවත් කිරීමේ ඉල්ලීම අනුමත කරන තෙක් ගණුදෙනු කිරීම තාවකාලිකව අත්හිටුවීම පවත්වාගෙන යා යුතු බවට වූ අවශ්‍යතාවය පැහැදිළි කරදෙන ලදී.

### අනුමැතිය පිරිනැමීම්

**විශ්වීය කලාපීය සහ රාජ්‍ය අරමුදල් සඳහා අනුමැතිය පිරිනැමීම.**

මධ්‍යම තැන්පතු ක්‍රමය විසින් කොමිෂන් සභාවට ලබාදෙන නිර්දේශය මත පදනම්ව, විශ්වීය කලාපීය සහ රාජ්‍ය අරමුදල්වලට, මෙරට කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත පොදු සමාගම්වල ආයෝජනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙනු ලැබේ. එසේ ලබා දෙන අනුමැතිය 2006 අංක 05 දරණ මුදල් නිශේධනය කිරීම වැළැක්වීමේ පනත, 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්තා කිරීමේ පනත, විනිමය පාලන රෙගුලාසි සහ සුරැකුම්පත් සම්බන්ධයෙන් මෙරට ක්‍රියාත්මක වන අනෙකුත් නීති සහ රෙගුලාසිවලට යටත්ව පිරිනමනු ලබයි.

2014 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් එවැනි අරමුදල් 171 ක් සඳහා අනුමැතිය පිරිනමන ලදී.

### පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ කළ අර්පනයන්:

මෙම වර්ෂය තුළ දී පවරා ගැනීම් 20 ක් වාර්තා වූ අතර, ස්වේච්ඡා අර්පන 2 ක් ද ඒ අතර වේ. මෙම පවරා ගැනීම්වලින් 08 ක් ම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් බැංකු සහ මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීම සඳහා කළ පවරා ගැනීම් වේ.

සලකා බලන වර්ෂය තුළ දී කොමිෂන් සභාවේ පරිපාලනය යටතේ සිදු කළ අර්පනයන් පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 03)

**සංඛ්‍යා සටහන 03: වසර තුළදී සමාගම් පවරාගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය යටතේ සිදුකල අර්පන**

| අර්පනකරු | අර්පනලාභියා | අර්පනයේ ස්වභාවය | අර්පනය අවසානයේ හිමි කොටස් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | පී.සී. පාමා පී එල් සී | අනිවාර්ය අර්පනය | 32.556% |
| සොෆ්ට්ලොජික් හෝල්ඩිංග්ස් පී.එල්.සී. සහ සොෆ්ට්ලොජික් රිටේල් ප්‍රයිවට් ලිමිටඩ් | ඔඩෙල් පී එල් සී | ඒකාබද්ධ අනිවාර්ය අර්පනය | 93.2% |
| හේලීස් පී එල් සී | ඇලුෆැබ් පී එල් සී | අනිවාර්ය අර්පනය | 62.51% |
| ඇඩම් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | පී සී එච් හෝල්ඩිංග්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 53.51% |
| කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී | ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 98.34% |
| ජී. රාමනන් මහතා | ඉන්ඩස්ට්‍රියල් ඇස්පෝල්ට්ස් (සිලෝන්) පී එල් සී | අනිවාර්ය අර්පනය | 66.66% |
| කාගිල්ස් බැන්ක් ලිමිටඩ් | කැපිටල් එලයන්ස් ෆිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 75.70% |
| ඒ සී එල් කේබල්ස් පී එල් සී<br>එන් ඩී බී කැපිටල් හෝල්ඩිංග්ස් පී එල් සී සහ<br>ට්‍රයිඩන් පාට්නර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | රිසස් එනර්ජි පී එල් සී (පෙරාතුව හේමාස් පවර් පී එල් සී) | ඒකාබද්ධ අනිවාර්ය අර්පනය | 75.24% |
| රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් | විලා ෆිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 85.49% |
| නවලෝක කන්ස්ට්‍රක්ෂන් කම්පනි ප්‍රයිවට් ලිමිටඩ් විලච් | මිලේනියම් හවුසිං ඩිවලපර්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 68.75% |
| ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පනි පී එල් සී | ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පී එල් සී | අනිවාර්ය අර්පනය | 93.806% |
| එස් ජී හෝල්ඩිංග්ස් ග්ලෝබල් ප්‍රයිවට් ලිමිටඩ් | එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 51.48% |
| තැප්‍රොබේන් හෝල්ඩිංග්ස් පී එල් සී | ලංකා සෙන්චරි ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී | ස්වේච්ඡා අර්පනය | 80.76% |
| වෛද්‍ය ටී. සෙන්තිල්වල් | ඔරියන්ට් ගාමන්ට්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 39.832% |
| සීනියර් මාකටිං සිස්ටම්ස් ඒෂියා ප්‍රයිවට් ලිමිටඩ් | ඊ චැනලිං පී එල් සී | අනිවාර්ය අර්පනය | 87.29% |
| කල්වර් ෆිනෑන්ෂියල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් | යූනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී | අර්පනලාභී සමාගමේ කොටස්වලින් 2% ක් දක්වා ලබා ගැනීමට කළ අනිවාර්ය අර්පණය | 70% |

## මෙහෙයුම් සමාලෝචනය

| අර්පනකරු | අර්පනලාභියා | අර්පනයේ ස්වභාවය | අර්පනය අවසානයේ හිමි කොටස් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| දේශෝධය ඩිවලප්මන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ් | ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 75.54% |
| මුතුට් ෆිනෑන්ස් ලිමටඩ් | ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 51% |
| කාගිල්ස් (සිලෝන්) පී එල් සී | කොත්මලේ හෝල්ඩිංග්ස් පී එල් සී | ස්වේච්ඡා අර්පනය | 97.13% |
| කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී | බෑන් ලංකා ෆිනෑන්ස් පී එල් සී | අනිවාර්ය අර්පනය | 94.35% |

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලබන අනුමැතීන්

කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගතවීම සඳහා අපේක්ෂා කරනු ලබන සෑම සමාගමක් එසේ ලැයිස්තුගතවීම සඳහා අපේක්ෂා කරනු ලබන දිනට පෙර වසරක කාල සීමාවක් තුළ දී යම් පුද්ගලයෙකු හට කොටස් බෙදා හැරීමක් සිදු කර ඇත්නම් කොමිෂන් සභාවේ ලිඛිත අවසරයක් මත හැර එකී කොටස් කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ නොහැක. එකී වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාව පහත සඳහන් අනුමැතීන් 2014 වසර තුළ දී ප්‍රදානය කරන ලදී. (සංඛ්‍යා සටහන 04)

**සංඛ්‍යා සටහන 04: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 28 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලද අනුමැතීන්**

| | සමාගමේ නම |
|---|---|
| 1 | ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆයිනෑන්ස් ලිමිටඩ් |
| 2 | කොරල් රොක් හොටෙල්ස් ලිමිටඩ් |
| 3 | ආර්පිකෝ ඉන්ෂුවරන්ස් ලිමිටඩ් |
| 4 | සිංහ හොස්පිට්ල්ස් ලිමිටඩ් |
| 5 | ලකී ලංකා මිල්ක් ප්‍රෝසෙසිං කම්පනි ලිමටඩ් |

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ පිරිනමනු ලබන අනුමැතීන්

ලැයිස්තුගත සමාගමක් විසින් ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් නිකුත් කිරීමේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 29 (අ) වගන්තිය යටතේ ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. ඒ අනුව 2014 වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් පහත සඳහන් ආයතන සඳහා එසේ අනුමැතීන් ලබා දෙන ලදී. (සංඛ්‍යා සටහන 05)

**සංඛ්‍යා සටහන 05: ලැයිස්තුගත නොකළ සුරැකුම්පත් සඳහා ලබා දුන් අනුමැතීන්**

| ආයතනයේ නම | නිකුතුවේ ස්වභාවය | සුරැකුම්පත් වර්ගය | අනුමත කරන ලද මුදල | කාල සීමාව |
|---|---|---|---|---|
| නේෂන් ලංකා ෆයිනෑන්ස් පී එල් සී | පුද්ගලික පැවරුම | ඡන්ද බලය සහිත සාමාන්‍ය කොටස් | රු.මි. 700 | - |
| නේෂන් ලංකා ෆයිනෑන්ස් පී එල් සී | පුද්ගලික පැවරුම | ලැයිස්තුගත නොකළ කොටස් බලපත්‍ර | පරිවර්තනයෙන් පසු රු.මි. 674 ක උපරිම මුදලක් | අවුරුදු 04 |
| යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු ලිමිටඩ් | පුද්ගලික පැවරුම | ලැයිස්තුගත නොකළ කොටස් බලපත්‍ර | පරිවර්තනයෙන් පසු රු.මි. 3492.5 ක උපරිම මුදලක් | අවුරුදු 06 |

### වෙළෙඳ භූමියෙන් බැහැර කොටස් ගණුදෙනු

වසර දෙස සලකා බැලීමේ දී විශේෂිත පැවරීම් 533 ක් හා කොටස් ත්‍යාග පැවරුම් 162 ක් සඳහා අනුමැතිය ප්‍රදානය කරන ලදී. මෙහිදී විශේෂිත කොටස් පැවරීම් යටතේ ආන්තික ගණුදෙනු, අරමුදල් කළමනාකරණය, සමාගම් ලේඛනයෙන් බැහැර කිරීම්, ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සහ අර්ථලාභී අයිතිය වෙනස් නොවුණු ආයෝජන කළඹ යනාදිය ඊට ඇතුළත් විය.

### කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති අංක 5.4 යටතේ පිරිනමන ලද අනුමැතීන් :

පුද්ගලික නිකුත් කිරීම් මගින් කොටස් නිකුත් කිරීමක් සිදු කළ වහාම එයට ආසන්න කාල සීමාවක දී, ලැයිස්තුගත සමාගමක් විසින් එසේ නිකුත් කර ඇති කොටස් ප්‍රමාණයෙන් 20% ඉක්මවා යන පරිදි නැවත කොටස් නිකුතුවක් සිදු කිරීමට අවශ්‍ය නම්, එවැනි සමාග මක් කොමිෂන් සභාව වෙත අයදුම් පතක් යොමු කොට ඒ සඳහා අවසරය ලබා ගත යුතුය.

සලකා බලන වර්ෂය තුළ දී පහත දක්වා ඇති කොටස් නිකුතුන් සඳහා එසේ අනුමැතිය පිරිනමන ලදී.

- කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී මගින් පුද්ගලික නිකුතුවක් හරහා සිදුකිරීමට යෝජිත ආයෝජනය සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ රීති අංක 5.4 **(b)** සහ **(c)** යටතේ කළ ඉල්ලීම :

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සමාගම විසින් ලැයිස්තුගත කිරීමේ රීති අංක 5.4 **(b)** සහ **(c)** යටතේ රුපියල් බිලියන 1.680 (ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 12.9) ක ආයෝජනයක් පුද්ගලික නිකුතුවක ආකාරයෙන් ක්‍රියේෂන් ඉන්වෙස්ට්මන්ට් ශ්‍රී ලංකා එල් එල් සී නැමති පුද්ගලික හිමිකම් අරමුදලෙහි ආයෝජනය කිරීම සඳහා අවසර ඉල්ලමින් යොමු කළ අයදුම් පත්‍රය සඳහා කොමිෂන් සභාව විසින් (එකී සමාගමේ කොටස්කරුවන්ගේ සහ අනෙකුත් නියාමන ආයතනවල අනුමැතියට යටත්ව) අනුමැතිය පිරිනමන ලදී.

- නේෂන් ලංකා ෆයිනෑන්ස් පී එල් සී සමාගමේ පුද්ගලික කොටස් නිකුතුව සහ ලැයිස්තුගත නොකළ ණයකර නිකුතුව :

නේෂන් ලංකා ෆයිනෑන්ස් පී එල් සී සමාගම මගින් සිය ණය පහසුකම් ලබාදීමේ කාර්යාවලිය සිදු කරගෙන යාම සඳහාත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද ප්‍රාග්ධන අවශ්‍යතා ඉටු කිරීම සඳහාත් එම සමාගම විසින් ජී ඊ එම් ග්ලෝබල් යීල්ඩ් ෆන්ඩ් එල් එල් සී එස් සී එස් (ජී ඊ එම්) නමැති ලක්සන්බර්ග් හි සංස්ථාගත කරන ලද සමාගමක ආයෝජනය කිරීම සඳහා කොන්දේසි දෙකකට යටත්ව කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන ලදී.

- යුනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී මගින් යෝජිත ආයෝජනය :

යුනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී සඳහා, එම සමාගමේ නිකුත් කළ කොටස්වලින් 20% ඉක්මවා යමින් යෝජිත පුද්ගලික නිකුතුවක් සිදු කිරීමට සහ 15% ඉක්මවා යන පරිදි වසර 6 ක කාල පරිච්ඡේදයක් සහිත කොටස් බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත කිරීමේ රීති අංක 5.4 සහ 5.10.1 **(iii)** සහ **(iv)** යටතේ අනුමැතිය පිරිනමන ලදී. කොමිෂන් සභාව විසින් මෙම අනුමැතිය පිරිනමන ලද්දේ අදාළ අරමුදල සඳහා අනෙකුත් නියාමන ආයතනවල අනුමැතිය සහ යෝජිත ආයෝජනය සඳහා යුනියන් බැන්ක් ඔෆ් කලම්බෝ පී එල් සී සමාගමේ කොටස්කරුවන්ගේ අනුමැතිය ලබාගැනීමේ කොන්දේසිය මතයි.

- හොටෙල් ඩිවලපර්ස් පී එල් සී සමාගම විසින් සමාගමේ ණය, සමාගම් කොටස් බවට පරිවර්තනය කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතීන් හි 5.4 **(c)** යටතේ යොමු කළ අයදුම් පත්‍රය:

කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත කිරීමේ රීතීන්හි 5.4 **(b)** යටතේ, කැබිනට් මණ්ඩලයෙන් ලබා දුන් අනුමැතියට අනුකූලව, හොටෙල් ඩිවලපර්ස් පී එල් සී සමාගමේ ඉඩම් කල්බදු කුලිය සහ රජය මගින් පිරිනමන ලද රාජ්‍ය ණයෙන් 80% ක් පියවීම සඳහා හොටෙල් ඩිවලපර්ස් පී එල් සී විසින් සාමාන්‍ය ඡන්ද හිමි කොටස් 1,766,389,577 ක් රාජ්‍ය භාණ්ඩාගාරයේ ලේකම් වෙත නිකුත් කිරීම සඳහා එම සමාගමට අනුමැතිය පිරිනමන ලදී.

කැබිනට් තීරණයට අනුකූලව 2013 දෙසැම්බර් 31 වන විට සමාගම විසින් රජයට ගෙවීමට තිබූ රුපියල් බිලියන 2.35 ක ණය මුදලක් කොටස් බවට පරිවර්තනය කිරීම සඳහා ලැයිස්තුගත කිරීමේ රීතීන්හි 5.4 **(c)** යටතේ ද අයදුම්පතක් හොටෙල් ඩිවලපර්ස් පී එල් සී සමාගම විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව මුළු වටිනාකම රුපියල් 2,350,299,678 ක් වන පරිදි සමාගමේ සාමාන්‍ය කොටස් 235,029,968 ක් රාජ්‍ය භාණ්ඩාගාරයේ ලේකම් වෙත පුද්ගලික නිකුතුවක ආකාරයෙන් නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත කිරීමේ රීතීන්හි 5.4 **(c)** යටතේ අනුමැතිය ලබා දෙන ලදී.

**කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමේ රීතීන්හි සඳහා කළ සංශෝධනයන් සඳහා අනුමැතිය පිරිනැමීම :**

සලකා බලන වර්ෂය තුළ දී පහත දක්වා ඇති සංශෝධනයන් සඳහා අනුමැතිය පිරිනමන ලදී.

- ලැයිස්තුගත කිරීමේ රීති අංක 7 සහ 9 සඳහා ගෙන එන ලද සංශෝධනයන් :

ලැයිස්තුගත පොදු සමාගම්වල අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන විධායක නිලධාරියා විසින් සිදු කරනු ලබන කොටස් ගණුදෙනු සම්බන්ධයෙන් සංශෝධනයන් ගෙන එන ලද අතර, සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සම්බන්ධයෙන් නව රීති හඳුන්වාදෙන ලදී.

- ලැයිස්තුගත කිරීමේ රීති අංක 2.2.1 **(e)** සඳහා සංශෝධනයන් :

ණයකර ලැයිස්තුගත කිරීම සඳහා වන ප්‍රමාණික අවශ්‍යතා සම්බන්ධයෙන් ලැයිස්තුගත කිරීමේ රීති අංක 2.2.1**(e)** යටතේ දක්වා ඇති වර්තමාන රීතිය සංශෝධනය කරමින්, ණය උපකරණ නිකුත් කිරීමේ දී එම උපකරණවල වලංගු කාලසීමාව තුළ දී ණය උපකරණ සම්බන්ධ සිදු කරන ප්‍රමාණිකරණයන්ගේ ඉහළ සහ පහළ යාම් සම්බන්ධයෙන් වන සියලුම ප්‍රතිශෝධනයන් ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත හෙළිදරව් කිරීම අනිවාර්ය කරන ලදී.

### කොළඹ කොටස් වෙළෙඳපොළේ කොටස් තැරැව්කරුවන් සම්බන්ධයෙන් වන රීති සඳහා කළ සංශෝධනයන් සඳහා අනුමැතිය පිරිනැමීම:

කොටස් තැරැව්කාර සමාගම් සඳහා වන ද්‍රවශීල අවශ්‍යතා සම්බන්ධයෙන් වන රීති අංක 5.2 යටතේ ගෙනෙන ලද සංශෝධනයන් අනුමත කරන ලද අතරතුර ප්‍රාථමික ගණුදෙනුකරුවන් සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළේ සාංගමික ණයකරවල ගණුදෙනු කිරීමේ හැකියාව ලබාදීම පිණිස හඳුන්වාදීමට නියමිත සංශෝධනයන් නැවත සලකා බැලීම මේ වන විට නීති අංශය විසින් මේ වන විට සිදු කරනු ලැබේ.

### කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමය සම්බන්ධයෙන් වන රීති සංශෝධනය කිරීම සඳහා අනුමැතිය ලබාදීම

මධ්‍යම තැන්පතු ක්‍රමය සම්බන්ධයෙන් වන රීති සඳහා කළ පහත දක්වා ඇති සංශෝධනයන් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය පිරිනමන ලදී.

- රීති අංක 1 යටතේ හඳුන්වා දුන් පහත දැක්වෙන නව අර්ථ දැක්වීම්.
  - "අත්හිටුවන ලද අවශේෂය"
  - "අවහිර කරන ලද අවශේෂය"
  - "මුක්ත අවශේෂය"

## මෙහෙයුම් සමාලෝචනය

- සුරැකුම්පත් ගිණුම් හිමියෙකු විසින් සිදු කළ ගණුදෙනු ස්ථිර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම අදාළ ගණුදෙනු දිනයෙන් පසු දින (T + 1) පස්වරු 2.30 ට පෙර භාරකාර බැංකු විසින් සිදු කිරීම අනිවාර්ය කරමින් රීති අංක 6 සඳහා සිදු කළ සංශෝධනයන්

- කලාපයේ අනෙකුත් රටවල්වල තත්ත්වය සැලකිල්ලට ගනිමින් සුරැකුම්පත් ගිණුම් හිමියන් සඳහා ඉලෙක්ට්‍රොනික් ප්‍රකාශන ලබාදීම අවශ්‍ය පහසුකම් සැලසීම, ගිණුම් හිමියන්ට සිය ගිණුම්වල තොරතුරු සම්බන්ධයෙන් කෙටි පණිවිඩ සේවා ක්‍රමය හරහා දැනුම්දීම සිදු කිරීම, සහ මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් සපයනු ලබන සේවාව සඳහා සෘජුවම මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් හිමියන්ගෙන් ගාස්තු අය කිරීම යන කරුණු සඳහා රීති අංක 11 සහ 13 සඳහා ගෙනෙන ලද සංශෝධනයන්

  කොමිෂන් සභාව විසින් එකී සංශෝධනයන් අනුමත කරන ලද්දේ පහත සඳහන් අවශ්‍යතාවලට යටත්වය.
  * ඉලෙක්ට්‍රොනික් ප්‍රකාශනයන් සැපයීමට සුරැකුම්පත් ගිණුම් හිමියන්ගේ අනුමැතිය ලබා ගැනීම.
  * එවැනි ඉලෙක්ට්‍රොනික් ප්‍රකාශනයක් යැවීමට පෙර ගිණුම් හිමියා විසින් ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය, ගිණුම් හිමියා විසින් ලබා දී ඇති අයදුම් පත්‍රයෙහි දක්වා ඇති ලිපි යැවිය යුතු ලිපිනය වෙත දන්වා යැවීම මගින් මධ්‍යම තැන්පතු ක්‍රමය වෙත ලබා දී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය සැබෑ ද යන්න පරීක්ෂා කර බැලීම.
  * මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් එහි සහභාගීකරුවන් සඳහා නිකුත් කර ඇති මාර්ගෝපදේශයෙහි ඉහත දක්වා ඇති සංශෝධනයන් ඇතුළත් කිරීම.

- ගිණුම් හිමියන් සොයා ගත නොහැකි අවස්ථාවල දී එම ගිණුම් සම්බන්ධයෙන් පනවා ඇති තාවකාලික අත්හිටුවීම ඉවත් කර තැරැව්කාර ආයතන විසින් සිය සේවාදායකයන්ගේ ගිණුම්වලින් තමන් වෙත ගෙවීමට නියමිත මුදල් අය කර ගැනීමේ ක්‍රියාවලියට පෙරාතුව, එම ගිණුම් හිමියන් සොයා ගැනීම සඳහා, සෑහීමකට පත්විය හැකි ආකාරයේ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බව දක්වමින් කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් රීති අංක 11.2 සඳහා යෝජනා කළ සංශෝධනයන්

- මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් පිරිනමන සේවාවන් සඳහා ගාස්තු ව්‍යුහයක් හඳුන්වා දීම :

  මධ්‍යම තැන්පතු ක්‍රමය මගින් පිරිනමන සේවාවන් සඳහා වන වියදම් පියවා ගැනීම සඳහා අමතර වශයෙන් සැකසූ, නව ගාස්තු ව්‍යුහයක් කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් කොමිෂන් සභාවට දැනුම් දෙන ලදී.

#### සමාගම්වල ලැයිස්තුගත භාවය ඉවත් කිරීම සඳහා අවසරය ලබා දීම :

සලකා බලන වර්ෂය තුළ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා රීතින් හි දක්වා ඇති නිර්ලැයිස්තුගත කිරීමේ රීතීන්ට අනුකූලව පහත සඳහන් සමාගම්වල නම් ලැයිස්තුගත පොදු සමාගම් නාමාවලියෙන් ඉවත් කිරීමට අවසර දෙන ලදී.

- කුරුවිට ටෙක්ස් ටයිල් මිල්ස් පී එල් සී
- බේරුවල වෝක් ඉන් පී එල් සී
- ආසිරි සෙන්ට්‍රල් හොස්පිට්ල්ස් පී එල් සී
- එන් ඩී බී කැපිටල් හෝල්ඩිංග්ස් පී එල් සී

#### සුපරීක්ෂණය සහ අනුකූලතාවය

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනයේ මූලික අරමුණක් වනුයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ ස්ථාවරත්වය වර්ධනය කිරීමයි. යම් බලපත්‍රලාභී ආයතනයක කඩා වැටීමක් නිසා සමස්ත මූල්‍ය ක්‍රමය තුළම අවදානම පැතිරී යා හැකි අතර, වෙළෙඳපොළ තුළ පවතින අවදානම පාලනය, අවම කිරීම හා කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි. අවදානම් කළමනාකරණය ඉහළ නැංවීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, වෙළෙඳපොළ අතරමැදියන් සඳහා ඇතුළත්වීමේ අවම සුදුසුකම් සලකා බැලීම, ප්‍රාග්ධනය හා අනෙකුත් විචක්ෂණ අවශ්‍යතාවයන්, අවදානම් කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමයක් හා පැහැර හැරීම් හා අතපසුවීම් පිළිබඳ සිය අවධානය යොමු කරනු ලබයි.

#### ලැයිස්තුගත සමාගම් සුපරීක්ෂණය

ආයෝජකයන් වෙනුවෙන් වඩා කාර්යක්ෂම හා සාධාරණ වෙළෙඳපොළක් ඇතිකිරීමත්, ආරක්ෂාව පිළිබඳව සහතිකවීමත් සඳහා වන ප්‍රධානතම සංරචකයක් වනුයේ ලැයිස්තුගත සමාගම් නියාමනයයි. සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ විනිවිදභාවය හා වගකීම නිසි අයුරින් ඇති කිරීම සඳහාත් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහාත් ලැයිස්තුගත සමාගම් විසින් වැදගත් වන්නා වූ තොරතුරු ක්ෂණිකව ඉදිරිපත් කිරීම වැදගත් වේ.

ඒ අනුව ලැයිස්තුගත සමාගම් විසින් තම වාර්ෂික වාර්තාව සෑම වසරකම මූල්‍ය වර්ෂය අවසාන වී මාස 5 ක් ඇතුළත කොටස් හිමියන් වෙත සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ලැයිස්තුගත සමාගම් හී වාර්ෂික වාර්තාව විමර්ශනය කර එහි අනුකූලතාවන්ට නොගැළපෙන තැන් නිරීක්ෂණය වුවහොත් ඒ පිළිබඳව අදාළ සමාගමට දැනුම් දෙනු ලබයි. මෙම උත්සාහය සඳහා ලැයිස්තුගත සමාගම්වලින් බොහෝ දුරට ධනාත්මක ප්‍රතිචාර ලබා දෙන ලදී. වාර්ෂික වාර්තා විමර්ශනය කිරීමේ දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත සඳහන් අංශයන් පිළිබඳව අවධානය යොමු කරනු ලබයි.

- කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත නීති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ සමාගම් පනත හා සම්බන්ධ විධිවිධාන සමඟ අනුකූලත්වය
- මූල්‍යමය අවධාරණයන්
- සභාපතිතුමාගේ වාර්තාව
- සාංගමික යහපාලනය හා සම්බන්ධ භාවිතයන්
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවන්
- විගණකවරුන්ගේ වාර්තාවන්
- කොටස් හිමියන් සහ ආයෝජක තොරතුරු
- මූල්‍යමය දත්ත

වසර තුළ දී ලැයිස්තුගත සමාගම් 109 වාර්ෂික වාර්තා විමර්ශනය ආරම්භ කරන ලදුව එයින් 106 ක විමර්ශනය සිදු කර අවසන් කර ඇත. මීට අදාළව විවේචනාත්මක ලිපි 71 ක් ද නිකුත් කර තිබේ.

#### වෙළෙඳපොළ සහභාගීකරුවන් අධීක්ෂණය

**කොටස් තැරැව්කාර සමාගම්**

ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳව ආයෝජකයින්ගේ විශ්වාසය ගොඩනැගීම හා ආයෝජක ආරක්ෂාව ශක්තිමත් කිරීම පිණිස බලපත්‍රලාභී කොටස් තැරැව්කාර

සමාගම්වල මූල්‍ය ස්ථායීතාවය හා මෙහෙයුම් ශක්‍යතාවය පාලනය හා සුපරීක්ෂණය කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අධීක්ෂණ කටයුතුවල නිරත වෙයි.
අපගේ එතැන් පරීක්ෂාවන් මගින් (On Site Examinations) වැඩි අවධානයක් යොමු කරනු ලබන්නේ කොටස් තැරැව්කාර කර්මාන්තයේ වෘත්තීය ප්‍රමිතීන් ඉහළම තලයකට ගෙන ඒමයි. ඒ සඳහා අදාළ වන්නා වූ නීති සහ රෙගුලාසිවලට අනුගත වෙමින් විචක්ෂණ, ද්‍රවශීලතා, මූල්‍ය, ණය, නීති හා මෙහෙයුම් අවදානම් යන ස්වභාවයන් කේන්ද්‍ර කර ගත් අවදානම් පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි.

විතැන් පරීක්ෂාවන් (Off Site Examinations) මගින් අවධානය යොමු කරනු ලබන්නේ කොටස් තැරැව්කාර ආයතන විසින් මූලික වශයෙන් ශුද්ධ ප්‍රාග්ධනය, ගණුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතාවයන් සහ ද්‍රවශීලතා අවශ්‍යතාවයන් පවත්වාගෙන යන්නේ ද යන්න පරීක්ෂා කර බැලීමයි. මෙහි තවත් අරමුණක් වනුයේ අදාළ නීති රීති සමග අනුගත නොවන සමාගම් හා ක්‍රියාකාරකම් මොනවාද යන්න හඳුනා ගැනීමත් හා අතපසුකිරීම් හා අවදානම්වලට තුඩුදිය හැකි සමාගම් හඳුනාගැනීමත් ය. 2014 වර්ෂය තුළ එවැනි නීතිරීති කඩ කළ සමාගම්වලට, අනුගතවීම් සහතික කිරීම පිණිස සාධාරණ කාලයක් ලබාදීමට පියවර ගන්නා ලදී.

සුරැකුම්පත් වෙළෙඳපොළේ සහභාගීකරුවන් සඳහා වන මූල්‍ය බුද්ධි ඒකකය විසින් හඳුන්වා දී ඇති මුදල් විශුද්ධිකරණ රෙගුලාසි / ප්‍රමිතීන් අනුව අනුගත වෙමින් කොටස් තැරැව්කාර සමාගම් ඉහළ අනුකූලතාවයක් අනුව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැපයීම අප විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

පහළ පොළී අනුපාත තත්ත්වයන් තුළ ආයෝජකයන්ට ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි වන පරිදි ප්‍රතිපත්තිමය පොළී අනුපාත සමග ආන්තික ණය පොළී අනුපාත පවත්වාගෙන යන ලෙස සියලුම තැරැව්කාර සමාගම්වලින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ඉල්ලා සිටින ලදී.

2013 වසර හා සංසන්දනය කිරීමේ දී 2014 වර්ෂය තුළ කොටස් තැරැව්කාර කර්මාන්තයේ සමස්ත මුළු පිරිවැටුම ඉහළ ගොස් ඇත. කොටස් තැරැව්කාර සමාගම්වල කාර්ය සාධනය පිළිබඳ සංසන්දනාත්මක සංඛ්‍යා ලේඛනය පහත පරිදි වේ. (සංඛ්‍යා සටහන 06)

**සංඛ්‍යා සටහන 06: කොටස් තැරැව්කරණ කර්මාන්තයේ කාර්ය සාධනය**

| | 2014 (රු.'000) | 2013 (රු.'000) | වෙනස % |
|---|---|---|---|
| පිරිවැටුම | **3,087,228** | 1,745,186 | 76.9 |
| ශුද්ධ තැරැව්කාර ගාස්තුව | **2,833,873** | 1,541,338 | 83.9 |
| මෙහෙයුම් අලාභය | **794,562** | (619,374) | 228.3 |
| වෙනත් ආදායම් | **510,000** | 810,282 | (37.1) |
| බදුවලට පෙර ශුද්ධ අලාභය | **727,606** | (711,484) | 202.3 |
| බදුවලට පසු ශුද්ධ අලාභය | **604,053** | (711,091) | 184.9 |
| මුළු වත්කම් * | **11,333,864** | 10,265,557 | 10.4 |
| මුළු වගකීම් * | **4,924,007** | 4,462,858 | 10.3 |
| ශුද්ධ ප්‍රාග්ධනය * | **4,966,033** | 4,742,514 | 4.7 |

*මූලය : සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ඉදිරිපත් කළ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන*
** 2014/2013 දෙසැම්බර් 31 දිනට*

## කොළඹ කොටස් හුවමාරුව සම්බන්ධ නියාමන තක්සේරුව

කොළඹ කොටස් හුවමාරුව සම්බන්ධ 2014 වර්ෂයේ විගණනය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සාර්ථක අයුරින් නිම කරන ලදී. කොළඹ කොටස් හුවමාරුව තම රාජකාරි හා වගකීම් ඉෂ්ට කිරීමේ දී යහපාලනය හා හැසිරවීම් ඇතුළත් සාකල්‍යවාදී ප්‍රවේශයකින් සිදු කරන්නේ ද යන්න ඊට අයත් විය.

## ඒකක භාර කර්මාන්තය

2014 වර්ෂය තුළ පෙර වසර හා සංසන්දනය කිරීමේ දී ඒකක භාර කර්මාන්තයේ ශුද්ධ වත්කම්වල (135%) කැපී පෙනෙන ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රථම වරට ඩොලර් බැඳුම්කර ඒකක භාර අරමුදලක් සඳහා බලපත්‍ර නිකුත් කරන ලද අතර, අනෙකුත් ඒකක භාර අරමුදල් 14 ක් සඳහා ද බලපත්‍ර නිකුත් කරන ලදී. ඊට අමතරව 2014 වර්ෂය තුළ එක් ඒකක භාර කළමනාකරණ සමාගමක් හා එක් භාරකාර බැංකුවක් වෙළෙඳපොළට ඇතුළත් වන ලදී.

ඒකක භාර කර්මාන්තයේ සුළු පරිමාණ ආයෝජකයන් සංඛ්‍යාව ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සියලුම ඒකක භාර කළමනාකරණ සමාගම්වලට අදාළ වන පරිදි අවම වශයෙන් සෑම විටම එක් අරමුදලක ඒකක හිමියන් 50ක් වත් පවත්වාගෙන යා යුතු බවට නියෝගයක් පනවන ලදී. මූලික ඒකක නිකුත් කරන අවස්ථාවලදී ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් ද අවම වශයෙන් ඒකක හිමියන් 50 ක් පවත්වාගෙන යා යුතු බවට නියෝග කරන ලදී. ඔවුන්ගේ මූල්‍ය ශක්තිය, අභ්‍යන්තර පරිපාලනයන් සමග අනුකූලතාවයන් සහ ක්‍රමවේදයන්, යහපාලනය, තොරතුරු ක්‍රමවේදයන්, නීති හා නියාමන අවශ්‍යතාවයන් පිළිගත හැකි මට්ටමක පවතීද යන්න තක්සේරු කිරීම සඳහා අවශ්‍ය වන පුළුල් පරාසයක විහිදී ඇති විචක්ෂණ, මෙහෙයුම් හා කළමනාකරණ ප්‍රතිපත්ති සම්බන්ධ අවදානම් තත්ත්වයන්ට අදාළව වර්ෂය පුරා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අවදානම් පදනම් කර ගත් එතැන් අධ්‍යයනයන් කළමනාකරණ සමාගම් සම්බන්ධයෙන් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති අවම ශුද්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පවත්වාගෙන යන්නේ ද සහ මූල්‍යමය අතින් ස්ථාවර තත්ත්වයක කළමනාකරණ සමාගම් පවතිනවා ද යන්න තහවුරු කිරීම පිණිස කළමනාකරණ සමාගම්වල විගණනය නොකළ මූල්‍ය වාර්තා ද පරීක්ෂාවට ලක් කරයි. ඊට අමතරව ඒකක භාර


## මෙහෙයුම් සමාලෝචනය

අරමුදල්, ඒකක භාර සංග්‍රහයේ, භාරක ඔප්පුවේ සඳහන් සීමාවන් සහ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති නියෝගවලට අනුව ද්‍රවශීලතාවයන් සහ අනාවරණ තත්ත්වයන් නිසි අයුරින් පවත්වාගෙන යන්නේ ද පිළිබඳ මාසික ප්‍රතිලාභයන් සියුම්ව පරීක්‍ෂා කර බැලීමත් සිදු කරයි.

### ඒකක භාර අරමුදල්

2014 දෙසැම්බර් 31 වන දිනට ඒකක භාර අරමුදල්වල ශුද්ධ වත්කම් වටිනාකම දළ වශයෙන් රුපියල් බිලියන 127 ක් විය. 2014 වර්ෂය තුළ එක් එක් ඒකක භාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස පහත වගුවේ සඳහන් වේ. (රූප සටහන 10)

**රූප සටහන 10: 2014 දෙසැම්බර් 31 වන දිනට ඒකක භාර කළමනාකරණ සමාගම්වල වෙළෙඳපොළ කොටස**




### ඒකක භාර අරමුදල්වල සමස්ත තත්ත්වය

2013/2014 වර්ෂයන්ට අදාළ ඒකක භාර අරමුදල්වල සංසන්දනාත්මක කාර්ය සාධන තත්ත්වය පහත වගුවේ දක්වේ. (සංඛ්‍යා සටහන 07)

**සංඛ්‍යා සටහන 07: ඒකකභාර අරමුදල්වල සමස්ථ තත්වය**

| | 31.12.2014 දිනට | 31.12.2013 දිනට | % වෙනස |
|---|---|---|---|
| ඒකක භාර අරමුදල් සංඛ්‍යාව | **74** | 62 | 19% |
| ඒකක භාරවල ශුද්ධ වත්කම් වටිනාකම | **127,356** | 54,304 | 135% |
| ඒකක හිමියන් සංඛ්‍යාව | **32,619** | 29,648 | 10% |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව (දළ වශයෙන් මිලියන) | **9,772** | 4,134 | 136% |
| කොටස්වල ආයෝජනය (රු. මිලියන) | **14,591** | 9,453 | 54% |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය (රු. මිලියන) | **60,897** | 17,825 | 242% |
| අනෙකුත් උපකරණවල ආයෝජනය (රු. මිලියන) | **52,202** | 27,000 | 93% |

*** වාණිජ පත්‍ර, තැන්පතු සහතික, ණයකර, බැංකු තැන්පතු, ආදී........*

*මූලය : ඒකක භාර කළමනාකරණ සමාගම් විසින් නියාමන ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු*

### වෙළෙඳපොළ අතරමැදි ආයතන

ආන්තික ණය සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන්, ණය ප්‍රමාණීකරණ නියෝජිත ආයතන, කොටස් ප්‍රාරක්‍ෂණ ආයතන සහ නිෂ්කාශන ආයතන සඳහා වෙළෙඳපොළ අතරමැදි ආයතන වශයෙන් ක්‍රියාකාරීවීමට අවශ්‍ය ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට බලය ලබා දී ඇත. ආයෝජකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් වෙළෙඳපොළ වර්ධනය හා තරගකාරීත්වය ඉහළ නැංවීමට අවශ්‍ය කරන්නා වූ නීති සම්පාදනය හා අනෙකුත් ක්‍රියාපටිපාටීන් අඛණ්ඩව තව දුරටත් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

2014 වර්ෂය තුළ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙතෙක් ව්‍යාපාර කටයුතු ආරම්භ කර නොමැති ආයෝජන කළමනාකරුවන්ගේ ලියාපදිංචිය අලුත් කිරීම සම්බන්ධ අවදානම් තක්සේරුවක් සිදු කරන ලදී. ඒ අනුව 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ලියාපදිංචි සියලුම ආයෝජන කලමනාකරණ සමාග ම්වලට බලපැවැත්වෙන පරිදි නියෝග යක් පනවමින් කියා සිටියේ මෙම අදාළ නියෝගය පනවා මාස 6 ක් ඇතුළත තම ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලෙසයි. එම මාස 6 අවසන්වීමෙන් පසු, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සියලුම ආයෝජන කළමනාකරණ ආයතනවලට ගොස් ඔවුන්ගේ ව්‍යාපාර සැලසුම් හා මෙහෙයුම් තත්ත්වයන් පිළිබඳව සොයා බලන ලදී. එම සොයා බැලීම පදනම් කරගනිමින් අදාළ නියෝගය අනුව තවමත් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකළ ආයෝජන කළමනාකරුවන් සඳහා ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට තවත් මසක කාලයක් ලබාදෙන ලදී.

2014 වර්ෂය අවසාන වන විට සියලුම ආයෝජන කළමනාකරුවන් අදාළ නියාමන අවශ්‍යතාවන්ට අනුගතවීමක් දකගත හැකි විය. තවද ඉහත කියවුණු නියෝගයට අනුව, ශ්‍රී ලංකා සුරැ කුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ නව ලියාපදිංචිය ලබා ගත යුතු අතර, එසේ ලබාගෙන මාස 6 ක් ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතුය. මෙම වැඩපිළිවෙළ නිසා ආයෝජන කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීමට ලියාපදිංචි වන ආයතන විධිමත් සැලැස්මක් හා ක්‍රියාපටිපාටියක් නොමැතිව ව්‍යාපාර කටයුතු සිදු කරන සහ ලියාපදිංචිය අයථා ලෙස භාවිතා කරන ආයතන ලියාපදිංචිය අධෛර්යමත් කිරීමට ඉවහල් විය.

2014 වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ සාමාන්‍ය බර තබන ලද මූලික ණය අනුපාතය පහළ යාම නිසා ඇති වූ යහපත් ආර්ථික වාතාවරණයට

ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සියලුම ආන්තික ණය සැපයුම්කරණ ආයතනවලින් ඉල්ලා සිටියේ ආන්තික ගණුදෙනු සඳහා වන ණය අනුපාතය ද හැඩගස්වා ගන්නා ලෙසයි. එය ගණුදෙනුකරුවන්ට වඩාත් හිතකර තත්ත්වයක් වූ අතර, ඔවුන්ගේ ප්‍රතිලාභ ඉහළ යාමට ද එය ඉවහල් විය. තව ද වර්ෂය අවසාන භාගය වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සියලුම ආන්තික ණය සැපයුම්කරුවන් සමඟ උපදේශන හමුවක් පැවැත්වීමට කටයුතු කළ අතර, එයින් බලාපොරොත්තු වූයේ ආන්තික ගණුදෙනු නියාමන ගැටලු පිළිබඳව ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීමත් එමගින් කර්මාන්තය වඩාත් ශක්තිමත් කිරීමත් ය. (සංඛ්‍යා සටහන 08)

**සංඛ්‍යා සටහන 08: අනෙකුත් වෙළෙඳපොළ අතරමැදි ආයතනවල මූල්‍ය කාර්යසාධනය * (2014 දෙසැම්බර් 31 වන දිනට)**

| කාණ්ඩය | මුළු පිරිවැටුම (රු.) | බීක් එක් අංශයන්ගෙන් ලැබුණු ආදායම (රු.) | බදුවලට පෙර ශුද්ධ ලාභය (රු.) | මුළු වත්කම් (රු.) | මුළු වගකීම් (රු.) |
|---|---|---|---|---|---|
| ආන්තික ණය සැපයුම්කරුවන් | 176,556,203 | 169,349,554 | (80,076,019) | 1,180,001,061 | 344,394,477 |
| ආයෝජන කළමනාකරුවන් | 528,671,984 | 299,974,359 | 361,527,645 | 5,059,907,948 | 1,051,087,521 |
| කොටස් ප්‍රාරක්ෂකයින් | 2,632,607,000 | - | 2,718,912,000 | 17,532,866,000 | 126,472,000 |
| ණය ප්‍රමාණීකරණ | 130,136,218 | 117,603,718 | 19,985,630 | 300,298,990 | 74,873,797 |
| නියෝජිතායතන | 558,705,350 | 342,485,764 | 267,925,051 | 4,992,901,614 | 1,077,002,381 |
| බහුකාර්ය ආයතන** | 4,026,676,755 | 929,413,395 | 3,288,274,307 | 29,065,975,613 | 2,673,830,176 |

*මූලය : සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට යොමු කරන ලද විගණනය නොකරන ලද මූල්‍ය වාර්තා*

** කර්මාන්තයෙහි සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පාලනය වන බලපත්‍රලාභී බැංකු, ලියාපදිංචි මූල්‍ය ආයතන සහ විශේෂිත කල්බදු සමාගම්වලට අදාළ තොරතුරු හැර ඉහත මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත.*

*** බහුකාර්ය ආයතන යනු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් පාලනය වන කාර්යයන් කිහිපයක ක්‍රියාකරවීම සඳහා ලියාපදිංචි ප්‍රදානය කර ඇති ආයතන වේ.*

## ආවේක්ෂණ කටයුතු, විමර්ශන කටයුතු සහ නීති ක්‍රියාත්මක කිරීම

### ආවේක්ෂණ කටයුතු

කොටස් වෙළෙඳපොළ ගණුදෙනුවල සාධාරණත්වය සහ අවංකභාවය ප්‍රවර්ධනය කර වැඩි දියුණු කිරීමට අමතරව කාර්යක්ෂම, ඵලදායී සහ විනිවිදභාවයෙන් යුතු ප්‍රාග්ධන වෙළෙඳපොළක් සංවර්ධනය කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට පනතින් ලැබී ඇති බලතල ප්‍රකාරව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ අනෙකුත් නීතිරීතිවලට පටහැණි වූ ගණුදෙනු හඳුනා ගැනීමේ සහ වළක්වා ගැනීමේ අරමුණින් යුතුව කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ගණුදෙනු ක්‍රමවත් ලෙස අධීක්ෂණය කිරීම සඳහා සුරැකුම්පත් කොමිෂන් සභාවට වගකීමක් ඇත.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළ තුළ දිනපතා සිදුවන ගණුදෙනු ආවේක්ෂණය කරනු ලබන අතර, එහි මිල සහ පිරිවැටුමෙහි සිදුවන අසාමාන්‍ය වෙනස්කම්වලින් සංඥා කරනු ලබන අභ්‍යන්තර පුද්ගලයන් සිදු කරන ගණුදෙනු, ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයන් නිර්මාණය කිරීම සහ අනෙකුත් විෂමාචාරයන් හඳුනා ගැනීම සහ මූලික පරීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි.

ඉතා දියුණු ආවේක්ෂණ පද්ධතියකින් සමන්විතව, අප විසින් මිල සහ පිරිවැටුමෙහි සිදුවන අසාමාන්‍ය වෙනස්කම්වලින් සංඥා කරනු ලබන අභ්‍යන්තර පුද්ගලයින් සිදුකරන ගණුදෙනු, ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයන් නිර්මාණය කිරීම සහ අනෙකුත් වෙළෙඳපොළ විෂමාචාරයන් හඳුනා ගැනීම සහ මූලික ආවේක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. ආවේක්ෂණ පද්ධතිය විසින් කොටස් වෙළෙඳපොළ තුළ සිදුවන සැක කටයුතු ගණුදෙනු හඳුනා ගනු ලබයි. සැක කටයුතු ගණුදෙනුවක් හඳුනා ගැනීමෙන් පසුව ආවේක්ෂණ වාර්තාවක්, ආවේක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි. ආවේක්ෂණ කමිටුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් විසින් ආවේක්ෂණ වාර්තාව පරීක්ෂා කොට වැඩිදුර විමර්ශනයක් අවශ්‍ය නම් එම තීරණය කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කරන අතර, පසුව කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව එම ආවේක්ෂණ වාර්තාව වැඩිදුර විමර්ශන කටයුතු කිරීම සඳහා යොමු කරනු ලබයි.

කොමිෂන් සභාව විසින් ලබා ගත් වඩා වැඩි දියුණු ආවේක්ෂණ පද්ධතිය, වෙළෙඳපොළ දත්ත පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම සහ අනෙකුත් දියුණු ආවේක්ෂණ පහසුකම් නිසා පසුගිය වර්ෂය තුළ මූලික ආවේක්ෂණ හඳුනා ගැනීම් විශාල සංඛ්‍යාවක් කිරීමට හැකි විය.

## මෙහෙයුම් සමාලෝචනය

2014 වර්ෂය තුළ අප විසින් ආවේක්ෂණ වාර්තා 18 ක් පිළියෙල කරන ලද අතර, ඒවා පහත සඳහන් කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතා යටතේ වර්ග කළ හැක. (සංඛ්‍යා සටහන 09)

**සංඛ්‍යා සටහන 09: ආවේක්ෂණ වාර්තාවන්**

| ආවේක්ෂන වාර්තාවන් | සංඛ්‍යාව |
|---|---|
| අභ්‍යන්තර පුද්ගලයන් විසින් සිදු කරන ගණුදෙනු | 6 |
| පෙර විකුණුම් ගණුදෙනු | 3 |
| ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීම | 10 |
| අනෙකුත් වෙළෙඳපොළ අක්‍රමිකතා | 2 |

ඊට අමතරව කොළඹ කොටස් හුවමාරුව විසින් අප වෙත පසුගිය වර්ෂය තුළ ආවේක්ෂණ වාර්තාවන් 15 ක් වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා අප වෙත යොමු කරන ලදී. කොළඹ කොටස් හුවමාරුව ද අප හා සමගාමීව, ස්වාධීනව කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ගණුදෙනු ආවේක්ෂණය කරනු ලබයි.

අප විසින් සොයා ගනු ලබන ආවේක්ෂණ හඳුනා ගැනීම්වලින් සුවිශේෂී සහ ප්‍රධාන හඳුනා ගැනීම් ප්‍රමුඛතාවය මත වර්ගීකරණයට ලක් කරන අතර, ඉන් ප්‍රමුඛතාවය ලබන ආවේක්ෂණ හඳුනා ගැනීම්, ආවේක්ෂණ වාර්තාවක් ලෙස පිළියෙල කොටස යොමු කරනු ලබයි. අනෙකුත් සුළු ප්‍රමාණයේ ආවේක්ෂණ හඳුනා ගැනීම් ආවේක්ෂණ නිරීක්ෂණයක් ලෙස වර්ග කරනු ලබයි. පසුගිය වසර තුළ මිල සහ ප්‍රමාණයෙහි ඇතිවන අසාමාන්‍ය වෙනස්කම් සහ අසාමාන්‍ය වෙළෙඳපොළ ගණුදෙනු රටාවන් පිළිබඳව වූ ආවේක්ෂණ නිරීක්ෂණයන් 350 කට අධික ප්‍රමාණයක් හඳුනා ගන්නා ලදී.

ආවේක්ෂණ වාර්තාවන් සහ අනෙකුත් ආවේක්ෂණ කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා වැඩ බලන ප්‍රධානී/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව ආවේක්ෂණ කමිටුව පසුගිය වසර තුළ 9 වතාවක් මුණ ගැසෙන ලදී.

පසුගිය වසර තුළ විවිධ වූ සැක කටයුතු වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් කොටස් වෙළෙඳපොළ ආයෝජක උපදේශකයන්, කොටස් වෙළෙඳපොළ තැරැව්කාර ආයතන වෙළෙඳපොළ සහභාගීකරුවන් හා ආයෝජකයින් සම්බන්ධව ආවේක්ෂණ කමිටුව විසින් විවිධ වූ තීරණයන් ගන්නා ලදී.

ආවේක්ෂණ කමිටුව විසින් සුළු පරිමාණයේ අක්‍රමිකතාවයන්ගෙන් නිරත වුණු කොටස් තැරැව්කරුවන් සහ ආයෝජකයින් ආවේක්ෂණ කමිටුව හමුවට කැඳවා එවැනි අක්‍රමිකතාවයන් වලින් වැළකී සිටින ලෙස තරයේ අවවාද කරන ලදී. මීට අමතරව ආවේක්ෂණ කමිටුවේ උපදෙස් අනුව සැක කටයුතු අක්‍රමිකතාවයන්හි නිරත වුණු කොටස් තැරැව්කරුවන් හා ආයෝජකයින්ගෙන් ලිඛිත පැහැදිලි කිරීම් ලබා ගන්නා ලද අතර, ඒවා ආවේක්ෂණ කමිටුව වෙත වාර්තා කරන ලදී.

සුළු පරිමාණ කොටස් වෙළෙඳපොළ අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් විවිධ අවස්ථාවන්හි දී එවැනි අක්‍රමිකතාවයන් තව දුරටත් සිදුවීම වළක්වා ගැනීම පිණිස, කොටස් තැරැව්කරුවන්ගෙන් එවැනි අක්‍රමිකතාවයන් හඳුනාගත් විගසම දුරකථන මාර්ගයෙන් කරුණු විමසා සිටි අතර, එම සියලුම දුරකථන විමසුම් ලේඛනගත කරන ලදී.

### විමර්ශන කටයුතු

ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කිරීමේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යභාරයේ ප්‍රධාන අංගයක් වන්නේ සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන සැක කටයුතු අක්‍රමිකතා සම්බන්ධයෙන් කාර්යක්ෂම විමර්ශනයන් සිදු කිරීමයි. ඉහත කී විමර්ශන, ක්‍රමවත් හා සාධාරණ සුරැකුම්පත් වෙළෙඳපොළක් ඇති කිරීමට ඉවහල් වන අතර, වෙළෙඳපොළ පිළිබඳ ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම මගින් ප්‍රාග්ධන වෙළෙඳපොළේ සංවර්ධනයට ද දායක වේ. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතින් ලබා දී ඇති බලතල ප්‍රකාරව, 2014 වර්ෂයේ දී ද සැක කටයුතු වෙළෙඳපොළ අක්‍රමිකතා සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සහ ඒවාට අදාළව සුදුසු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද අතර, එකී ක්‍රියාමාර්ග වෙළෙඳපොළට අදාළ වෘත්තීන්ගේ ගුණාත්මකභාවය සහ ලැයිස්තුගත සමාගම්වල ක්‍රියා පිළිවෙත ඉහළ තලයක පවත්වා ගෙන යැමට සහ ආයෝජකයන්, ලැයිස්තුගත සමාගම් සහ වෙළෙඳපොළ අතරමැදියන් නීති විරෝධී ක්‍රියාවන්හි නියැලීමෙන් වැලැක්වීමට බෙහෙවින් ඉවහල් විය.

ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම, අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු, පෙර විකිණීම් ඇතුළු සුරැකුම්පත් වෙළෙඳපොළේ සිදුවන සැක කටයුතු අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් 2014 වර්ෂයේ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශන සිදු කරන ලදී. මීට අමතරව 2012 වසරේ දී ආරම්භ කර විමර්ශන කටයුතු අවසාන කරන ලද විමර්ශනයක් සම්බන්ධයෙන් උපදෙස් ගරු නීතිපතිවරයාගෙන් එම වසරේදීම ඉල්ලා සිටින ලද අතර, අදාළ උපදෙස් 2014 වර්ෂය අවසාන වන විටත් ලැබීමට නියමිතව තිබිණි.

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ ඒ යටතේ පනවන ලද නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් ද 2014 වර්ෂය තුළ දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගන්නා ලදී. ලැයිස්තුගත සමාගම් 2 ක සුරැකුම්පත් සම්බන්ධයෙන් ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම පිළිබඳව සහ ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම සහ / හෝ අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු සිදු කිරීම පිළිබඳව සිදු කරන ලද විමර්ශන 2 ක් අවසානයේ දී පුද්ගලයන් 5 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කිරීම උක්ත බලාත්මක කිරීමේ ක්‍රියා මාර්ග අතර කැපී පෙනේ. ඉහත කී සුරැකුම්පත් සම්බන්ධ නීති උල්ලංඝනය කිරීම්වලට අමතරව, විනිමය පාලන නීතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පෙර කී එක් විමර්ශනයක් අතරතුර දී හෙළි වූ කරුණු විනිමය පාලකවරයා වෙත යොමු කරන ලදී.

ලැයිස්තුගත සමාගමක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද තවත් විමර්ශනයක් අවසානයේ දී අදාළ සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන් සහ / හෝ නිලධාරීන් ලෙස කටයුතු කළ පුද්ගලයින් 20 දෙනෙකුට නඩු පැවරීමේ නොතීසි නිකුත් කරන ලදී. ඉහත කී විමර්ශනය පිළිබඳ විස්තර, නීතිමය පියවර ගත යුත්තේ කවර පුද්ගලයන්ට එරෙහිව ද යන්න නිර්ණය කිරීම සඳහා ගරු නීතිපතිවරයා වෙත යොමු කර තිබේ.

ලැයිස්තුගත සමාගමක සුරැකුම්පත් සම්බන්ධයෙන් සැක කටයුතු අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු

සිදු කිරීම සම්බන්ධයෙන් පවත්වන ලද තවත් විමර්ශනයක් අවසානයේ දී අදාළ ලැයිස්තුගත සමාගමේ සභාපතිවරයා වෙත දැඩි ලිඛිත අනතුරු හැඟවීමක් සිදු කරන ලදී.

ඉහත කී විමර්ශනයන්ට අමතරව, ලැයිස්තුගත සමාගමකට සම්බන්ධ ආයතනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද නියෝගයකට අනුව අදාළ ආයතනයේ නීතිමය ස්වභාවය පිළිබඳ විමසුමක් සිදු කරන ලද අතර, එකී විමසුමේ දී හෙළිදරව් වූ කරුණු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලබා දෙන ලදී.

තවද, සැක කටයුතු මුදල් විශුද්ධිකරණයක් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කරන ලද විමසුමක් සම්බන්ධයෙන් එම ඒකකය වෙත සහයෝගය ලබා දෙන ලදී.

2014 වර්ෂ අවසානය වන විට සිදු කරන ලද / සිදු කෙරෙමින් පැවති විමර්ශනයන් සම්බන්ධව කෙටි විස්තරයක් සහ ඒවාට අදාළව ගනු ලැබූ ක්‍රියාමාර්ග / ඒවායේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වේ. (සංඛ්‍යා සටහන 10)

**සංඛ්‍යා සටහන 10: විමර්ශන පිළිබඳ තොරතුරු**

| විමර්ශනයේ ස්වභාවය | විමර්ශන සංඛ්‍යාව | ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු [1] | 03 | 2013 වර්ෂ අවසානය වන විට අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු සම්බන්ධයෙන් විමර්ශන 3 ක් සිදු කෙරෙමින් පැවතිණි.<br>▹ 2014 වසරේ දී ඉහත කී එක් විමර්ශනයකින් හෙළිදරව් වූ කරුණු පදනම් කොටගෙන එක් පුද්ගලයකුට දැඩි අනතුරු හැඟවීමේ ලිපියක් නිකුත් කරන ලදී.<br>▹ අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු පිළිබඳව සිදු කළ ඉහත කී තවත් විමර්ශනයක්, අදාළ පුද්ගලයින් එම වරද සිදු කළ බව සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි හෙළිදරව් නොවූ බැවින්, ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව අවසන් කරන ලදී.<br>▹ 2014 දෙසැම්බර් වන විට ඉහත කී අවශේෂ විමර්ශනයේ විමර්ශන කටයුතු අවසන් කර තිබූ අතර, ඊට අදාළ විමර්ශන වාර්තාව සකස් කෙරෙමින් පැවතිණි. |
| ව්‍යාජ වෙළෙඳපොළ/ මිල තත්ත්වයක් නිර්මාණය කිරීම [2] | 2 | 2013 වර්ෂ අවසානය වන විට ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම පිළිබඳ එක් විමර්ශනයක් සිදු කෙරෙමින් පැවතිණි.<br>▹ ඉහත කී විමර්ශනය 2014 වර්ෂය තුළ දී අවසාන කරන ලද අතර, එම විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු පදනම් කොට ගෙන පුද්ගලයින් දෙදෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කරන ලදී.<br>▹ ආයෝජන උපදේශකයින් කිහිප දෙනෙකු විසින් ලැයිස්තුගත සමාගම් 2 ක කොටස් සම්බන්ධයෙන් සිදු කරන ලද ගණුදෙනු පිළිබඳව විමසුමක් 2014 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් වන විට එම විමර්ශනය සිදු කෙරෙමින් පැවතිණි. |
| ව්‍යාජ වෙළෙඳපොළ/ මිල තත්ත්වයක් නිර්මාණය කිරීම සහ / හෝ අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු | 3 | 2014 වර්ෂය තුළ දී ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම සහ/හෝ අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු සිදු කිරීම පිළිබඳව විමර්ශන 3 ක් ආරම්භ කරන ලදී.<br>▹ ඉහත කී එක් විමර්ශනයක් අවසානයේ දී පුද්ගලයින් තිදෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීමට තීරණය කරන ලද අතර, එසේ නීතිමය පියවර ගැනීම සඳහා අදාළ කරුණු ගරු නීතිපතිවරයා වෙත යොමු කර තිබේ.<br>▹ ව්‍යාජ වෙළෙඳපොළ / මිල තත්ත්වයක් නිර්මාණය කිරීම සහ/හෝ අභ්‍යන්තර තැනැත්තන් විසින් සිදු කරන ගණුදෙනු සිදු කිරීම පිළිබඳව 2014 වසරේ දී ආරම්භ කරන ලද ඉහත කී අනෙකුත් විමර්ශන දෙක වසර අවසානය වන විට සිදු කෙරෙමින් පැවතිණි. |
| පෙර විකිණීම් [3] | 01 | 2013 වර්ෂය අවසාන වන විට පෙර විකිණීම් සම්බන්ධයෙන් එක් විමර්ශනයක් සිදු කෙරෙමින් පැවතිණි. 2014 වර්ෂයේ දී එම විමර්ශනය අවසාන කරන ලද අතර, වර්ෂ අවසානය වන විට ඊට අදාළ විමර්ශන වාර්තාව සකස් කෙරෙමින් පැවතිණි. |

1. *ලේඛනගත සමාගමක සුරැකුම්පත්වලට අදාළ වන්නා වූ ප්‍රසිද්ධියට පත් නොකරන ලද මිල සංවේදී තොරතුරු තමා සන්තකයේ තබා ගනිමින් එම සමාග මෙහි කොටස් ගණුදෙනු කිරීම.*
2. *ලැයිස්තුගත සමාගමක සුරැකුම්පත් සම්බන්ධයෙන් එහි ගණුදෙනුවලට හෝ මිලට අදාළ ආකාරයේ ව්‍යාජ හෝ නොමග යවන සුළු වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීම.*
3. *යම් සමාගමක කොටස් සම්බන්ධයෙන් ඉදිරියේ සැලකිය යුතු මිල දී ගැනීමක් හෝ විකිණීමක් පවතින අවස්ථාවක දී ඒ සමාගමේ කොටස් ඊට පසු ගණුදෙනු කොට ලාභ ඉපයීමේ අරමුණින් සේවා දායකයකු සම්බන්ධයෙන් එම සමාගමෙහි කොටස් ගණුදෙනු කිරීම.*

## මෙහෙයුම් සමාලෝචනය

| විමර්ශනයේ ස්වභාවය | විමර්ශන සංඛ්‍යාව | ගනු ලැබූ පියවර / වර්තමාන තත්ත්වය |
|---|---|---|
| කොටස් තැරැව්කාර සමාගමක් විසින් සිදු කරන ලද සැක කටයුතු අයථා ගණුදෙනු පිළිබඳ විමර්ශනය | 01 | අදාළ විමර්ශනය 2012 වසරේ දී ආරම්භ කර එම වසර තුළදීම අවසන් කරන ලද අතර, අදාළ විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ නිර්දේශය මත සහ කොමිෂන් සභා සාමාජිකයින්ගේ උපදෙස් අනුව ගරු නීතිපතිවරයාගේ උපදෙස් සඳහා යොමු කරන ලදී.<br><br>2014 වර්ෂය අවසාන වන විටත් ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු නීතිපතිවරයාගේ උපදෙස් ලැබීමට නියමිතව තිබිණි. |
| පැමිණිලි | 02 | කොටස් තැරැව්කාර සමාගමකට එරෙහිව සිදු කරන ලද ආයෝජක පැමිණිලි පදනම් කර ගනිමින් 2013 වසරේ දී ආරම්භ කරන ලද විමර්ශන 2 ක් 2014 වර්ෂයේ දී අවසන් කරන ලද අතර, ඒවාට අදාළ විමර්ශන වාර්තා 2014 දෙසැම්බර් වන විට සකස් කෙරෙමින් පැවතිණි. |
| ලැයිස්තුගත සමාගමක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනය | 01 | ලැයිස්තුගත සමාගමක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් 2013 වර්ෂයේ දී ආරම්භ කරන ලද විමර්ශනයක් 2014 වර්ෂයේ දී අවසන් කරන ලදී.<br><br>ඉහත කී විමර්ශනයෙන් හෙළිදරව් වූ කරුණු පදනම් කොට ගෙන අදාළ සමාගම සහ එහි අධ්‍යක්ෂවරුන් සහ/හෝ නිලධාරීන් ලෙස කටයුතු කළ පුද්ගලයින් 20 දෙනෙකු වෙත නඩු පැවරීමේ නොතීසි නිකුත් කරන ලදී. නීතිමය පියවර ගත යුත්තේ කවර පුද්ගලයන්ට එරෙහිව ද යන්න නිර්ණය කිරීම සඳහා අදාළ විමර්ශනය පිළිබඳ විස්තර ගරු නීතිපතිවරයා වෙත යොමු කර තිබේ. |
| ලැයිස්තුගත සමාගමක් විසින් පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීම පිළිබඳ විමර්ශනය | 01 | 2014 වර්ෂය තුළ දී, ලැයිස්තුගත සමාගමක් විසින් සිදු කළ පවරා ගැනීමේ සහ ඒකාබද්ධ කිරීමේ සංග්‍රහය උල්ලංඝනය කිරීමක් පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් අග වන විට එම විමර්ශනය සිදු කෙරෙමින් පැවතිණි. |

### පැමිණිලි

වර්ෂය තුළදී කොමිෂන් සභාව ලැයිස්තුගත කරන ලද සමාගම් 25කට එදිරිව කරන ලද පැමිණිලි විමර්ශනයට භාජනය කරන ලදුව ඒවායින් 23කට විසඳුම් ලබා දී ඇත.

### නඩු කටයුතු

#### මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් එදිරිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව (නඩු අංක HCMCA 217/2007)

මැග්පෙක් එක්ස්පෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි යම් යම් වැදගත් තොරතුරු වහා හෙළිදරව් නොකිරීම මගින් කොමිෂන් සභා රීති උල්ලංඝනය කිරීමේ වරදට කොළඹ කොටුව උගත් මහේස්ත්‍රාත්තුමා විසින් වරදකරුවන් කළ පුද්ගලයන් හතර දෙනෙකු එතුමාගේ තීන්දුව හා ලබා දුන් දණ්ඩනයන්ට එරෙහිව කොළඹ පළාත්බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

ගරු මහාධිකරණ විනිසුරුතුමා විසින් චූදිතයන් තිදෙනෙකු සම්බන්ධයෙන් තීන්දුව ස්ථිර කර, පනවන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩනය අවලංගු කර එක් එක් චූදිතයා රුපියල් මිලියන 3.3 ක දඩයකට යටත් කරන ලදී.

මෙහි 6 වන චූදිත සම්බන්ධයෙන් වන තීන්දුව හා දණ්ඩනයට අදාළ අභියාචනය මහාධිකරණයේ විභාග වෙමින් පවතී.

#### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව බී.ඒ. ජයසේකර සහ තවත් අය 8 දෙනෙක් (නඩු අංක S/64721/2006)

නවලෝක රෝහල් සමාගමේ කොටස් සඳහා ව්‍යාජ වෙළෙඳපොළ තත්ත්වයක් නිර්මාණය කිරීමේ චෝදනාව සම්බන්ධයෙන් චූදිතයන් නව දෙනෙකුට එරෙහිව මෙම නඩුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පනවා තිබුණි.

කොමිෂන් සභාව විසින් ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත එක් චූදිතයෙකුට එරෙහිව චෝදනා ඉල්ලා අස්කර ගන්නා ලද අතර, චූදිතයන් හත් දෙනෙකුට එරෙහිව පැවති චෝදනා සම්බන්ධයෙන් නඩු කටයුතු සමථයකට පත් කරන ලදී.

නඩුවේ නමවන විත්තිකරුට එරෙහිව මෙම නඩුව පසුගිය වසරේ විභාග වෙමින් පැවති අතර, එම විත්තිකරුගේ අභියාචනා සලකා බලා එම වරද රුපියල් මිලියන 1.1 කට සමථයට පත් කරන ලදී. එම මුදල සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැර කිරීමට යෙදුණි.

### පී.බී. සංජීව මිහිර කුමාර සහ පී.බී. සුජිත් සමීර කුමාර එරෙහිව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ තවත් අය (නඩු අංක CA (W) 265/2013)

තම කොටස් තැරැව්කාර සමාගම සහ ආන්තික සැපයුම්කරු විසින් සිය අභිවෘද්ධිය ගැන නොසලකමින් සිය ආන්තික සැපයුම් ගිවිසුම් ක්‍රියාත්මක කර තමන්ගේ මිලියන 20 ක් පමණ වටිනා කොටස් එකතුව ශූන්‍ය වටිනාකමකට පත් කර ඇති බවට චෝදනා කරමින් එම පුද්ගලයන් හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට එරෙහිව ආයෝජකයින් දෙදෙනෙකු විසින් මෙම නඩුව අභියාචනාධිකරණයේ ගොනු කර ඇත.

පසුගිය වසරේ දී සියලු වග උත්තරකරුවන් විසින් මෙම නඩුවේ සිය විරෝධතා ගොනු කළ අතර, ඊට පිළිතුරු වශයෙන් පෙත්සම්කරු විසින් සිය ප්‍රති විරෝධතා ගොනු කළ අතරතුර පෙත්සම්කරු විසින් මෙම නඩුව ඉල්ලා අස්කර ගැනීම නිසා අධිකරණය විසින් නඩුව නිෂ්ප්‍රභා කරන ලදී.

මේ අතරතුර කොටස් තැරැව්කාර සමාගම සහ ආන්තික සැපයුම්කරු විසින් කොමිෂන් සභා පනතේ විධිවිධාන කඩ කර ඇත්දැයි සොයා බැලීමට කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදුකරමින් පවතී

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එදිරිව මිරමාර් බීච් හෝටෙල්ස් පී එල් සී සහ තවත් අය - මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක (S/72082/2010 සහ S/72083/2010)

මිරමාර් බීච් හෝටෙල්ස් පී එල් සී සමාගමේ 2008 මාර්තු 31 සහ 2009 මාර්තු 31 යන දිනයන්ගෙන් අවසන් වන මූල්‍ය වර්ෂ සඳහා අදාළ වාර්ෂික වාර්තා කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් නොකිරීමෙන්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ රීති අංක 3(1) සහ 17 කඩ කිරීමේ හේතුව මත මිරමාර් බීච් හෝටෙල්ස් පී එල් සී සමාගම සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව කොමිෂන් සභාව විසින් 2010 නොවැම්බර් මස 04 වන දින කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කරන ලදී.

මිරමාර් බීච් හෝටෙල්ස් පී එල් සී විසින් 2014 වසරේ දී, එම සමාගමේ 2008 මාර්තු 31 සහ 2009 මාර්තු 31 යන දිනයන්ගෙන් අවසන් වන මූල්‍ය වර්ෂ සඳහා අදාළ විගණන මූල්‍ය වාර්තා පමණක් කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම නඩුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ තව දුරටත් කැඳවනු ලැබේ.

### ශ්‍රේෂ්ඨාධිකරණ මානව හිමිකම් නඩු අංක 191/2009 (සෙලින්කෝ ඉන්ෂුවරන්ස් එම්ප්ලොයී ෂෙයා ඕනෂිප් ට්‍රස්ට් (CIESOT) සම්බන්ධ නඩුව)

ඉහත නඩුව විභාගයට ගත් අවස්ථාවේදී සෙලින්කෝ ඉන්ෂුවරන්ස් එම්ප්ලොයී ෂෙයා ඕනෂිප් ට්‍රස්ට් හි ස්වභාවය හා එමගින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත සහ ඒ යටතේ පනවා ඇති රීති කඩ වී ඇතිදැයි විමර්ශනය කර වාර්තා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට නියෝග කරන ලදී. ඒ අනුව විමර්ශනය සිදු කර අදාළ වාර්තාව ශ්‍රේෂ්ඨාධිකරණයට කොමිෂන් සභාව විසින් නීතිපතිතුමා මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදී.

මීට අමතරව අධිකරණය මගින් **PICTET & CIE** සහ **CIESOT** ට අයත් සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී එල් සී හි කොටස් වෙළෙඳාම් කිරීම වැළැක්වීමට තහංචි පනවා නියෝග සිදු කරන ලදී. මේ අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ සහ මධ්‍යම තැන්පතු ක්‍රමය එකී නියෝග ක්‍රියාත්මක කරනු ලැබුවේ ද යන්න කොමිෂන් සභාව විසින් සොයා බලනු ලැබූ අතර, ඒ සම්බන්ධව ගරු අධිකරණයට කරුණු වාර්තා කරන ලදී.

### ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී ගණන් බේරා වසා දැමීමේ නඩුව (නඩු අංක CHC/31/2013/CO) හි කොමිෂන් සභාව විසින් මැදිහත්වීම.

ටව්වුඩ් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී සමාගමේ තැන්පත්කරුවෙකු විසින් ඔහුට ගෙවීමට පැහැර හැර ඇති මුදල් ලබා ගැනීම සඳහා එම සමාගම ගණන් බේරා වසා දැමීමට කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කරන ලදී.

කොමිෂන් සභාව විසින් මෙම නඩුවේ මැදිහත් වෙමින් ආයෝජකයන්ගේ සුභ සිද්ධිය උදෙසා කොමිෂන් සභාව විසින් ගත් පියවර පිළිබඳ අධිකරණයට දන්වා සිටින ලද අතර, කොමිෂන් සභාව විසින් සිදු කරන ලද විමර්ශනයේ විමර්ශන වාර්තාවේ උද්ධෘත අධිකරණයේ ගොනු කරන ලදී.

මීට අමතරව කොමිෂන් සභාව විසින් ගන්නා ලද පහත පියවර පිළිබඳ අධිකරණය දැනුවත් කරන ලදී.

- කොමිෂන් සභාව විසින් එකී සමාගමේ අධ්‍යක්ෂවරුන් සහ සමහර නිළධාරීන් වෙත නඩුකර පැවරීමේ දැන්වීම් යවා ඇති බව.
- අතුරු මූල්‍ය වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා වෙළෙඳාම් තහංචි පැනවීම, සහ
- සිය ජංගම නොවූ වත්කම් අන්සතු කිරීම වළක්වමින් පනවා තිබූ නියෝගය නැවත පැනවීම.

කොළඹ වාණිජ මහාධිකරණය විසින් සියලු පාර්ශවකරුවන්ගේ කරුණු ඉදිරිපත් කිරීම් හා ලිඛිත දේශනවලින් අනතුරුව 2014 ජූනි මස 05 වන දින එකී සමාගම ඈවර කිරීම සඳහා ඈවරකරුවකු පත් කරන ලදී.

### බලාත්මක කිරීමේ කටයුතු

බලාත්මක කිරීමේ කටයුතු කොමිෂන් සභාවේ තීරණය හා මෙහෙයවීම මත සිදු කෙරේ.

### ආයෝජකයන් වෙත වන්දි ප්‍රදානය

ලැයිස්තුගත පොදු සමාගමක් විසින් සමාගම් අත්කර ගැනීම් සහ ඒකාබද්ධවීම් රීති සංග්‍රහයේ ප්‍රතිපාදන කඩකිරීම හේතුවෙන් අයහපත් ලෙස බලපෑමට ලක් වූ ආයෝජකයන් වෙත වන්දි ප්‍රදානය කරන ලෙස කොමිෂන් සභාව විසින් විධානය කරන ලදී. මේ අනුව දළවශයෙන් රු. 1,227,761/- ක මුදලක් වන්දි ලෙස එකී ලැයිස්තුගත සමාගම විසින් ආයෝජකයන්ට ප්‍රදානය කරන ලදී.

### වරද සමථයට පත්කිරීමෙන් ලද මුදල්

චූදිතයෙකු සිදු කළ අභියාචනයක් සලකා බැලීමෙන් අනතුරුව එම ආයෝජන උපදේශකවරයාට එරෙහිව වෙළෙඳපොළ/ මිල පිළිබඳ ව්‍යාජ තත්ත්වයක් නිර්මාණය කිරීමට කුමන්ත්‍රනය කිරීමට එරෙහිව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පැවති නඩුවක් රුපියල් මිලියන 1.1 ක දඩයකට යටත්ව, කොමිෂන් සභාව විසින් සමථයකට පත් කරන ලදී. මීට පෙර මෙම නඩුවේ දෙදෙනෙකුට එරෙහිව නඩුව සමථයකට පත්කර තිබූ හෙයින් ගරු මහේස්ත්‍රාත්තුමාගේ එකඟතාවය මත මෙකී සමථය සිදුකරනු ලැබූ අතර අදාල මුදල කොමිෂන් සභාවේ වන්දි අරමුදලට බැරකරන ලදී.

# මෙහෙයුම් සමාලෝචනය

### ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරයකුට අවවාද කිරීම

සංවේදී කාල වකවානුවක් යැයි සැක කළ හැකි අවස්ථාවක දී සමාගමක අධ්‍යක්ෂවරයෙකුව සිටිමින් එහි කොටස් මිල දී ගැනීම සම්බන්ධයෙන් සමාගමක අධ්‍යක්ෂවරයෙකුට අවවාද කිරීමක් සිදු කරන ලදී. එහිදී කොමිෂන් සභාව විසින් එම මිල දී ගැනීමට අදාළ කරුණු, එම වරද ලඝු කරන කාරණා, ඔහු විසින් සිදු කළ ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගන්නා ලදී.

### නඩුකර පැවරීමේ දැන්වීම්

**අනාවරණ සිදු නොකිරීම සහ වෙළෙඳපොළ/මිල පිළිබඳ ව්‍යාජ තත්ත්වයක් නිර්මාණය කිරීමට එරෙහිව ලැයිස්තුගත පොදු සමාගමක අධ්‍යක්ෂවරුන් සහ නිලධාරීන්ට නඩුකර පැවරීමේ දැන්වීම් යැවීම.**

කොමිෂන් සභාවේ විමර්ශනයෙන් අනාවරණය වූ කරුණු අනුව ලැයිස්තුගත පොදු සමාගමකට හා එහි අධ්‍යක්ෂවරුන් හා නිලධාරීන් වන පුද්ගලයන් විසි දෙනෙකුට එරෙහිව නඩුකර පැවරීමේ දැන්වීම් කොමිෂන් සභාව විසින් යවන ලදී. මේ අනුව මෙම කාරණය කොමිෂන් සභාව විසින් ඒ හා සම්බන්ධව උපදෙස් හා නිසි ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබ ඇත.

**ලැයිස්තුගත පොදු සමාගමක කොටස් සම්බන්ධයෙන් වෙළෙඳපොළ/ මිල පිළිබඳ ව්‍යාජ තත්ත්වයක් නිර්මාණය කිරීම සහ/ හෝ එම කොටස්වල අභ්‍යන්තර වෙළෙඳාමේ යෙදීමට එරෙහිව එම සමාග මේ අධ්‍යක්ෂවරුන්ට නඩුකර පැවරීමේ දැන්වීම් යැවීම.**

ලැයිස්තුගත පොදු සමාගමක කොටස් සම්බන්ධයෙන් වෙළෙඳපොළ/ මිල පිළිබඳ ව්‍යාජ තත්ත්වයක් නිර්මාණය කිරීම සහ/ හෝ එම කොටස්වල අභ්‍යන්තර වෙළෙඳාමේ යෙදීමට එරෙහිව එම සමාග මේ අධ්‍යක්ෂවරුන් 03 දෙනෙකුට එරෙහිව නඩු පැවරීමට කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. මේ අනුව නඩු පැවරීම සඳහා මෙම කරුණ නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

**ලැයිස්තුගත පොදු සමාගමක කොටස්වල වෙළෙඳපොළ / මිල තත්ත්වය පිළිබඳ ව්‍යාජ තත්ත්වයක් ඇති කිරීමට එරෙහිව ආයෝජකයන් දෙදෙනෙකුට එරෙහිව නඩුකර පැවරීමේ දැන්වීම් යැවීම.**

ලැයිස්තුගත පොදු සමාගමක කොටස්වල වෙළෙඳපොළ / මිල තත්ත්වය පිළිබඳව ව්‍යාජ තත්ත්වයක් ඇති කිරීම සම්බන්ධයෙන් සැක කටයුතු ආයෝජකයන් දෙදෙනෙකුට කොමිෂන් සභාව විසින් නඩුකර පැවරීමේ දැන්වීම් යවන ලද අතර, මේ කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභා රීති 12 යටතේ නඩු පැවරීම සඳහා කොමිෂන් සභාව විසින් නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබ ඇත.

### 1995 සමාගම් අත්කර ගැනීම් සහ ඒකාබද්ධවීම් රීති-සංග්‍රහය කඩ කිරීමට එරෙහිව අනතුරු ඇඟවීම් සිදු කිරීම.

තමන් විසින් අත්කර ගැනීමට සූදානමක් තිබූ සමාගමක කොටස්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අවසරයකින් තොරව විකුණා දමමින්, 1995 සමාගම් අත්කර ගැනීම් සහ ඒකාබද්ධවීම් රීති සංග්‍රහය කඩ කිරීමට එරෙහිව කොමිෂන් සභාව විසින් ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂ මන්ඩලයට අනතුරු ඇඟවීමක් (warning) සිදු කරන ලදී.

එම බලාත්මක කිරීමේ කටයුත්ත පිළිබඳ තීරණය කිරීමේ දී එම විකිණීමෙන් අනතුරුව සිදු කළ නියාමන ක්‍රියාමාර්ග, වත්මන් තත්ත්වයට (status quo) ගෙන ඒමට සමාගම දුන් සහයෝගය සහ එකී විකිණීමෙන් අහිතකර ලෙස බලපෑමට ලක් වූ ආයෝජකයන්ට වන්දි ප්‍රදානය කිරීමෙන් එකී බලපෑමේ අහිතකර තත්ත්වය නැති කිරීම ආදී කරුණු කොමිෂන් සභාව විසින් සලකා බලන ලදී.

සිය සමාගමේ කොටස් හිමියන් වෙත 1995 සමාගම් අත්කර ගැනීම් සහ ඒකාබද්ධවීම් රීති සංග්‍රහය යටතේ ඉටුවිය යුතු වගකීම් කඩකිරීම නිසා තවත් ලැයිස්තුගත සමාගමක අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියාකල පුද්ගලයින් හතර දෙනෙකුට අනතුරු ඇඟවීම් (warning) සිදු කරන ලදී.

### අයුතු ක්‍රියා පිළිබඳ තීරණ ප්‍රසිද්ධ කිරීම

1995 අත්කර ගැනීම් සහ ඒකාබද්ධවීම් රීති - සංග්‍රහයේ රීති 12(1) හා 13(2) වගන්ති කඩ කිරීම මගින් සිය සමාගමේ කොටස් හිමියන් වෙත තිබූ නීතිමය බැඳීමට එරෙහිව ක්‍රියා කිරීම නිසා එම ක්‍රියාව සම්බන්ධයෙන් ලැයිස්තුගත සමාගමකට එරෙහිව අයුතු ක්‍රියා පිළිබඳ තීරණ ප්‍රසිද්ධ කිරීමක් කොමිෂන් සභාව විසින් සිදු කරන ලදී.

**තැප්‍රොබේන් සෙකියුරිටීස් (පුද්ගලික) සමාගම විසින් ද ෆිනෑන්ස් ලැයිස්තුගත පොදු-සමාගමේ කොටස් සම්බන්ධයෙන් සිදු කළ වෙළෙඳාම්වලට අදාළව සිදු කළ විමර්ශනය පිළිබඳව ගරු නීතිපතිවරයාගෙන් ලැබීමට නියමිත නීති උපදෙස**

මෙම විමර්ශන වාර්තාවේ සොයා ගැනීම් මත කොමිෂන් සභාව විසින් 2012 දී ඇසීමට යෙදුණු විශේෂිත කාරණා සම්බන්ධයෙන් නියමිත නීති උපදෙසට අදාළව සිහි කැඳවීම් කිහිපයක් නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.

### කඩකල පුවරුව

සිය වාර්ෂික වාර්තා සහ විගණනය කළ මූල්‍ය වාර්තා කොළඹ කොටස් හුවමාරුව වෙත ලබා නොදීමේ වරදට ලැයිස්තුගත සමාගම් දෙකක වෙළෙඳාම් එම සමාගම් විසින් ඉදිරියට පවත්වාගත යුතු ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතා (continuing listing requirements) පිළිපදින තුරු කොමිෂන් සභාව මගින් අත්හිටවනු ලැබිය. එම ලැයිස්තුගත සමාගම් වනුයේ, ටච්වුඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී සහ මිරමා බීච් හොටෙල් පී එල් සී.

මීට අමතරව කඩකල පුවරුව වෙත මාරු කරනු ලැබ ඇති පහත සමාගම්වල කටයුතු පිළිබඳව කොමිෂන් සභාව විසින් ඉතා පරීක්ෂාවෙන් පසු වේ.

- ලංකා සිමෙන්ට් පී එල් සී
- සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී
- හුවාපේ ඉන්ටර්නැෂනල් ඉන්වෙස්ට්මන්ට්ස් පී එල් සී
- පීසී හවුස් පී එල් සී
- පීසී ෆාමා පී එල් සී
- පීසීඑච් හෝල්ඩිංග්ස් පී එල් සී

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ අංශය

ඉතිරිකිරීම් ඵලදායී දිගුකාලීන ආයෝජන බවට පත්කර ගැනීමට අවස්ථාව සළසා දෙනුයේ ප්‍රාග්ධන වෙළෙඳපොළ වන අතර එය රටේ හදවත ලෙසද හඳුන්වනු ලබයි. ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ එහි අරමුණු අනුව තවදුරටත් ඉදිරියට යමින් වසර තුල ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පහත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයන ලදී.

### 1. මධ්‍යම ප්‍රතිපාර්ශව ආයතනයක් පිහිටුවීම

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි යටිතල පහසුකම් දියුණු කිරීම වේගවත් කිරීමට අදාළව සියලුම මූල්‍ය වෙළෙඳපොළ ගණුදෙනු ආවරණය වන පරිදි එනම් කොටස්, රාජ්‍ය සුරැකුම්පත්, සාංගමික ණයකර සහ ව්‍යුත්පන්න සුරැකුම්පත් වෙළෙඳාමට අදාළ ඵලදායී

අවදානම් කළමනාකරණය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. මීට අදාළව ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා උපදේශක සේවාවක් සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවක් ලබා ගැනීමට තීරණය කළ අතර, ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා සියලුම පාර්ශවකරුවන් නියෝජනය වන පරිදි ඇගයුම් කමිටුවක් ද පත් කරන ලදී. මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය හිමිව ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සභාපති සහ කොළඹ කොටස් හුවමාරුවේ සභාපතිගෙන් සැදුම්ලත් මෙහෙයුම් කමිටුව වෙතයි.

මේ වෙනුවෙන් දේශීය හා අන්තර්ජාතික මාධ්‍යවල කැමැත්ත ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කළ අතර, ඒ සඳහා පාර්ශව 15 කින් පිළිතුරු ලැබිණි. එයින් පාර්ශව 7 ක් අපේක්ෂකයන් තෝරා ගැනීමේ කෙටි ලේඛනයට ඇතුළත් කරන ලද අතර, ඔවුන් ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම් කරන ලදී. තව දුරටත් කරන ලද දීර්ඝ ඇගයීම්වලට අනුව අවසාන ඇගයීමට සහ තෝරා ගැනීමට පෙර පාර්ශව 3 ක් එනම්, **Bourse Consult LLP, Oliver wyman** සහ **BTA Consult Ltd** අපේක්ෂකයන් තෝරා ගැනීමේ කෙටි ලේඛනයට ඇතුළත් කරන ලදී. පසුව එම තෝරා ගත් අපේක්ෂකයන් අදාල ව්‍යාපෘති ඉටු කළ ආකාරය ස්වාධීනව අධීක්ෂණය කළ අතර, ඒ සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඇගයීම සඳහා ඇගයුම් කමිටුව විසින් අවම වශයෙන් අපේක්ෂකයන් සඳහන් කර තිබූ එක් ආයතනයකට හෝ යන ලදී. ඉන්පසුව මධ්‍යම ප්‍රතිපාර්ශව ක්‍රියාවලිය පිළිබඳව ඇති පුළුල් දැනුම සහ පරිණත මධ්‍යම ප්‍රතිපාර්ශවීය ක්‍රමයක් ස්ථාපනය කිරීමේ ප්‍රායෝගික අත්දැකීම සලකා බලා එම ව්‍යාපෘතිය ප්‍රාග්ධන වෙළෙඳපොළ ආශ්‍රිත ව්‍යාපෘතිවලට ප්‍රමුඛව උපදේශන සේවා සපයන එක්සත් රාජධානියේ පිහිටුවා ඇති **BTA Consulting Ltd** ආයතනයට ලබා දෙන ලදී.

මේ සඳහා **BTA** ආයතනය සමග ව්‍යාපෘති සම්බන්ධතාවය ගොඩනගා ගැනීම කොළඹ කොටස් හුවමාරුවට පැවරීමට තීරණය කළ අතර, එයට අදාළ නෛතික ලියවිලි සහ එකඟතාවයන් ද ඔවුන් දෙපළ විසින් අත්සන් කරනු ඇත. මෙයට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ අතර එක් එක් ආයතනයන් විසින් ඉටු විය යුතු වගකීම් සහ යුතුකම් සඳහන් කරමින් ත්‍රී පාර්ශවික එකඟතාවයක් ද අත්සන් කෙරෙනු ඇත. ව්‍යාපෘතිය 2015 වර්ෂයේ දී ආරම්භවීමට නියමිතය.

මෙම ව්‍යාපෘතියේ විෂය පථයට අදාළ වන්නේ දැනට පවතින නිෂ්කාශණය සහ ගණුදෙනු පියවීමේ යාන්ත්‍රණය සමාලෝචනය කිරීම සහ ඉටුවිය යුතු හිඩැස් හඳුනා ගැනීම, අන්තර්ජාතිකව පිළිගත් සම්මුතීන්වලට එනම් සුරැකුම්පත් කොමිෂන් සභා සම්බන්ධව කටයුතු කරන අන්තර් ජාතික ආයතනය **(IOSCO)** සහ අන්තර්ජාතික ගණුදෙනු පියවීමේ ආයතනය **(BIS)** විසින් ප්‍රකාශිත මූලධර්මවලට අනුගතව ව්‍යාපාරික, ක්‍රියාන්විත, නෛතික, අවදානම් කළමනාකරණය, මූල්‍ය, බදු සහ තොරතුරු තාක්ෂණය යන අංශවලට අදාළ විශිෂ්ට ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීමයි.

**BTA** ආයතනයට ලබා දී ඇති විෂය පථයට අදාළව ව්‍යාපෘතියේ අරමුණු පහත සඳහන් වේ. තවද ව්‍යාපෘති අරමුණු එකී සඳහන් අයිතමවලට අදාළ වන නමුත් එයටම සීමා නොවේ.

- ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළට අදාළ නීතිරීති, තොරතුරු තාක්ෂණය ක්‍රියාන්විත අංශයන්වලට අදාළව පරිණත මධ්‍යම ප්‍රතිපාර්ශවීය ක්‍රමයක් එකඟ වී ඇති කාල පරාසය සහ ඇස්තමේන්තුගත වියදමට අනුකූලව ස්ථාපනය කිරීම.
- මධ්‍යම ප්‍රතිපාර්ශවීය ක්‍රමය සඳහා මූල්‍ය ආකෘතිය සහ අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය නිර්මාණය කිරීම.
- මධ්‍යම ප්‍රතිපාර්ශවීය ක්‍රමය පිහිටුවීම සඳහා ඒ සම්බන්ධ නෛතික කරුණුවලට අදාළ සංශෝධනයන් හඳුනා ගැනීම සහ නෛතික ව්‍යුහය නිර්දේශ කිරීම.
- ගණුදෙනු නිෂ්කාශණය සහ පියවීමේ යාන්ත්‍රණවල සවිමත් බව වැඩි කිරීම තුළින් ආයෝජකයන්ගේ විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම.
- ශ්‍රී ලාංකික මූල්‍ය වෙළෙඳපොළේ ආයෝජනය කළ හැකි තත්ත්වයන් වැඩි දියුණු කිරීම මගින් කොටස් වෙළෙඳපොළේ ක්‍රියාකාරීත්වය දිරිමත් කිරීම.

මධ්‍යම ප්‍රතිපාර්ශව ක්‍රමයට අදාළව නෛතික ව්‍යුහය සහ ගණුදෙනු පියවීමේ යාන්ත්‍රණය නිර්දේශ කරමින්, **BTA Consulting Ltd** විසින්, ආරම්භක වාර්තාවක්, **(inception report)** 2015 වසරේ මැයි මස තුළ දී ලබා දීමට නියමිතව ඇත. තවද, **BTA** ආයතනයේ නිර්දේශයන් මෙහෙයුම් කමිටුව සහ කොමිෂන් සභාව විසින් අනුමත කළ යුතුව ඇත. එම අනුමැතීන් ලබා ගත් පසුව ව්‍යාපෘති කාර්යයන් සමාන්තරව ආරම්භ කළ හැකිය. යෝජිත ව්‍යාපෘතිය ස්ථාපනය කිරීමට ඉලක්ක කර ඇත්තේ 2016 හතරවන කාර්තුවෙහි ය.

### (2) සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය කිරීම.

සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ සංවර්ධනය කිරීම උදෙසා ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ අංශය විසින් ප්‍රකාශයට පත් කළ යෝජනා සහ ප්‍රධාන ආරම්භක පියවරයන් හේතු කොට ගෙන සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තුළින් 2013 සහ 2014 වර්ෂවල අරමුදල් රැස් කිරීම ආකර්ෂණීය ලෙස වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් සාංගමික ණයකර මත පනවා තිබූ රඳවා ගැනීමේ බද්ද රජය විසින් ඉවත් කිරීම ද හේතු විය. ඒ අනුව 2013 වසරේ රු. බිලියන 68.3 ක අරමුදල් ප්‍රමාණයක් ද 2014 වසරේ දී රු. බිලියන 49.1 අරමුදල් ප්‍රමාණයක් ද රැස් කර ගන්නා ලදී.

සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තව දුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් මෙම අංශය විසින් කොළඹ කොටස් වෙළෙඳපොළේ දායකත්වය ද සමගින් වෙළෙඳපොළ තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් ප්‍රතිපත්ති පත්‍රිකාවක් ද සකස් කරන ලදී.

එහි සඳහන් ප්‍රධාන තීරණයන් පහත පරිදිය.

- ප්‍රාථමික වෙළෙන්දන් සහ අනෙකුත් වෙළෙඳපොළ අතරමැදියන් හට සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ තුළ වෙළඳාමේ නියැලීමට අනුමැතිය ලබාදීම් (මේ වන විට ප්‍රාථමික වෙළෙන්දන් අට දෙනෙකු කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වෙළඳ සාමාජිකත්වය ලබා ගෙන ඇත.)

## මෙහෙයුම් සමාලෝචනය

- කොටස් නිකුත් කිරීමේ නියුතු ආයතනවලට සාංගමික බැඳුම්කර වෙළෙඳපොළට පහසුවෙන් ඇතුළත්වීම සඳහා කොටස් නිකුත් කිරීමේ කාර්යය සහ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමේ කාර්යභාරය පහසු සහ ප්‍රමිතිගත කිරීම.

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අනුමත කරන ලද සුදුසුකම් ද ඇතුළත්ව, සාංගමික බැඳුම්කර වෙළෙඳාමට ප්‍රවිශ්ට වීමට අවශ්‍ය සුදුසුකම් ආකෘතියක් පිළියෙල කිරීම.

- වෙළෙඳාම් සහ වාර්තාගත කිරීම්වල ගුණාත්මකභාවය හා යටිතල පහසුකම් වර්ධනය කිරීම.

- පරිණත මධ්‍යම ප්‍රතිපාර්ශවීය ආයතනයක් ස්ථාපිත කිරීම. (Central Counter party frame work)

- සුළු පරිමාණ ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා සාංගමික බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවශ්‍ය අවම දායක මුදල රු. 10,000 ට සීමා කිරීම.

- සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි දැනුම බෙදා දීමේ වැඩසටහන්වලට සාංගමික බැඳුම්කර පිළිබඳ දැනුම ඇතුළත් කිරීම.

- සාංගමික බැඳුම්කර සඳහා ප්‍රති මිල දී ගැනීමේ අවස්ථා සැලසීම.

- ණය ප්‍රමාණීකරණ නියෝජිත ආයතන සඳහා පොදු හෙළිදරව් කිරීමේ ක්‍රමවේදයක් නිකුත් කිරීමේ විස්තර ප්‍රකාශ පත්‍රයේ අන්තර්ගත කිරීම.

  මෙයට අදාළ පොදු හෙළිදරව් කිරීමේ ක්‍රමවේදයක් මෙම ව්‍යාපාරයේ නියුතු ආයතනවල දායකත්වය ද සමග සකස් කර ඇති අතර, ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනෙනු ඇත.

- සමස්ථ සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ දියුණු කිරීමේ අරමුණින් ලැයිස්තුගත නොකළ සාංගමික බැඳුම්කරවල තොරතුරු මහජනයාට ලබාදීම සඳහා ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ ආයතනයේ රෙජිස්ට්‍රාර් ජනරාල් සමග කටයුතු කරන ලදී. ඒ අනුව රු. මිලියන 100 ට වැඩි කොටස් නිකුතුවලට අදාළ විස්තර සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලබාදීමට කටයුතු කෙරෙනු ඇත.

### (3) ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළට විදේශ ආයෝජන ආකර්ශණය කර ගැනීම.

විදේශ ආයෝජන ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඇති ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන අවස්ථා විදහා දැක්වීමේ අරමුණින් 2014 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව පහත සඳහන් ආයෝජන සම්මන්ත්‍රණ පවත්වන ලදී.

**සිංගප්පූරුවේ පැවති ආයෝජන සම්මන්ත්‍රණය**

පූර්ව ආයෝජන සමුළුව සිංගප්පූරුවේ ඇති ශ්‍රී ලංකා ව්‍යාපාරික සමුළුවේ සහයෝගයෙන් 2014 ජනවාරි 20 වන දින සිංගප්පූරුවේ Tower Club හිදී පැවැත්විණි. ඒ සඳහා නියෝජිතයන් 79 ක් සහභාගී වූ අතර, ඉන් 41 ක් ශ්‍රී ලාංකිකයන් විය.

ප්‍රධාන ආයෝජන සමුළුව සිංගප්පූරුවේ Ritz Carlton හෝටලයේ ජනවාරි 21 වන දින පැවැත්විණි. ඒ සඳහා නියෝජිතයන් 214 ක් ලියාපදිංචි වූ අතර, 187 දෙනෙක් සහභාගී විය. ඒ අතර, අරමුදල් කළමනාකරුවන්, ආයෝජන බැංකුකරුවන් සහ ආයෝජන විශ්ලේෂකවරුන් ද ඇතුළත් විය.

**ලන්ඩන්හි පැවති ආයෝජන සමුළුව**

මෙම ආයෝජන සමුළුව, ලන්ඩන් කොටස් වෙළෙඳපොළ සහ Bloomberg හි දායකත්වය සමගින් Savoy හිදී 2014 මැයි 30 දින පැවැත්විණි. ඒ සඳහා නියෝජිතයන් 152 ක් ලියාපදිංචි වූ අතර, 138 දෙනෙක් සහභාගී විය. එයට එක්සත් රාජධානියේ අරමුදල් කළමනාකරුවන්, ආයෝජන බැංකු නියෝජිතයින් සහ ආයෝජක විශ්ලේෂකයන් ද ඇතුළත් විය. එහිදී ශ්‍රී ලාංකික නියෝජිත පිරිස ලන්ඩන් කොටස් වෙළෙඳපොළ ආරම්භ කිරීමේ උත්සවයටත් සහභාගී විය.

**මහ කොමසාරිස් කාර්යාලයේ පැවති සුහද හමුව**

2014 මැයි 29 වන දින බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයේ දී බ්‍රිතාන්‍ය මත නායකයන් (opinion leaders) සඳහා සුහද හමුවක් පැවතිණ. මේ සඳහා බ්‍රිතාන්‍ය ජාතිකයන් 40 පමණ සහභාගී විය.

**නිව්යෝර්ක් හි පැවති ආයෝජක සමුළුව**

සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වොෂින්ටන්හි ශ්‍රී ලංකා මහ කොමිෂන් කාර්යාලය සහ ඇමරිකාවේ වාණිජ මණ්ඩලය සමඟ එක්ව අදාල ආයෝජන සමුළුව 2014 සැප්තැම්බර් 4 වන දින J.W. Marriot Essex House හෝටලයේ දී සාර්ථකව පවත්වනු ලැබීය. ඒ සඳහා නියෝජිතයන් 194 දෙනෙකු ලියාපදිංචි වූ අතර, ඉන් 146 දෙනෙකු සමුළුවට සහභාගී විය. ඒ අතර අරමුදල් කළමනාකරුවන් සහ විශ්ලේෂකයන් ද ඇතුළත් වේ.

**ශ්‍රී ලංකාවේ කොළඹ දී පැවති ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්මන්ත්‍රණය**

මෙම සම්මේලනය ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ අධ්‍යාපනය සහ බාහිර සම්බන්ධතා අංශය සහ කොළඹ කොටස් වෙළෙඳපොළ සමඟ එක්ව සංවිධානය කරන ලදී.

එය 2014 ඔක්තෝම්බර් 9 වන දින කොළඹ Cinnamon Lakeside හෝටලයේ දී පැවැත්විණි.

සම්මන්ත්‍රණය සඳහා ලියාපදිංචි වූ සාමාජිකයන් 85 අතරින් 71 ක් අන්තර්ජාතික අරමුදල් කළමනාකරුවන් වූ අතර ඔවුන් මහා බ්‍රිතාන්‍ය, ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විස්ටර්ලන්තය, ඉන්දියාව, සිංගප්පූරුව, තායිලන්තය, පකිස්ථානය, හොංකොං, නෙදර්ලන්තය, ඩුබායි, බහරේන්, ඉන්දියාව, ජපානය, මාලදිවයින, ජර්මනිය යන රටවල් නියෝජනය කරන ලදී.

### ආයෝජන සමුළු පැවැත්වීමෙන් පසු කොළඹ කොටස් වෙළෙඳපොළේ විදේශ ආයෝජන කටයුතුවල විශ්ලේෂණය

මේ සඳහා ආයෝජන සමුළු පැවැත්වීමෙන් පසු විදේශ ආයෝජනවලට අදාළ තොරතුරු කොළඹ කොටස් වෙළෙඳපොළින් ලබා ගන්නා ලදී.
එම දත්ත විශ්ලේෂනයට අනුව විදේශ ආයෝජකයන් විසින් මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි ගිණුම් රාශියක් විවෘත කර තිබූ අතර, විදේශ ආයෝජන වෙළෙඳ කටයුතු ද ආකර්ශණීය ලෙස වර්ධනය වී තිබුණි. (සංඛ්‍යා සටහන 11)

**සංඛ්‍යා සටහන 11: විදේශ ආයෝජන සම්මේලනවලට පසුව කොළඹ කොටස් වෙළෙඳපොළ විදේශ ආයෝජන කටයුතු විශ්ලේෂණය**

| රට | ශුද්ධ ආයෝජන වටිනාකම (රු. මිලියන) 2013 සහ 2014 2013 | 2014 | නව CDS ගිණුම් ආරම්භ කිරීම් 2014 | නව CDS ගිණුම් මගින් ඇති වූ ශුද්ධ ආයෝජන වටිනාකම (රු.මිලියන) 2014 |
|---|---|---|---|---|
| ඉන්දියාව | (106.7) | **218.7** | **24** | **268.5** |
| එක්සත් අරාබි රාජධානිය | (134.9) | **43.0** | **7** | **43.8** |
| හොංකොං | (175.0) | **25.7** | **3** | **-** |
| සිංගප්පූරුව | (2,054.4) | **4,984.8** | **18** | **6,385.6** |
| මහා බ්‍රිතාන්‍ය | 101.0 | **4,332.6** | **27** | **451.6** |
| ඇමරිකා එක්සත් ජනපදය | 2,308.9 | **7,078.6** | **27** | **62.6** |

**පරිපූර්ණ අලෙවිකරණ ව්‍යාපාරය සඳහා පහසුකම් සැලසීම.**

- ඒකක භාර කර්මාන්තය වෙනුවෙන් අලෙවිකරණ ව්‍යාපාරයක් කිරීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා ගැනීම සඳහා ඒකක භාර සංගමය විසින් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඊට අදාළව වියදම් යෝජනාවක් ලබා දෙන ලෙස දන්වන ලදී.
- ඒ අනුව ඒකක භාර සංගමය විසින් වියදම් යෝජනාව කොමිෂන් සභාවට ලබා දුන් අතර, ඒකක භාර සංගමය විසින් තෝරා ගත් පාර්ශවය, යෝජිත අලෙවිකරණ ව්‍යාපාරය පිළිබඳ ඉදිරිපත් කිරීමක් ද කොමිෂන් සභාව වෙත ලබා දෙන ලදී.
- පසුව, සම්පූර්ණ කොටස් වෙළෙඳපොළම ආවරණය වන පරිදි මෙම අලෙවිකරණ ව්‍යාපාරයේ විෂය පථය පුළුල් කිරීමට කොළඹ කොටස් වෙළෙඳපොළ සමඟ තීරණය කරන ලදී.
- ඒ අනුව කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් අලෙවිකරණ ආයතන 8 න් යෝජනා කැඳ වූ අතර, ඒවා ඇගයීම සඳහා සියලුම පාර්ශවකරුවන් නියෝජනය වන පරිදි ඇගයීම් කමිටුවක් ද පත් කරන ලදී.
- දීර්ඝ විශ්ලේෂණයකින් පසුව reality show සංකල්පය සමඟ කරන ලද ආයතන යෝජනාව තෝරා ගන්නා ලදී.

**කොළඹ කොටස් වෙළෙඳපොළ අනුකරණ සහ ක්‍රීඩා ආකෘතියක් (Sbock Market simulator and games portal) නිර්මාණය කිරීමට පහසුකම් සැලසීම.**

- මේ සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශයක් සකස් කර පුවත්පත් මාධ්‍යවල ප්‍රකාශ කරන ලදී. ඒ අනුව පිළිතුරු ලෙස යෝජනා 5 ක් ලැබුණි.
- තවද මේ වෙනුවෙන් යෝජනා පිළිබඳ ඉල්ලීමක් ද සකස් කළ අතර, කොමිෂන් සභාව විසින් එය අනුමත කරන ලදී.
- එසේම මෙම ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා ජාතික (National) ප්‍රතිසම්පාදන ආයතනයේ රෙගුලාසිවලට අනුකූලව උපදේශක ප්‍රතිසම්පාදන කමිටුවක් (Consultative Procurement Committee) පත් කරන ලදී.

**නව ගණුදෙනු උපකරණ හඳුන්වාදීම.**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් වර්තමාන හා අනාගත ආයෝජකයන්ට ඉහළ ප්‍රතිලාභ රැසක් හඳුන්වාදීමටත්, ආයෝජනය කළ හැකි ගණුදෙනු උපකරණ සංඛ්‍යාව තව දුරටත් වර්ධනය කිරීමටත් පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් ප්‍රතිපත්තිමය රාමුවක් සැකසීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඒකක භාර කර්මාන්තයට අදාළව නව ඩොලර් බැඳුම්කර අරමුදල් හඳුන්වාදීමට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලද අතර, එය ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට විදේශ මුදල්වලින් ගණුදෙනු කළ හැකි ආයෝජන උපකරණයක් හඳුන්වා දුන් ප්‍රථම අවස්ථාව ද විය.

බලපත්‍රලාභී ඒකක භාර අරමුදල් කළමනාකරණ සමාගමක් වන සිලෝන් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම ඉහත කී ප්‍රථම ඩොලර් බැඳුම්කර අරමුදල හඳුන්වා දුන් ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගීකරුවා විය. මෙම අරමුදල මගින් විදේශ කොටස් වෙළෙඳපොළවල ලැයිස්තුගත කර ඇති ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල එක්සත් ජනපද ඩොලර් වලින් ආයෝජනය කළ හැකි වේ. එමෙන්ම එම ඩොලර් බැඳුම්කර අරමුදල් නිකුත් කර ඇති ආයතන ලෙස ශ්‍රී ලංකා වාණිජ බැංකු, රාජ්‍ය සමාගම් සහ එක්සත් ජනපද ඩොලර් තැන්පත් කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු හඳුන්වා දිය හැකිය.

**ලැයිස්තුගතවීමේ වාසි පිළිබඳ දැනුවත් කිරීම.**

වසර තුළ දී කොළඹ කොටස් වෙළෙඳපොළ දායකත්වය ද ඇතිව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කොළඹ කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගතවීමේ වාසි පිළිබඳ දැනුවත් කිරීම සඳහා ව්‍යාපාර ආයතන 147 ක කළමනාකාරීත්වය සමඟ සංවාදයක් ඇති කර ගන්නා ලදී. ''කොටස් වෙළෙඳපොළ ලැයිස්තුගත වීමට උපදේශයක්'' නැමැති අද්විතීය ග්‍රන්ථය / ප්‍රකාශනය නිර්මාණය කිරීම සඳහා කොළඹ කොටස් වෙළෙඳපොළට අවශ්‍ය අනුග්‍රහය ද සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ලබාදෙන ලදී. එම ග්‍රන්ථය / ප්‍රකාශනය සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම ද සම්පූර්ණ කරන ලදී. දැනුවත් කිරීම සහ ලැයිස්තුගත කිරීම පිළිබඳව පහත සමුළු වසර තුළ දී පවත්වන ලදී.

- තොරතුරු තාක්ෂණ කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයතන සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් කිරීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා ඇසෝසියේෂන් ඔෆ් සොෆ්ට්වෙයා ඇන්ඩ් සර්විස් කම්පැනීස් (SLASSCOM) සඳහා පැවැත් වූ සමුළුව.
- ව්‍යවසායකයින් සඳහා වූ මහනුවර සමුළුව

## මෙහෙයුම් සමාලෝචනය

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් සඳහා වූ පුවරුවක් නිර්මාණය කිරීමේ හැකියාව ඇගයීම සඳහා ජාතික වාණිජ මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය එක්ව සංවිධානය කළ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වූ සමුළුව

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් වෙනුවෙන් වූ සමුළුව

- කළමනාකරණ ගණකාධිකාරින්ගේ වරලත් ආයතනය (CIMA) සමඟ පැවැත් වූ අයිතිය පවුල් සතුව ඇති ව්‍යාපාර සඳහා වූ සමුළුව

### ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය කිරීමේ වෙනත් පියවර

- ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තක්සේරු පිළිබඳ සොයා බැලීම සඳහා තක්සේරුකරුවන්ගේ කමිටුවක් සැකසීමේ හැකියාව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ඇගයීමකට ලක් කරන ලදී. මෙමගින් අදාළ ගැටලු ඒ පිළිබඳ විශේෂ දැනුමක් ඇති අයගේ වැඩිදුර අවධානය සඳහා දැනුම්දීමේ හැකියාව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ලැබේ. මෙයට අදාළ සුදුසු ක්‍රමයක් නිර්මාණය කිරීම පිළිබඳව මහජන මතය ද විමසන ලදී.

- ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන අවස්ථා පුළුල් කිරීම සඳහා ''දේපළ ආයෝජන භාර'' (REITS) හඳුනාගෙන ඇගයීමකට ලක් කරන ලදී. දේශීය වෙළෙඳපොළේ දැනට පවතින අවශ්‍යතාවයන්ට ඉඩ සලසමින් සහ දේපළ ආයෝජන භාර පිළිබඳ සංකල්ප පත්‍රය සැලකිල්ලට ද ගනිමින් දේපළ ආයෝජන භාරයක් ලංකාව තුළ දියත් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මාලාවක් සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කරන ලදී.

- සුළු පරිමාණ ආයෝජකයන්ගේ අයිතිවාසිකම්, අභිරුචීන් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අපේක්ෂාවන් නියෝජනය කිරීම සඳහා සුළු ආයෝජකයන් වෙනුවෙන් සංගමයක් පිහිටුවීමට ඇති හැකියාව ඇගයීමට ලක් කරන ලදී. මේ පිළිබඳව මහජන මතය ද විමසන ලදී.

- මහජනයා සතුව පැවතිය යුතු අවම කොටස් ප්‍රමාණය ශ්‍රී ලංකා ප්‍රාග්ධන වෙළෙඳපොළට හඳුන්වා දීමත් සමඟ සමාගම් ලැයිස්තුගත වී ඇති පුවරුව නිවැරදිව නියෝජනය කිරීම පිණිස ප්‍රධාන පුවරුවේ සිට දිරිසවි පුවරුවට මාරුවීමට අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා පහසුකම් සලසන ලදී.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) සහ අනෙකුත් සහභාගීත්ව කොටස්කාර ආයතන එක්ව ආරම්භ කළ ''ශ්‍රී ලංකා තක්සේරුකරණ උපදෙස්'' නැමැති ග්‍රන්ථය / ප්‍රකාශය ප්‍රකාශයට පත් කිරීම සඳහා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව දායක වන ලදී. ලැයිස්තුගත සමාගම් මගින් කෙරෙන හෙළිදරව් කිරීම් වැඩි දියුණු කිරීම මෙම ග්‍රන්ථය / ප්‍රකාශනය මගින් බලාපොරොත්තු වේ.

- ලැයිස්තුගත සමාගම්වල යහපාලනය ඇගයීම සඳහා සුදුසු වූ වැඩපිළිවෙලක් සංවිධානය කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සමඟ සම්බන්ධ විණි. මෙම වැඩපිළිවෙළෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇති අතර, මේ මගින් ලැයිස්තුගත සමාගම් අතරින් වඩා ඉහළ මට්ටමක යහපාලනයක් සහිත සමාගම ඇගයීම තුළින් ඔවුන් වඩා දිරිමත් කිරීමක් සියලුම ලැයිස්තුගත සමාගම් ඒ සඳහා යොමු කිරීමත් මේ තුළින් අපේක්ෂා කරයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශිත මූල්‍ය සමාගම් ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙළට අදාළව ප්‍රාග්ධන වෙළෙඳපොළ රාමුවට අදාළ ආයතනයන් විසින් සැලකිලිමත් විය යුතු කරුණු සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා ඒ පිළිබඳව විමසනු ලබන ආයතන වෙත ලබාදීම වෙනුවෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් කරවීමට අදාළ ප්‍රකාශනය පිළියෙල කරවීම. මෙමගින් එම වැඩපිළිවෙලට අදාළ පාර්ශවයන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ කරුණු සම්බන්ධව මනා අවබෝධයක් ලබාදීම අරමුණු කර ගන්නා ලදී.

- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය මගින් කරනු ලබන රක්ෂණ සමාගම් බෙදා වෙන් කිරීමේ වැඩපිළිවෙල සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ රාමුවට අදාළ කරුණු පැහැදිලි කිරීම සඳහා ඒ පිළිබඳව විමසනු ලබන ආයතන වෙත ලබාදීම වෙනුවෙන් අවශ්‍ය පැහැදිලි කිරීම් කරවීමට අදාළ ප්‍රකාශනය පිළියෙල කරවීම. මෙමගින් එම වැඩපිළිවෙලට අදාළ පාර්ශවයන් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ කරුණු සම්බන්ධව මනා අවබෝධයක් ලබාදීම අරමුණු කර ගන්නා ලදී.

- ලැයිස්තුගත පොදු සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරනු ලබන විගණකවරුන්ගේ මතය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ අනුව ඉහත අරමුණට පටහැණිව කටයුතු කරන ලදැයි අනුමාන කරන විගණකවරුන් පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයට, අදාළ පියවර ගැනීම සඳහා යොමු කරන ලදී.

- සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් සහ ෆිනෑන්ස් පී. එල්. සී සමාගමේ පවතින ගැටලු සහගත වාතාවරණය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ අංශ සමඟ සාකච්ඡා පැවැත්වීම තුළින් එම සමාගමේ පවතින ගැටලු සහගත වාතාවරණය ප්‍රාග්ධන වෙළෙඳපොළට බලපාන බැවින් ඒ පිළිබඳව සාකච්ඡා මාර්ගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවධානය ප්‍රාග්ධන වෙළෙඳපොළ රාමුව වෙතට යොමු කරවීම.

- ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් ස්වාධීන ආයතන විසින් ලැයිස්තුගත සමාගම් පිළිබඳව කරන සමීක්ෂණ දිරිගැන්වීම සඳහා ස්වාධීන ආයතන යොමු කරවීමට අදාළ වැඩපිළිවෙළක් දියත් කරන ලදී. එහි ප්‍රගතියක් ලෙස S&P 20 මිල දර්ශකයට අදාළ සමාගම්වලින් ආයතන 16 ක් පිළිබඳව සමීක්ෂණ වාර්තාවන් එළි දක්වන ලදී. මෙම සමීක්ෂණ තොරතුරු කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි වෙබ් අඩවිය තුළින් මහජනතාවට ලබා ගැනීමට අවකාශ සලසා ඇත.

### ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් කරන ලද මැදිහත් වීම්

- ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි විෂය පථය පුළුල් කරමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ප්‍රාග්ධන වෙළෙඳපොළට පිවිසීම තුළින් අදාළ අරමුදල් සම්පාදනය කරවා ගැනීම සඳහා ක්‍රමවේදයක් අයවැය ප්‍රකාශනයට ඇතුළත් කරවීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත බාර දෙන ලදී.

- තවද දැනට සියලුම ලැයිස්තුගත සමාගම්වල අංශ වෙනුවෙන් ලබා දී ඇති බදු සහන වැඩපිළිවෙල වසර 2017 දක්වා තව දුරටත් දිගු කිරීමට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ලබා ගත් තොරතුරු සමඟ අයවැයට ඇතුළත් කිරීම සඳහා යෝජිත වැඩපිළිවෙල මුදල් අමාත්‍යාංශයට යොමු කරන ලදී.

- මුදල් අමාත්‍යාංශය මගින් ඉදිරිපත් කරනු ලැබූ ''ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත'' මගින් ලැයිස්තුගත සමාගම්වලට වන බලපෑම මුදල් අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලදී.

- ලෝකයේ අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ප්‍රතිරූපය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඒකාබද්ධව ''ව්‍යාපාර කිරීමේ දර්ශකය'' (Doing Business Banking) සඳහා අදාළ කරුණු දැක්වීම් කරන ලදී.

### ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන සහ පුහුණුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යයන සහ පුහුණු අංශය විසින් දැනුම සහ නිපුණතාවය ලබාදීම හරහා වෙළෙඳපොළ සහභාගීකරුවන්ගේ වෘත්තීය ප්‍රමිතිය ඉහළ නැංවීම කෙරෙහි ඉතා වැදගත් කාර්යයක් ඉටු කරන ලදී. ඊට අමතරව, ක්ෂේත්‍රයේ සිදුවන නව ප්‍රවණතාවයන් පිළිබඳව බලපත්‍රලාභී ආයෝජක උපදේශකවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා උත්සාහ දැරීය. (සංඛ්‍යා සටහන 12, 13)

### ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර (CCM) පාඨමාලාව

**සංඛ්‍යා සටහන 12: ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර (CCM) පාඨමාලාවේ සංඛ්‍යානමය සාරාංශය - (2014)**

| මාධ්‍යය | ලියාපදිංචි වූ සමස්ත සිසුන් සංඛ්‍යාව | හිමිකම් සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | ණය සුරැකුම්පත් අදියර සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | මූල්‍ය රෙගුලාසි හා ආචාරධර්ම අදියර සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | CCM සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | ලියාපදිංචි ආයෝජන උපදේශක තත්වය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| සිංහල මාධ්‍යය | 74 | 14 | 17 | 13 | 18 | 18 |
| ඉංග්‍රීසි මාධ්‍යය | 131 | 32 | 32 | 42 | 44 | 23 |
| එකතුව | 205 | 46 | 49 | 55 | 62 | 41 |

**සංඛ්‍යා සටහන 13: ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර හා ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය සඳහා පවත්වන ලද විභාග යන්හි සාරාංශය (2014)**

| වැඩසටහන | අදියර | වසර තුළ පවත්වන ලද විභාගයන් ගණන | සමත් % |
|---|---|---|---|
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 2 | 51% |
| | ණය සුරැකුම්පත් | 2 | 68% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම | 2 | 59% |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය) | හිමිකම් සුරැකුම්පත් | 4 | 60% |
| | ණය සුරැකුම්පත් | 4 | 75% |
| | මූල්‍ය රෙගුලාසි හා ආචාර ධර්ම | 4 | 67% |
| ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය (සිංහල මාධ්‍ය) | අදාළ නැත | 9 | 72% |
| ලියාපදිංචි ආයෝජන උපදේශක තත්ත්වය (ඉංග්‍රීසි මාධ්‍ය) | අදාළ නැත | 9 | 77% |

**ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DCM)**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එක්සත් රාජධානියේ, සුරැකුම්පත් සහ ආයෝජනය සඳහා වන වරලත් ආයතනය (Chartered Institute for Securities and Investments (CISI), UK) සමඟ එක්ව සංවිධානය කරන ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සලකා බලන කාල පරිච්ඡේදය තුළ ද තව දුරටත් පවත්වන ලදී. සලකා බලන කාලය තුළ එහි කණ්ඩායම් දෙකක දේශන සම්පූර්ණ කරන ලදී.

**අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් (CPD)**

දේශීය හා අන්තර්ජාතික ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ සිදු වූ මෑත කාලීන ප්‍රවණතාවයන් පිළිබඳව ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ කටයුතු කරන ආයෝජන උපදේශකවරුන් අඛණ්ඩව දැනුවත් කිරීම සඳහා සලකා බලන කාලය තුළ අවශ්‍යතාවයන්ට අනුව සැකසූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් 6 ක් පවත්වන ලදී. තැරැව්කාර ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරීන්, ආයෝජන උපදේශකවරුන්, විශ්ලේෂකවරුන් ඇතුළුව ක්ෂේත්‍රයේ නියුතු වෘත්තිකයන් 690 කට අධික පිරිසක් මෙම වැඩසටහන් සඳහා යොමු විය. කොටස් වෙළෙඳපොළ ගණුදෙනු කිරීම සඳහා ආයෝජක උපදේශකවරුන් පවත්වාගෙන යා යුතු බලපත්‍රය යාවත්කාලීන කිරීම සඳහා අවම

## මෙහෙයුම් සමාලෝචනය

වශයෙන් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් දෙකකට සහභාගී වීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් අනිවාර්යය කර ඇත. (රූප සටහන 11)

**ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය**
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයන්හි ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ විෂයන් හැදෑරීම සඳහා උපාධි අපේක්ෂකයින් දිරිගැන්වීම උදෙසා ආරම්භ කළ ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග ව්‍යාපෘතිය තව දුරටත් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයන්හි ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ අධ්‍යයන අංශයෙහි ඉහළ දක්ෂතා දක්වන උපාධි අපේක්ෂකයන්ට ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනැමීම සිදු කරයි. මෙම ව්‍යාපෘතිය යටතේ ජාතික විශ්වවිද්‍යාල 11 ක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇත.

සලකා බලන වසර තුළ පහත සඳහන් විශ්වවිද්‍යාල අතුරින් උපාධි අපේක්ෂකයින් 10 දෙනෙකු සඳහා ස්වර්ණ මුද්‍රිකා හා මුදල් ත්‍යාග පිරිනමන ලදී.

- කැලණිය විශ්වවිද්‍යාලය
- වයඹ විශ්වවිද්‍යාලය
- ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- රජරට විශ්වවිද්‍යාලය
- රුහුණු විශ්වවිද්‍යාලය
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
- යාපනය විශ්වවිද්‍යාලය
- නැගෙනහිර විශ්වවිද්‍යාලය


**ප්‍රවර්තන සහ අනාගත ආයෝජකයින් සඳහා වැඩසටහන**
ප්‍රවර්තන හා අනාගත ආයෝජකයින් උදෙසා සුරැකුම්පත් ගණුදෙනු සම්බන්ධ මූලික න්‍යායාත්මක හා ප්‍රායෝගික අවබෝධයක් ලබාදීමේ අරමුණින් වැඩසටහන් දෙකක් අප විසින් පවත්වන්නට යෙදුණි. සති හතක කාලයක් ආවරණය වන මෙම වැඩසටහන සඳහා සිසුන් 53 දෙනෙකු සහභාගී විය.

**ඒකකභාර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව**
ඒකකභාර පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව 2014 නොවැම්බර් මස දී ආරම්භ කරන ලදී. ඒකකභාර කළමනාකරණ සමාග මිහි සේවයේ නියුතු වෙළෙඳ සහ අලෙවි සේවකයින් සඳහා අවම සුදුසුකම් මට්ටමක් හඳුන්වාදීම සඳහා මෙම වැඩසටහන විශේෂයෙන් නිර්මාණය කරන ලදී. මෙම පාඨමාලාව සඳහා සහභාගිකරුවන් 26 දෙනෙකු ලියාපදිංචි විය.

### අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණු වැඩසටහන

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (CA Sri Lanka) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම**
ලැයිස්තුගත සමාගම්හි සාංගමික යහපාලනය වර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය සහ වෙනත් අවශ්‍යතාවයන් ආවරණය වන පරිදි ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය සමඟ ඒකාබද්ධව මෙම වැඩසටහනේ විෂය නිර්දේශය සකසන ලදී. මෙම වැඩසටහන හරහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ

**රූප සටහන 11: 2014 වසර තුළ පවත්වන ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන්වල විස්තර**



ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය විසින් ඒකාබද්ධව සැකසූ සාංගමික යහපාලන සංග්‍රහය සඳහා පහසුකම් සැලසීම ද අරමුණු කරයි.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය (SLID) අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුම**

ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධ කාරණාවන් සම්බන්ධයෙන් සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම උදෙසා සුරැකුම්පත් නීති සහ නියාමනය පිළිබඳව සමාගම් අධ්‍යක්ෂවරුන් පුහුණු කිරීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. මෙම අවබෝධතා ගිවිසුම මගින් සම්බන්ධිත පාර්ශව ගණුදෙනු, අත්පත් කර ගැනීම් සහ ඒකාබද්ධ වීම්, අභ්‍යන්තර තොරතුරු මත ගණුදෙනු කිරීම් යනාදී කටයුතු ආවරණය වේ. ඊට අමතරව යහපත් භාවිතයන්, ඉගැනුම් සහ සංවර්ධනයන් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම හරහා ඔවුන්ගේ වෘත්තීය අවශ්‍යතාවයන් සැපිරීමට මාර්ගය විවර කර දෙන අතර, අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීමේ සාකච්ඡාවන්හි යහපාලනය දිරිගැන්වීම සිදු කරයි.

## ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුවත් කිරීම

ආයෝජකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යභාරයකි. මෙම අරමුණ සඳහා ළඟාවීම වෙනුවෙන් ප්‍රාග්ධන වෙළෙඳපොළ හා සබැඳි ප්‍රතිලාභ සහ අවදානම් තත්ත්වයන් පිළිබඳව ආයෝජක දැනුම ඉහළ නැංවීම සඳහා විශේෂ වූ පුළුල් ආයෝජක අධ්‍යාපනික වැඩසටහන් රාශියක් අප විසින් පවත්වන ලදී. එමෙන්ම ආයෝජකයන්ට මනා දැනුවත්භාවයක් සහිතව වඩාත් නිවැරදි ආයෝජන තෝරා ගැනීමට අවශ්‍ය කරන විශේෂ පුහුණු හැකියාවන්, දැනුම සහ මෙවලම් ලබාදීමත් මෙම වැඩසටහන්වල අරමුණ විය. අපගේ ආයෝජක වැඩසටහන් විවිධ තරාතිරමේ ආයෝජක ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් නිර්මාණය වී තිබුණු අතර, විශාල පිරිසක් ආකර්ෂණය කර ගැනීමට ද සමත් විය. අප විසින් සංවිධානය කළ ආයෝජක අධ්‍යාපනික වැඩසටහන් සඳහා භාවිතා කළ ක්‍රමවේදයන් අතර පොත්පත්, අත්පත්‍රිකා සහ ලිපි ලේඛන බෙදා හැරීමත්, සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීමත් සහ විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය භාවිතා කිරීමත් ප්‍රධාන තැනක් ගන්නා ලදී.

### විද්‍යුත් මාධ්‍ය මගින් සිදු කළ දැනුවත් කිරීම

**"Going Public" රූපවාහිනී වැඩසටහන් මාලාව**

සාංගමික අංශය හා කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත කිරීමට හැකියාවක් ඇති සමාගම්වල ඉහළ පෙළේ විධායක නිලධාරීන් දැනුවත් කිරීමේ අරමුණ ඇතිව පැයක වැඩසටහන් 13 ක් ලෙස "Going Public" රූපවාහිනී වැඩසටහන් මාලාව 2014 පෙබරවාරි සිට මැයි මස දක්වා සෑම ඉරිදාවකම පෙරවරු 10 සිට ''එම් ටී වී ස්පෝර්ට්ස්'' නාලිකාව ඔස්සේ විකාශය කරන ලදී. මෙම වැඩසටහන් මාලාව මෙතෙක් විකාශය කළ පළමු පටිගත කළ වැඩසටහන ලෙස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ එක්ව ගෙන ආ වැඩසටහනකි. මෙම වැඩසටහන විවිධ මාතෘකා පිළිබඳව රූපවාහිනී මැදිරි සාකච්ඡා ස්වරූපයෙන් පවත්වන ලදී. සාකච්ඡාවට ගැණුනු මාතෘකා අතර, ලැයිස්තුගත කිරීම හා බැඳුණු වාසි සහ මිත්‍යා මත, ලැයිස්තුගත සමාගම්වල සාර්ථකත්වයන්, ආයෝජන බැංකුවල කාර්යභාරය, ලැයිස්තුගතවීමේ ක්‍රියාවලිය, අවශ්‍යතා සහ යහපාලනය සම්බන්ධ ගැටලු ආදිය ප්‍රධාන විය. එහි නැවත විකාශය සෑම අඟහරුවාදා දිනකම රාත්‍රී 8.00 සිටත් සෑම ඉරිදාවකම පෙරවරු 10.00 ටත් සිදු කරන ලදී.

**''ආයෝජන'' ගුවන් විදුලි වැඩසටහන**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් පහසුකම් සලසන ලද වැඩසටහන් 18 කින් සමන්විත වූ ''ආයෝජන'' සජීවී ගුවන් විදුලි සාකච්ඡා වැඩසටහන 2014 මැයි සිට අගෝස්තු මාසය දක්වා ලක්හඬ ගුවන් විදුලි නාලිකාව ඔස්සේ සෑම ඉරිදාවකම පෙරවරු 9.00 ට විකාශය කරන ලදී. ආයෝජක අධ්‍යාපනය ඉහළ නැංවීමත් සහ ආයෝජක ප්‍රජාව වර්ධනය කිරීමේ අරමුණ ඇතිවත් විකාශය කළ මෙම වැඩසටහන් මාලාවට ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව විවිධ පැතිකඩයන් පිළිබිඹු කෙරෙන මාතෘකා අන්තර්ගත විය. එම මාතෘකා අතර, ඉතිරි කිරීම් හා ආයෝජන, කොටස් තැරැව්කරුවෙකුගේ කාර්යභාරය, ආයෝජක ආරක්ෂණය, ප්‍රාථමික වෙළෙඳපොළෙන් හා ද්විතීයික වෙළෙඳපොළෙන් කොටස් මිල දී ගන්නේ කෙසේද යනාදී කරුණු කැපී පෙනුනි. ''ආයෝජන'' වැඩසටහන 1998 වසරින් පසු විකාශය වූ පළමු වැඩසටහන ද විය.

මෙම වැඩසටහන තුළ දී දවසේ සාකච්ඡාවට අදාළව ශ්‍රාවකයන්ට සතියේ පැනයක් ඉදිරිපත් කළ අතර, නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ අයට මුදල් ත්‍යාග ද පිරිනැමූ අතර, එය ඔවුන් විසින් ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ආයෝජනය කරවීමට අවශ්‍ය යාන්ත්‍රණයක් ද සකස් කරන ලදී

**''දන්නෝ දිනන්නෝ'' ප්‍රශ්න විචාරාත්මක රියැලිටි දැනුම මිනුම තරඟය**

කොටස් වෙළෙඳපොළ හා ඒකක භාර ආයෝජනය පිළිබඳ ජනතාවට පුළුල් අවබෝධයක් ලබාදීමේ අරමුණ ඇතිව වැඩසටහන් 12 කින් සමන්විත ''දන්නෝ දිනන්නෝ'' නමින් රියැලිටි රූපවාහිනී වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් වෙළෙඳපොළ සහ සිරස රූපවාහිනී නාලිකාව සමඟ එක්ව පවත්වන ලදී. මෙම වැඩසටහන 2014 අගෝස්තු මාසයේ සිට නොවැම්බර් දක්වා සෑම ඉරිදාවකම පෙරවරු 11.00 සිට විකාශනය වූ අතර, එය ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සම්බන්ධයෙන් විකාශය වූ ප්‍රථම රියැලිටි වැඩසටහන මෙන්ම එම කාල පරාසය තුළ විකාශනය වූ හොඳම වැඩසටහන බවට ද පත් විය. ඉන් අනතුරුව එහි නැවත විකාශනයක් එම කාල පරාසය තුළ මෙන්ම බදාදා පස්වරු 10.45 ට සිදු කරන ලදී. ඊට අමතරව, සෑම වැඩසටහනක් තුළදීම ප්‍රේක්ෂකයන්ට ද මුදල් ත්‍යාග දිනා ගැනීමට අවස්ථාවක් සලසා දෙන ලදී. වැඩසටහන අතරතුර දී අසනු ලබන පැනයට නිවැරදි පිළිතුරු එවා ජයග්‍රහණය කළ අයගේ විස්තර වැඩසටහන අතරවාරයේ පළ කරන ලදී. සතියේ පැනය සඳහා සියලු වැඩසටහන් තුළින් ලැබුණු ප්‍රේක්ෂක ප්‍රතිචාර සංඛ්‍යාව 30,000 ඉක්මවා යන ලදී.

### මුද්‍රිත මාධ්‍ය මගින් සිදු කළ දැනුවත් කිරීම

සාමාන්‍ය ජනතාව ඉතිරි කරන්නන්ගේ සිට ආයෝජකයන් බවට පත් කිරීමේ අභිලාෂය ඇතිව මෙන්ම ඔවුන් අතර, මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණ ද ඇතිව මුද්‍රිත මාධ්‍ය හරහා භාෂා ත්‍රිත්වයෙන්ම දිනපතා පුවත්පත්වල

## මෙහෙයුම් සමාලෝචනය

ලිපි පළ කරන ලදී. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රාග්ධන වෙළෙඳපොළ හා සම්බන්ධයෙන් ලියැවුණු සතිපතා / මාසික පුවත්පත් ලිපි 250 කට අධික සංඛ්‍යාවක් ඩේලි මිරර්, අද, තිනක්කුරල්, ද චේන්ජ් හා බිස්නස් එල් කේ යන පුවත්පත්වල පළ කරන ලදී. සතිපතා / මාසික පුවත්පත් ලිපිවලට අමතරව තවත් අඛණ්ඩ ලිපි මාලාවක් ද ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ආයෝජනය සම්බන්ධයෙන් අනෙකුත් පුවත්පත් සහ සඟරාවල පළ කරන ලදී.

### සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් සිදු කළ දැනුවත් කිරීම්

**2014 ප්‍රාග්ධන වෙළෙඳපොළ සමුළුව**

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව 2014 ප්‍රාග්ධන වෙළෙඳපොළ සමුළුව කොළඹ සිනමන් ලේක්සයිඩ් හෝටලයේ දී 400 කට වඩා අධික දේශීය හා විදේශීය සහභාගිකරුවන්ගේ සහභාගීත්වයෙන් 2014 ඔක්තෝබර් මස 09 වන දින පවත්වන ලදී. අරමුදල් කළමනාකරුවන් මෙන්ම ප්‍රධාන පෙළේ ආයෝජකයින්ට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳව අධ්‍යයනය කිරීමට සහ අවබෝධයක් ලබා ගැනීමට මෙය සුවිශේෂී අවස්ථාවක් විය. ඒ සමගම මෙම විශේෂ අවස්ථාව පිළිබඳව සිංහල පුවත්පත්වල පිටු 6 ක් සහ ඉංග්‍රීසි පුවත්පත්වල පිටු 10 ක් බැගින් පුවත්පත් අතිරේක පළ කරන ලදී.

**ආසියා පැසිෆික් කලාපීය ආර්ථික සහයෝගීතාවය පිළිබඳ මූල්‍ය නියාමකයින් පුහුණු කිරීමේ සම්මන්ත්‍රණය**

මූල්‍ය නියාමකයින් අතර දැනුම හුවමාරු කර ගැනීම ප්‍රවර්ධනය කිරීම හා අන්‍යෝන්‍ය සහයෝගීතාවය ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආසියා පැසිෆික් කලාපීය ආර්ථික සහයෝගීතාවය පිළිබඳ මූල්‍ය නියාමකයින් පුහුණු කිරීමේ ආයතනය විසින් බලාත්මක ක්‍රියාකාරකම්, තක්සේරු කිරීම්, සැලසුම් කිරීම් සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම් සම්බන්ධ සම්මන්ත්‍රණය 2014 මාර්තු 17 සිට 24 වන දින දක්වා පවත්වන ලදී.

මෙම සම්මන්ත්‍රණය මගින් පුළුල් පරාසයක් සහිත මාතෘකා රැසක් ආවරණය කෙරුණු අතර, උදාහරණ ලෙස විමර්ශන සැලසුම් සකස් කිරීම, සාක්ෂිකරුවන්ගෙන් සහ සැකකරුවන්ගෙන් සාක්ෂි සටහන් කර ගැනීම, නොමග යවන සුළු වෙළෙඳපොළක් ඇති කිරීම ආදිය පෙන්වා දිය හැකිය.

සම්මන්ත්‍රණය සඳහා දේශීය නියාමන ආයතන නියෝජනය කරන නියෝජිතයන් මෙන්ම මැලේසියාව, නේපාලය, නයිජීරියාව, පිලිපීනය, තායිපෙ, තායිලන්තය, චීනය, කාම්බෝජය, ඉන්දියාව සහ බෲනායි යන රටවල් නියෝජනය කරන කලාපීය නියෝජිතයන් රැසක් සහභාගී විය.


**යාපන ආයෝජක වැඩමුළුව**

ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජන අවස්ථාවන් පිළිබඳව යාපනයේ ජනතාව දැනුවත් කිරීමේ ආයෝජක වැඩමුළුවක් ටිල්කෝ හෝටලයේ දී 2014 දෙසැම්බර් මස 6 වන දින ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ හා එක්ව සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව සඳහා ඉහළ පෙළේ වෘත්තිකයන්, ආයෝජකයන්, අධ්‍යාපනඥයන් සහ ව්‍යාපාරික ප්‍රජාව ඇතුලු 250 කට අධික පිරිසක් සහභාගී විය.

### අනෙකුත් දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විවිධාකාරයේ ආයෝජක අධ්‍යාපන වැඩසටහන් පවත්වමින් දැනුවත් ආයෝජකයන් පිරිසක් බිහි කිරීමේ උත්සාහය අඛණ්ඩව තව දුරටත් පවත්වාගෙන යන ලදී. වෙළෙඳ සංගම් සාමාජිකයින්, පාසල් ගුරු භවතුන්, සිසුන්, උපාධි අපේක්ෂකයින්, පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ සේවකයින් ආදී පිරිස් සඳහා ප්‍රාග්ධන වෙළෙඳපොළ ආයෝජනය පිළිබඳ දැනුම ලබාදීම ඉතා ඉහළ මට්ටමකින් හා සාර්ථක අයුරින් සිදු කරන ලදී. (රූප සටහන 12)

**රූප සටහන 12: දැනුවත් කිරීමේ වැඩසටහන්**




### අපගේ ශක්තීන්

ආයතනයකට සියල්ලටම වඩා වැදගත් වනුයේ පුද්ගලයන්ය. එහෙයින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය අගය කළ යුතු, ගරු කළයුතු මෙන්ම නැගී එන වෙළෙඳපොළ අවශ්‍යතා වලට මුහුණදිය හැකි ආකාරයට පුහුණු කළ යුතුය. තවද අවංකභාවය හා රහස්‍යභාවය ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සියළුම ශ්‍රේණීන්වලට අයත් කාර්ය මණ්ඩලයට අත්‍යවශ්‍ය දෙයකි.

### කාර්ය මණ්ඩලයේ සංයුතිය

සලකා බලන වර්ෂය තුළ ප්‍රාග්ධන වෙළෙඳපොළ අභියෝග ජය ගැනීමට සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමේ අරමුණින් බඳවා ගැනීම් පටිපාටියට අදාළ සුළු විෂමතාවයන් කිහිපයක් ගැන අවධානය යොමු කරමින් මධ්‍යස්ථ ආකාරයෙන් වැටුප් තලයන් වෙනස් කරන ලදී. මානව සම්පත් ක්‍රියාමාර්ගයන් ක්‍රියාවට නැංවීමේ පිළිවෙළ මනාව සකස් කිරීමේ දී මානව සම්පත් උපදේශක පෙන්වා දුන් කරුණු ද මනා පිටුවහලක් විය.

වර්ෂය තුළ පවත්වන ලද විධිමත් හා තරඟකාරී බඳවා ගැනීම් පටිපාටියක් තුළින් එක් විධායක නිලධාරියකු සහ විධායක නොවන නිලධාරියකු බඳවා ගන්නා ලදී. එක් උපදේශකවරයෙකුගේ සේවා කාලය අවසන්වීමට අමතරව අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරියක සහ විධායක නිලධාරිනියන් දෙදෙනෙකු වශයෙන් හතර දෙනෙකු සේවයෙන් ඉවත් වී ඇත.

දීර්ඝකාලීන සේවය, පෙර කාර්‍ය සාධන මට්ටම සහ හොඳ හැසිරීම අගය කරනු වස් අධීක්ෂණ අංශයට අනියුක්ත විධායක නිලධාරිනියන් දෙදෙනෙකු සහ විමර්ශන අංශයට අනියුක්ත එක් විධායක නිලධාරියකු ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් ලෙස ද එක් විධායක ලේකම්වරියක ජ්‍යෙෂ්ඨ විධායක ලේකම්වරියක ලෙස ද, මානව සම්පත් කළමනාකරණ අංශයට අනියුක්ත එක් විධායක නොවන නිලධාරිනියක විධායක නිලධාරිනියක ලෙස ද උසස් කරන ලදී. (සංඛ්‍යා සටහන 14)

**සංඛ්‍යා සටහන 14: කාර්‍ය මණ්ඩල සංයුතිය**

| තනතුර | අනුමත කාර්‍ය මණ්ඩල සංඛ්‍යාව | වර්තමානයේ සේවයේ නියුතු සංඛ්‍යාව ස්ථිර තනතුරු | වර්තමානයේ සේවයේ නියුතු සංඛ්‍යාව කොන්ත්‍රාත්තු පදනම | පුරප්පාඩු තනතුරු |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | - | | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | | - |
| අධ්‍යක්ෂ | 11 | 7 | 2 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | 5 | 1 | | 4 |
| කළමනාකරු | 8 | 4 | | 4 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 43 | 16 | | - |
| විධායක නිලධාරීන් | | 22 | 1 | 4 |
| විධායක නොවන නිලධාරීන් | 17 | 16 | | 1 |
| ජ්‍යෙෂ්ඨ කාර්යාල සහකාර | 10 | 6 | 2 | |
| කාර්යාල සහකාර | | 1 | | |
| කාර්යාල සහායක | | 1 | | |
| එකතුව | 96 | 75 | 5 | 16 |

2014 දෙසැම්බර් 31 දින වන විට දී කොමිෂන් සභාවේ 80 ක් වූ කාර්‍ය මණ්ඩලය අතරින් 32 දෙනෙකු පිරිමි සාමාජිකයන් වූ අතර, ස්ත්‍රී නියෝජනය 48 කි. (රූප සටහන් 13, 14, 15, 16)

එසේම වසර අවසානය වන විට ස්ත්‍රී පුරුෂ නියෝජනය වයස් සංයුතිය හා සේවා කාලය අනුව කාර්‍ය මණ්ඩලයේ සංයුතිය පහත රූප සටහන මගින් පැහැදිලිව පෙන්වා ඇත.

## පුහුණු සහ සංවර්ධන කටයුතු

කාර්‍ය මණ්ඩලයේ තාක්ෂණික හා ඒ ආශ්‍රිත හැකියාවන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පරමාර්ථයන්ට ගැළපෙන අයුරින් කාර්යක්ෂමව හා සඵලදායී අන්දමින් නොනවත්වා පවත්වා ගැනීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරන ලදී. පියවරක් ඉදිරියට තබමින් ජපාන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (Japan International Monetary Fund - IMF) මගින් ආසියාව සඳහා වන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ වසර දෙකකට මදක් වැඩි කාලයක් සඳහා වන පශ්චාත් උපාධි වැඩසටහන සඳහා සුදුසුකම් ලද විධායක නිලධාරිනියක සඳහා අධ්‍යයන නිවාඩු කොමිෂන් සභාව මගින් අනුමත කරන ලදී.


වසර තුළ කරන ලද සමාලෝචනයන්ට අනුව රුපියල් මිලියන 16.4 ක මුදලක් විදේශ පුහුණු වැඩසටහන් සඳහා ද, රුපියල් මිලියන 2.1 ක මුදලක් දේශීය පුහුණු වැඩසටහන් සඳහා ද

**රූප සටහන 13: සේවක තනතුරු අනුව කාර්ය මණ්ඩල සංයුතිය**



| තනතුර | 31.12.2014 දිනට සේවයේ නියුතු | % |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂවරු | 10 | 12.50 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂවරු | 1 | 1.25 |
| කළමනාකරුවන් | 4 | 5.00 |
| ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් | 16 | 20.00 |
| විධායක නිලධාරීන් | 23 | 28.75 |
| විධායක නොවන නිලධාරීන් | 16 | 20.00 |
| කාර්යාල සහායකයන් | 10 | 12.50 |

**රූප සටහන 14: ස්ත්‍රී පුරුෂ භාවය**



| | |
|---|---|
| පුරුෂ | 32 |
| ස්ත්‍රී | 48 |

**රූප සටහන 15: සේවක වයස් සංයුතිය**



| | |
|---|---|
| 25-35 | 31 |
| 36-45 | 31 |
| 46-55 | 18 |

**රූප සටහන 16: සේවා කාලය ප්‍රතිශතයක් ලෙස**



| | |
|---|---|
| අවුරුදු 2 දක්වා | 25.00% |
| අවුරුදු 3-4 අතර | 18.75% |
| අවුරුදු 5-6 අතර | 20.00% |
| අවුරුදු 7-8 අතර | 2.50% |
| අවුරුදු 9-10 අතර | - |
| අවුරුදු 10ට වඩා වැඩි | 33.75% |

# මෙහෙයුම් සමාලෝචනය

වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූරණය කිරීම සඳහා රුපියල් මිලියන 1.71 ක මුදලක් ද වැය කරන ලදී. සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සහ අනෙකුත් නියාමන ආයතන, ආසියා ශාන්තිකර කලාපීය ආර්ථික සංවිධානය ආදී ආයතන වෙතින් ඉතාමත් ගැලපෙන පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අවස්ථාව ලබාදෙමින් කාලීන ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම් සහ සංවර්ධන තත්ත්වයන් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව අපගේ සතුට ප්‍රකාශ කරන්නෙමු.

සලකා බලන වර්ෂය තුළ අප කලාපයේ සහ ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ස්විට්සර්ලන්තය, දකුණු කොරියාව ආදී රටවල පැවැත් වූ පුහුණු වැඩසටහන් 23 ක් සඳහා කාර්ය මණ්ඩලය යොමු කර ඇත.

එයට අමතරව ඒකාබද්ධකරණයේ දී නීතිය සහ බදු සම්බන්ධය **(Legal and Tax Implication of Amalgamations) , SPSS** මෘදුකාංගය භාවිතය තුළින් සංඛ්‍යානමය තොරතුරු සැකසීම සහ නිර්මාණය කිරීම **(Statistical Programming and Modelling using SPSS Software)** ශ්‍රී ලංකාවේ දේපළ සංවර්ධනය සහ ඉඩකඩම් දේපළ ආයෝජනය **(Prop erty Development & Real Estate Investment in Sri Lanka)** නීතිවේදීන් නොවන අය සඳහා නීතිය **(Law for Non Lowyers)** ජාතික මානව සම්පත් සමුළුව **2014 (National Human Resources Conference 2014),** ශ්‍රී ලංකා ආර්ථික සමුළුව **2014 (Sri Lanka Economic Summit 2014),** පෞද්ගලික ව්‍යාපාර වස්තු අරමුදල පිළිබඳ සම්මන්ත්‍රණය **(Seminar on Private Eauity Funding)** ජාතික තොරතුරු තාක්ෂණ සම්මන්ත්‍රණය **2014 (National Information Technology Conference 2014)** ඒකාබද්ධ නීති සමුළුව **2014 (Corporate Law Conference)** ආදී දේශීය පුහුණු වැඩසටහන් සඳහා ද කාර්ය මණ්ඩලය යොමු කරනු ලැබීය.

කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනය පිළිබඳ ඇති කැපවීම මනාව ආදර්ශනය කරමින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඔවුන්ගේ ප්‍රාග්ධන වෙළෙඳපොළ පිළිබඳ දැනුම වර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිසමෙහි පුහුණු අංශය මගින් මෙහෙයවනු ලබන අධ්‍යාපන පාඨමාලා හැදෑරීමට අඛණ්ඩව අවස්ථාව ලබාදෙන ලදී. වරලත් මූල්‍ය විමර්ශකයන්ගේ ආයතනය මගින් ද අඩු කළ මිල ගණන් යටතේ තව දුරටත් පාඨමාලා හැදෑරීමට ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබීය. එයට අමතරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යාල සාමාජිකයන් සඳහා සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වසර දෙකක් සේවය කිරීමේ (වසර දෙකක ඇපයකට) බැඳීමට යටත්ව පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළත්ව උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රාහක දීමනා ලබාදීමට කටයුතු කර ඇත.

2013 වසරේ අයහපත් කාලගුණය හේතුවෙන් කල් දැමීමට සිදු වූ දුෂ්කර ක්‍රියාකාරකම් මූලික කරගත් දෙදින බාහිර පුහුණු වැඩසටහන කිතුල්ගල ප්‍රදේශයේ දී 2014 වසරේ මුල සාර්ථකව පැවැත්වීය. මෙහි මූලික පරමාර්ථය වූයේ ඵලදායී බාහිර පුහුණු වැඩසටහන ක්‍රියාකාරකම් තුළින් තම සහෝදර කාර්ය මණ්ඩලය සමඟ සහ බාහිර පාර්ශවයන් සමඟ හරවත් සම්බන්ධතා පවත්වාගෙන යාමට අවශ්‍ය විශ්වාසවන්ත භාවය සහ හැකියාව සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය ධනාත්මක වීර්යය කා වැද්දවීමත්, එතුළින් කාර්ය මණ්ඩලය එදිනෙදා ජීවිතයේ දී සහ රාජකාරී කටයුතු කරගෙන යාමේ දී අවශ්‍ය පෞරුෂත්වය සහ ධනාත්මක චින්තනය වර්ධනය කිරීමත් ය.

### කාර්ය මණ්ඩල සුභසාධනය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අරමුණු වෙත ළඟාවීමේ දී සියලු කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය සහ සුභසාධනය අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස අප හඳුනාගෙන ඇත. එම නිසා 2015 ජනවාරි පළමු වැනි දා සිට කාර්ය මණ්ඩලය සඳහා බාහිර වෛද්‍යාධාර ක්‍රමය ඉහළ නැංවීමට පියවර ගෙන ඇත. එයට අමතරව අභ්‍යන්තර වෛද්‍ය පහසුකම්, නිදහස් පැමිණීමේ ක්‍රමය, වාහන සහ ආපදා ණය ක්‍රමය, උත්සව අත්තිකාරම් වැනි පහසුකම් යම් යම් කොන්දේසිවලට යටත්ව විවර කර දී ඇත.

කොමිෂන් සභා සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා සුහදතාවය වර්ධනය කර ගැනීමට වාර්ෂික ක්‍රීඩා උත්සවය සහ වාර්ෂික නේවාසික පුහුණු වැඩසටහන් තුළින් අවස්ථාව උදා විය. නත්තල් ප්‍රිය සම්භාෂණය කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් අතිශයින් විනෝද වූ අවස්ථාවක් විය.

### අභ්‍යාසලාභී පුහුණුව

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ජාතික විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයන් සඳහා කාර්යාලයීය වැඩ පිළිබඳ පුහුණුවක් ලබා දීමේ සහ ඔවුන්ව අනාගතයේ රැකියාවක් කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබාදීමේ අරමුණින් අභ්‍යාසලාභී පුහුණු අවස්ථාව තව දුරටත් ලබා දෙන ලදී.

### ව්‍යවස්ථාපිත අරමුදල්

### සෙස් අරමුදල

2009 අංක 47. 2003 අංක 18 හා 1991 අංක 26 දරණ පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරණ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 14 ඒ සහ 14 බී යන වගන්තිවල මෙසේ සඳහන් වේ.

14 ඒ (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන අනු ප්‍රමාණයකට අනුව වූ සෙස් බද්දක් බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු හුවමාරු ස්ථානයක වාර්තාගත සෑම සුරැකුම්පත් මිල දී ගැනීමක් හා විකිණීමක් වෙනුවෙන්ම එහි රීති යටතේ සඳහන් කර ඇති ආකාරයකට ගැණුම්කරු හා විකුණුම්කරු යන දෙදෙනාම විසින් නියම කිරීම්, අයකිරීම් හා ගෙවීම් කිරීම් සිදු කළ යුතුය. විවිධ වත්කම් පංති වෙනුවෙන් විවිධ අයකිරීමේ අනුපාතයන් පැනවීමට ඉඩ ඇත.

(2) මෙම වගන්තිය යටතේ පනවන සෙස් බද්ද වෙනත් ලිඛිත නීතියක් යටතේ අය කරනු ලබන වෙනත් යම් බද්දකට හෝ සෙස් බද්දකට අමතරව විය යුතුය.

14 බී (1) සෙස් බදු අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු වන අතර, 14 ඒ වගන්තිය යටතේ අය කරනු ලබන සෙස් බදු අරමුදල් එම සෙස් බදු අරමුදලට බැර කළ යුතුය.

(2) කොමිෂන් සභාව අනුමත කරන්නා වූ මුදල් ප්‍රමාණයන් උපයෝගී කරගෙන සෙස් බදු අරමුදලින් පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට හැකියාව ඇත.

- සුරැකුම්පත් වෙළෙඳපොළ දියුණු කිරීම.

- 38 වන වගන්තිය යටතේ ස්ථාපිත කොට ඇති වන්දි අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය වැඩි කිරීම සඳහා සහ
- කොමිෂන් සභාවේ අරමුණු කරා ළඟාවීමේ දී ඊට අවශ්‍ය බලතල, කාර්යය හා කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට හා ඉටු කිරීමට.

සෙස් අරමුදලේ බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාව තීරණය කරන ආකාරයකට ආයෝජනය කළ හැකිය.

2010 අගෝස්තු මස 01 වන දින සිට දෙවන වතාවටත් කොමිෂන් සභාව මගින් එක් ගණුදෙනුවක් සඳහා වන සෙස් බදු අනුපාතය 0.09% සිට 0.072% දක්වා පහත හෙළන ලදී. මීට කලින් එය වෙනස් කරන ලද්දේ 2003 දෙසැම්බර් 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි 0.1% සිට 0.09% දක්වා අඩු කිරීමෙනි.

2011 ජනවාරි 01 වන දින සිට බල පැවැත්වෙන පරිදි රුපියල් මිලියන 50ක් හා මිලියන 50 වඩා වැඩි වටිනාකමකින් යුත් ගණුදෙනු සඳහා අය කරනු ලැබූ සෙස් බද්ද පිළිවෙලින් 0.072% ක් හා 0.045% ක් විය.

2006 පෙබරවාරි මස 15 දින සිට බලපැවැත්වෙන පරිදි යම් ආයෝජකයකු එකම සුරැකුම්පත් විශේෂයක් එකම දිනක දී එකම තැරැව්කාර සමාගමක් හරහා මිල දී ගෙන විකුණුවේ නම් හෝ විකුණා නැවත මිල දී ගත්තේ නම් එවැනි එක්දින ගණුදෙනු සඳහා වන තැරැව්කාර ගාස්තුව, කොටස් වෙළෙඳපොළ සෙස් බදු, මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගාස්තුව හා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා සෙස් බදු යනාදී ගණුදෙනු පිරිවැය ගණුදෙනුවේ එක් පාර්ශවයකට අය කරනු නොලැබේ. එවැනි අවස්ථාවක ගණුදෙනුවේ දෙපාර්ශවය වෙනුවෙන්ම අය කරන කොටස් ගණුදෙනු ගාස්තුව වනුයේ 0.300% කි.

- මිල දී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය හා සමාන නොවන අවස්ථාවක දී මිල දී ගත් හෝ විකුණනු ලැබූ දෙකින් කවර හෝ එකක අඩු ප්‍රමාණය සඳහා සෙස් බද්ද අය නොකෙරේ.

- මිල දී ගනු ලබන කොටස් ප්‍රමාණය විකුණනු ලැබූ කොටස් ප්‍රමාණය සමග සමාන වන අවස්ථාවක දී මිල දී ගත් හෝ විකුණනු ලැබූ දෙකින් කවර හෝ ගණුදෙනුවක දෙවන ගණුදෙනුව සඳහා සෙස් බද්දක් අය නොකෙරේ.

එකම සුරැකුම්පත් විශේෂයක් එකම දිනක දී එකම තැරැව්කාර සමාගමක් හරහා මිල දී ගෙන විකුණුවේ නම් හෝ විකුණා නැවත මිලට ගත්තේ නම් එවැනි ගණුදෙනු එක් දින ගණුදෙනු ලෙස හැඳින්වේ.

වන්දි අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 වර්ෂයේ දී සෙස් අරමුදලින් රුපියල් මිලියන 50 ක් මාරු කර බැර කරන ලදී. එමෙන්ම 2009 සහ 2010 යන වසරවල දී සමානව රුපියල් මිලියන 100 බැගින් සෙස් අරමුදලින් පියවීම් සහතික කිරීමේ අරමුදලට මාරු කර බැර කරන ලදී. තවද මිලියන 276 ක්, මිලියන 380 සහ මිලියන 94 ක් වශයෙන් අවස්ථා තුනක දී පිළිවෙලින් 2010.09.30 , 2012.09.24 සහ 2013.12.31 යන දිනයන්හි දී ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

2014 දෙසැම්බර් 31 වන දින වන විට සෙස් අරමුදලට බැර වී ඇති ශේෂය රුපියල් 2,447,738,612 ක් විය. 2005 වසරේ සිට 2014 වසර දක්වා මෙම අරමුදලෙහි ශේෂයෙහි වර්ධනය පහත ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 17)

### වන්දි අරමුදල

වර්ෂ 1987 දී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පිහිටුවීමත් සමගම වන්දි අරමුදල ද ආරම්භ කරන ලදී. 1987 අංක 36 දරණ සංශෝධිත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනතේ 38 වන වගන්තියෙහි මෙසේ සඳහන් වේ.

- බලපත්‍රලාභී කොටස් තැරැව්කරුවෙකු හෝ බලපත්‍රලාභී කොටස් වෙළෙන්දෙකු සිය ගිවිසුම්ගත වගකීම් ඉටු කිරීමට අසමත්වීම හේතු කොට ගෙන මුදල් හානියකට භාජනය වන යම් ආයෝජකයෙකුට වන්දි ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා මෙම වන්දි අරමුදලක් පිහිටුවන ලදී.

- එම වන්දි අරමුදලෙහි පහත සඳහන් කරුණු අන්තර්ගත වේ.
  * වන්දි අරමුදලෙහි කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණු මුදල්
  * පනතේ 51 අ වගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබූ මුදල් (51 අ වගන්තිය යනු වරද සමථයකට පත් කිරීම සම්බන්ධයෙන් වූවකි.)
  * සෙස් අරමුදල මගින් පනතේ 14 අ වගන්තිය යටතේ බැර කරනු ලබන මුදල්

- වන්දි අරමුදලෙහි බැරට ඇති මුදල් කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාව තීරණය කරනු ලබන ආකාරයකට ආයෝජනය කළ හැකිය.

අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් තිදෙනෙකු වන්දි කමිටුවේ සාමාජිකයන් ලෙස පත් කළ යුතුය.

පත් කරන ලද කමිටුව යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් වන්දි තක්සේරු කිරීම හා ප්‍රදානය කිරීම පිළිබඳ වගකීම දැරිය යුතුය. තවද එවැනි තක්සේරු කිරීමක් හෝ ප්‍රදානයක් සම්බන්ධයෙන් කමිටුව ගන්නා තීරණය අවසානාත්මක තීරණය වන්නේය.

වන්දි සඳහා ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන සලසා ඇත. පනත අනුව ඉල්ලුම්කරුගේ හිමිකම් සනාථ කිරීම පිණිස ඉදිරිපත් කරන ලද ලේඛන හෝ වෙනත් සාක්ෂි පරීක්ෂා කිරීමෙන් පසුව හෝ යම් විභාගයක් පැවැත්වූ විටෙක එකී විභාගය අවසාන වූ විට කමිටුව විසින් වන්දි සඳහා වූ එම ඉල්ලීමට අවසරදීම හෝ නොදීම කළ හැක. වන්දි අරමුදල සඳහා හිමිකම් ඉල්ලීමක් මේ දක්වා වාර්තා වී නොමැත.

2014 දෙසැම්බර් 31 වන දිනට මෙම අරමුදලේ ශේෂය රුපියල් 293,242,099/= ක් විය. 2005 වසරේ සිට 2014 වසර දක්වා මෙම අරමුදලේ ශේෂයෙහි වර්ධනය පහත ප්‍රස්තාර සටහන මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 18)

### පියවීම් සහතික කිරීමේ අරමුදල

මෙම පියවීම් සහතික කිරීමේ අරමුදල 1998 මැයි මස ආරම්භ කරන ලදී. මෙම අරමුදල පිහිටුවන ලද්දේ කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි සහභාගීකරුවන් අතර වෙළෙඳ ගණුදෙනු පියවීම සහතික කිරීමේ අරමුණ ඇතිවය. මෙම අරමුදලෙහි ක්‍රියාකාරීත්වය පහත සඳහන් පරිද්දෙන් විස්තර කළ හැකිය.

- කොටස් ගණුදෙනුවක් වූ සැනින් ප්‍රමාදයකින් තොරව කොටස් අයිතිය මාරු විය යුතුය. 2007 දෙසැම්බර්

## මෙහෙයුම් සමාලෝචනය

10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් බේරුම් කිරීමේ කාල සීමාව ඒකීය තලයකට ගෙන එන ලදී. එනම් ගැණුම්කරු විසින් T+3 පදනම මත, එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළැඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් සිදු කළ යුතු වන අතර, විකුණුම්කරුට T+3 පදනම මත එනම් ගණුදෙනුව සිදු කළ දින ද ඇතුළුව එළැඹෙන සිව්වන දිනයේ දී අදාළ ගෙවීම් පියවීම සිදු කරනු ලැබේ. කෙසේ වෙතත් හිමිකම් පැවරීම සහ සත්‍ය ලෙස මුදල් ලැබීම අතර සාපේක්ෂ වශයෙන් දිගු අතරමැදි කාලයක් පැවතීම හේතුවෙන්, සුරක්ෂිත නොවන පියවීමේ අවදානමක් ඇතිවන නිසා මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාවය ඇති විය.

- මෙම අරමුදලේ භාරකරුවන් නිල බලයෙන් ඊට පත්වනු ලබන අතර, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති, කොළඹ කොටස් හුවමාරුවේ හි සභාපති, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ කොළඹ කොටස් හුවමාරුවෙහි අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන් ඊට අයත් වේ.


- ශ්‍රී ලංකා රජය මෙම අරමුදලට රුපියල් මිලියන 50 ක මුදලක් ප්‍රධාන කොට තිබේ. මෙම අරමුදල භාර ඔප්පුව ප්‍රකාරව රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. මෙම අරමුදලට ප්‍රතිපූර්ණක වශයෙන් පරිත්‍යාග තෑගි සහ ප්‍රදානයන් ලබා ගැනීමට හැකි වේ. කොටස් තැරැව්කරුවන් සහ භාරකාර බැංකු මෙම අරමුදලට දායකවීමෙහි අවශ්‍යතාවයක් නොමැත.

- මෙම අරමුදල ශක්තිමත් කිරීමේ අරමුණින් 2009 සහ 2010 වන වසරවල දී සෙස් අරමුදලින් රුපියල් මිලියන 100 බැගින් මෙයට බැර කරන ලදී. පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරක ඔප්පුව වෙනස් කිරීමෙන් අනතුරුව 2012 ජනවාරි මස දී කොළඹ කොටස් හුවමාරුව විසින් ද රුපියල් මිලියන 100 ක් මෙම අරමුදලට බැර කරන ලදී.


කෙසේ වෙතත් පියවීම් සහතික කිරීමේ අරමුදල පියවීමේ අවදානම ඉවත් කිරීම සඳහා නියමාකාරයෙන් කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් ඊට පිළියමක් ලෙස මධ්‍යම නිෂ්කාශන ආයතනයක් ස්ථාපනය කිරීමේ හැකියාව පිළිබඳව සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ශක්‍යතා අධ්‍යයනයක නිරත වී සිටී. එම මධ්‍යම නිෂ්කාශන ආයතනයේ ප්‍රාග්ධනයෙන් කොටසක් නියෝජනය කරනුයේ ද මෙම පියවීම් සහතික කිරීමේ අරමුදලයි.

මේ දක්වා පියවීම් සහතික කිරීමේ අරමුදලින් හිමිකම් ඉල්ලීමක් ඉදිරිපත් වී නොමැත. 2014 දෙසැම්බර් 31 වන දින වන විට මෙම අරමුදලේ බැර ශේෂය රුපියල් 604,157,532 ක් විය. ඒ අනුව 2005 සිට 2014 වසර දක්වා මෙම අරමුදලෙහි වර්ධනය පහත ප්‍රස්තාරය මගින් පෙන්නුම් කරයි. (රූප සටහන 19)


**රූප සටහන 17: සෙස් අරමුදලේ වර්ධනය**




**රූප සටහන 18: වන්දි අරමුදලේ වර්ධනය**




**රූප සටහන 19: පියවීම් සහතික කිරීමේ අරමුදලේ වර්ධනය**



# අතිරේක තොරතුරු

## ඒකක භාර

ඒකක භාර වශයෙන් ක්‍රියාත්මක වීමට පහත සඳහන් සමාගම් බලපත්‍ර ලබාගෙන ඇත.

1. සිලොන් ඇසෙට් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්
   - සිලොන් ඉන්ඩෙක්ස් ෆන්ඩ්
   - සිලොන් ඉන්කම් ෆන්ඩ්
   - සිලොන් ටුවරිසම් ෆන්ඩ්
   - සිලොන් ෆයිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ්
   - සිලොන් අයි පී ඕ ෆන්ඩ්
   - සිලොන් එම් ටී අයි ෂාරියා ෆන්ඩ්
   - සිලොන් ග්ලෝබල් කම්පැක්ට් සස්ටේනබිලිටි ෆන්ඩ්
   - සිලොන් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - සිලොන් ට්‍රෙෂරි බිල් ෆන්ඩ්
   - සිලොන් ඩොලර් බොන්ඩ් ෆන්ඩ්

2. කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ්
   - ක්‍රෙසන්ට් අයි ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් මනිමාර්කට් ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ඒඩීඑල් මුදරබා ෆන්ඩ්
   - කොම්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්

3. එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ඊගල් ග්‍රොත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - ඊගල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
   - ඊගල් ෆික්ස්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - ඊගල් ග්‍රොත් ෆන්ඩ්
   - ඊගල් මනි ෆන්ඩ්
   - ඊගල් මනි ප්ලස් ෆන්ඩ්
   - ෂෝර්ට් ටර්ම් LKR ට්‍රෙෂරි ෆන්ඩ්

4. සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - සීබෑන්ක් යුනිට් ට්‍රස්ට්
   - සීබෑන්ක් සෙන්චරි ග්‍රොත් ෆන්ඩ්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (ආවෘත අරමුදල්)
   - සීබෑන්ක් සේවිංග්ස් ප්ලස් මනි මාර්කට් ෆන්ඩ්
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (B සීරිස්)
   - සීබෑන්ක් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ් (A සීරිස්)
   - සීබෑන්ක් සුරැකුම්

5. නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - නාමල් ඉන්කම් ෆන්ඩ්
   - නාමල් මනි මාර්කට් ෆන්ඩ්
   - නාමල් ඉක්විටි ෆන්ඩ්
   - නාමල් ග්‍රොත් ෆන්ඩ්
   - නාමල් ගිල්ට් ෆන්ඩ්
   - නාමල් ඇක්විටි වැල්‍යු ෆන්ඩ් (ආවෘත අරමුදල්)
   - නාමල් අයි පී ඕ ෆන්ඩ්
   - නාමල් හයි යීල්ඩ් ෆන්ඩ්
   - නාමල් ෂරියා ෆන්ඩ්

6. ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ෆස්ට් කැපිටල් වෙල්ත් ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් ෆික්ස්ඩ් ඉන්කම් ෆන්ඩ්
   - ෆස්ට් මනි මාකට් ෆන්ඩ්
   - ෆස්ට් කැපිටල් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්

7. ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - ජේ බී වැන්ටේජ් මනි මාර්කට් ෆන්ඩ්
   - ජේ බී වැන්ටේජ් වැල්‍යු ඉක්විටි ෆන්ඩ්

8. ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ෆික්ස් ඉන්කම් ෆන්ඩ්
   - ගාර්ඩියන් ඇක්විටි ඉක්විටි ෆන්ඩ්

9. කැන්ඩර් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
   - කැන්ඩර් කැපිටල් ග්‍රොත් ෆන්ඩ්
   - අමානා කැන්ඩර් ෂරියා බැලන්ස්ඩ් ෆන්ඩ්
   - අමානා කැන්ඩර් ෂරියා ඉන්කම් ෆන්ඩ්

10. ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ඇස්ට්‍රා ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
    - ඇස්ට්‍රා මනි මාර්කට් ෆන්ඩ්
    - ඇස්ට්‍රා ඇල්ෆා ෆන්ඩ්

11. කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
    - කැපිටල් එලයන්ස් හයි යීල්ඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කෝපරේට් ට්‍රෙෂරි ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කොන්ට්‍රේරියන් ඉක්විටි ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට් ග්‍රේඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ඉන්කම් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් ට්‍රේඩිං ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් මීඩියම් ඩෙට් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් කෝපරේට් ඩෙට් ඇන්ඩ් ගිල්ට් ට්‍රේඩිං ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ්
    - කැපිටල් එලයන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ්

12. ආර්පිකෝ ඇටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ආර්පිකෝ ඇටරාසියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ්
    - ආර්පිකෝ ඇටරාසියා රිපෝ ෆන්ඩ්
    - ආර්පිකෝ ඇටරාසියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ්-ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
    - ආර්පිකෝ ඇටරාසියා එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 ඉන්ඩෙක්ස්ඩ් ෆන්ඩ්

13. ඉන්වෙස්ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ්
    - ඉන්වෙස්ට්‍රස්ට් ඉන්කම් ෆන්ඩ්
    - ඉන්වෙස්ට්‍රස්ට් ග්‍රොත් ෆන්ඩ්
    - ඉන්වෙස්ට්‍රස්ට් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
    - ඉන්වෙස්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ්

14. ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
    - ඇසෙට්ලයින් ඉන්කම් ප්ලස් ග්‍රොත් ෆන්ඩ්
    - ඇසෙට්ලයින් ගිල්ට් එඩ්ජ් ෆන්ඩ්
    - ඇසෙට්ලයින් ඉන්කම් ෆන්ඩ්

# අතිරේක තොරතුරු

## 2014 දෙසැම්බර් 31 වන දින වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ඇති කොටස් තැරැව්කාර සමාගම්

| සමාගම |
|---|
| ඇක්විටි ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ආශා ෆිලිප්ස් සෙකියුරිටීස් ලිමිටඩ් |
| ඒෂියා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ඇසෙට්ලයින් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| බාට්ලීට් රෙලිගයා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| කැන්ඩෝර් ඉක්විටීස් ලිමිටඩ් |
| කැපිටල් එලයන්ස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| කැපිටල් එලයන්ස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ක්ලැරිජ් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සී ටී සී එල් එස් ඒ සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් පෙර සී ටී ස්මිත් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස හඳුන්වන ලද ෆස්ට් කැපිටල් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| ෆස්ට් ගාර්ඩියන් ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් පෙර අයි අයි එෆ් එල් සෙකියුරිටීස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස හඳුන්වන ලද |
| ජේ බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ජෝන්කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලංකා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එල් ඕ එල් සී සෙකියුරිටීස් ලිමිටඩ් |
| නේෂන් ලංකා ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එන් ඩී බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| නවාරා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් පෙර නිව් වර්ල්ඩ් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස හඳුන්වන ලද |
| රිචර්ඩ් පීරිස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් සී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සෙරන්ඩිබ් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සොෆ්ට් ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සමර්විල් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| තැප්‍රොබේන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ටී කේ එස් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| නැට් වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| ඇක්විටි සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| පර්පෙචුවල් සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |

## 2014 දෙසැම්බර් 31 වන දින වන විට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ඇති කොටස් වෙළෙන්දන්

| සමාගම |
|---|
| ඇක්විටි සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| බාට්ලීට් රෙලිගයා සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| කැපිටල් එලයන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී -(ණය සුරැකුම්පත්) |
| එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| ජේ බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| නැට්වෙල්ත් සෙකියුරිටීස් -(ණය සුරැකුම්පත්) |
| එන් එස් බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |
| සෙලාන් බැන්ක් පී එල් සී -(ණය සුරැකුම්පත්) |
| එස් එම් බී සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - (ණය සුරැකුම්පත්) |
| සෙරන්ඩිබ් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| සොෆ්ට් ලොජික් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් -(ණය සුරැකුම්පත්) |

# අතිරේක තොරතුරු

## ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන
2014 දෙසැම්බර් 31 වන දිනට

ආන්තික සැපයුම්කරුවන්, ආයෝජන කළමනාකරුවන් හා කොටස් ප්‍රාරක්ෂකයන් යන වර්ගීකරණයන් යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදි ආයතන පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| සමාගම | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන් | කොටස් ප්‍රාරක්ෂකයන් |
|---|---|---|---|
| ඇක්විටි පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | X | X |
| ඒඩීඑල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ඒඩීඑල් ඉක්විටීස් ලිමිටඩ් | X | | |
| අමානා කැපිටල් ලිමිටඩ් | | X | |
| ආර්පිකෝ ඇටරාසියා ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ආශා ෆයිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ් | X | | |
| ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ඇසෙට්ලයින් ලීසිං කම්පනි ලිමිටඩ් | X | | |
| ඇසෙට්ලයින් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ලංකා බැංකුව | | X | X |
| බාට්ලීට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| බාට්ලීට් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| බාට්ලීට් ට්‍රාන්ස් කැපිටල් ලිමිටඩ් | | X | X |
| කැන්ඩෝර් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| කැන්ඩෝර් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| කැපිටල් එලයන්ස් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| කැපිටල් එලයන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | | X | |
| කැපිටල් ට්‍රස්ට් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| කැපිටල් ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| සිලෝන් ගර්ඩියන් ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පී එල් සී | | | X |
| සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පී එල් සී | | | X |
| සිටිසන් ඩිවෙලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී | X | | X |
| කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ඩී එෆ් සී සී වර්ධන බැන්ක් පී එල් සී | X | | |
| ෆස්ට් කැපිටල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ෆස්ට් කැපිටල් මාර්කට්ස් ලිමිටඩ් | X | | |
| ජෝර්ජ් ස්ටුවර්ට් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| ගාර්ඩියන් ඇක්විටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| ගාර්ඩියන් ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| හැටන් නැෂනල් බැන්ක් පී එල් සී | X | | X |
| හොරයිසන් ඇසෙට් ලිමිටඩ් | | X | |
| සිලෝන් කැපිටල් මාර්කට් ඇඩ්වයිසර්ස් ලිමිටඩ් පෙර අයි අයි එෆ් එල් කැපිටල් සිලෝන් ලිමිටඩ් ලෙස පැවති | | X | |
| ඉනොවෙස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ජේ බී ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| ජේ බී ෆයිනෑන්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| කෙනන්ගා ඉන්වෙස්ට්මන්ට් කෝපරේෂන් ලිමිටඩ් | | X | |
| එල් බී ෆයිනෑන්ස් පී එල් සී | X | | |

| සමාගම | ආන්තික සැපයුම්කරුවන් | ආයෝජන කළමනාකරුවන් | කොටස් ප්‍රාරක්ෂකයන් |
|---|---|---|---|
| ලංකා ඔරික්ස් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| ලෙක්සින්ටන් ෆයිනෑන්සල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| ලයිනියර් වෙල්ත් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී | X | X | X |
| නේෂන් ලංකා කැපිටල් ලිමිටඩ් | X | | |
| නේෂන් ලංකා ඉක්විටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| නැෂනල් ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී | X | | |
| නැෂනල් වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් | | X | |
| එන් ඩී බී කැපිටල් හෝල්ඩිංග්ස් පී එල් සී | | | X |
| එන් ඩී බී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | | X | |
| බෙන්සෙයි සෙකියුරිටීස් ෆයිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, පෙර එන් ඩබ් එස් ෆයිනෑන්සල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් හඳුන්වන ලද | X | | |
| එන් ඩබ් එස් මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| ශන්වෙස්ට්‍රස්ට් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් පෙර ඔරියන්ට් වෙල්ත් ලිමිටඩ් නමින් හඳුන්වන ලද | | X | |
| ඔරියන් ෆන්ඩ් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී | X | | |
| පීපල්ස් බෑන්ක් | | X | |
| පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| රිචර්ඩ් පීරිස් ෆයිනෑන්ෂල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | X | | |
| සම්පත් බෑන්ක් පී එල් සී | X | | X |
| සණස ඇසෙට් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | | X | |
| සෙලාන් බෑන්ක් පී එල් සී | X | | |
| සොෆ්ට් ලොජික් කැපිටල් පී එල් සී | | X | |
| සොෆ්ට් ලොජික් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| ටී කේ එස් ෆයිනෑන්ස් පී එල් සී | X | | |
| යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී | X | | |
| වර්ල්ඩොක් මැකෙන්සී ලිමිටඩ් | X | X | |
| ජී අයි එච් කැපිටල් ලිමිටඩ් | | X | |
| නවාරා කැපිටල් පාට්නර්ස් ලිමිටඩ් | | X | |
| ට්‍රිලියන් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් | | X | |

**සුරැකුම්පත් නිෂ්කාශන ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්**

මධ්‍යම තැන්පතු ක්‍රම පෞද්ගලික සමාගම

**ණය ප්‍රමාණිකරණ ආයතන යන වර්ගීකරණය යටතේ ලියාපදිංචි වෙළෙඳපොළ අතරමැදියන්**

- ෆිච් රේටිංස් ලංකා ලිමිටඩ්
- රැම් රේටිංස් ලංකා ලිමිටඩ්
- ඉක්රා ලංකා ලිමිටඩ්

# දත්ත ගොනුව

| වසර | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| **කොටස් වෙළෙඳපොළ** | | | | | | |
| වාර්ෂික කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 142,462.65 | 570,326.82 | 546,255.80 | 213,827.2 | 200,467.8 | **340,917.1** |
| දේශීය (රුපියල් මිලියන) | 99,010.83 | 464,733.62 | 486,959.40 | 160,543.3 | 128,227.6 | **246,796.8** |
| විදේශීය (රුපියල් මිලියන) | 43,451.82 | 105,593.20 | 59,296.40 | 53,283.9 | 72,240.2 | **94,120.3** |
| වෙළෙඳපොළ දින | 240 | 238 | 239 | 242 | 242 | **241** |
| දෛනික සාමාන්‍ය කොටස් පිරිවැටුම (රුපියල් මිලියන) | 593.6 | 2,396.33 | 2,285.60 | 883.6 | 828.4 | **1,414.6** |
| ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 4,762.70 | 18,489.19 | 24,543.70 | 9,691.2 | 9,054.2 | **16,722** |
| දේශීය (මිලියන) | 3,784.20 | 16,684.45 | 23,151.60 | 8,289.6 | 7,861.6 | **14,726** |
| විදේශීය (මිලියන) | 978.42 | 1,804.74 | 1,392.10 | 1,401.7 | 1,192.6 | **1,995** |
| ගණුදෙනු සංඛ්‍යාව | 1,266,299 | 3,355,126 | 4,579,352 | 1,857,384 | 1,421,303 | **1,982,709** |
| දේශීය | 1,190,822 | 3,225,041 | 4,463,404 | 1,796,868 | 1,355,380 | **1,899,569** |
| විදේශීය | 75477 | 130,085 | 115,948 | 60,516 | 65,923 | **83,140** |
| නව ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 3 | 10 | 32 | 17 | 2 | **7** |
| ලේඛනයෙන් බැහැරවීම් සංඛ්‍යාව | 6 | 1 | 0 | 2 | 1 | **3** |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 231 | 241 | 272 | 287 | 289 | **294** |
| ගණුදෙනු වූ සමාගම් සංඛ්‍යාව | 231 | 238 | 265 | 280 | 278 | **284** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් මිලියන) | 1,092.10 | 2,210.45 | 2,213.90 | 2,167.6 | 2,459.9 | **3,104.9** |
| වසර අවසානයේ වෙළෙඳපොළ මිල ඉපයුම් අනුපාතය (වාර ගණන) | 16.6 | 25.16 | 15.8 | 15.9 | 15.9 | **19.7** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයේ ප්‍රතිශතයක් ලෙස මුළු පිරිවැටුම (%) | 18 | 34.5 | 24.7 | 9.8 | 8.7 | **12.3** |
| වසර අවසානයේ ලාභාංශ එලදාව (%) | 3 | 1.16 | 1.8 | 2.4 | 2.9 | **2.1** |
| වසර අවසානයේ මිල පොත් අගය (වාර ගණන) | 1.7 | 2.98 | 2 | 2.1 | 2 | **2.2** |
| දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (%) | 22.6 | 39.4 | 33.8 | 28.6 | 32.4 | **31.0** |
| **මිල දර්ශක** | | | | | | |
| සියලු කොටස් මිල දර්ශකය | 3,385.55 | 6,635.87 | 6,074.40 | 5,643.0 | 5,912.80 | **7,299.0** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 125.25 | 96.01 | (8.5) | (7.1) | 4.8 | **23.4** |
| මිලංක මිල දර්ශකය | 3,849.38 | 7,061.46 | 5,229.20 | 5,119.1 | - | - |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 135.97 | 83.44 | (25.9) | (2.1) | - | - |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 | | | | 3085.3 | 3,263.90 | **4,089.1** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | | | | | 5.8 | **25.3** |
| **මුළු ප්‍රතිලාභ දර්ශක** | | | | | | |
| සියලු කොටස් මුළු ප්‍රතිලාභ දර්ශකය | 3,944.90 | 7,899.11 | 7,362.83 | 7037.3 | 7,584.40 | **9,579.2** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 121.18 | 100.24 | (6.79) | (4.4) | 7.8 | **26.3** |
| මිලංක මුළු ප්‍රතිලාභ දර්ශකය | 4,506.24 | 8,481.73 | 6,393.00 | 6399.4 | - | - |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | 129.6 | 88.22 | (24.63) | 0.1 | | - |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 මුළු ප්‍රතිලාභ දර්ශකය | | | | 3,780.4 | 4,132.4 | **5,331.1** |
| වාර්ෂික වෙනස්වීම් ප්‍රතිශතය (%) | | | | | 9.3 | **29.0** |

| වසර | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|---|
| **විදේශීය ක්‍රියාකාරකම්** | | | | | | |
| වාර්ෂික පිරිවැටුම (රුපියල් මිලියන) | 43,451.82 | 105,593.20 | 59,296.40 | 53,283.9 | 72,240.20 | **94,120.3** |
| මිල දී ගැනුම් (රුපියල් මිලියන) | 43,057.32 | 92,425.53 | 49,776.80 | 72,614.2 | 83,607.00 | **104,689.8** |
| විකුණුම් (රුපියල් මිලියන) | 43,846.32 | 118,760.87 | 68,816.00 | 33,953.6 | 60,873.30 | **83,550.8** |
| ශුද්ධ විදේශීය ගලා ඒම් | (789) | (26,335.34) | (19,039.20) | 38,660.7 | 22,733.70 | **21,139.0** |
| ගණුදෙනු වූ කොටස් සංඛ්‍යාව (මිලියන) | 978.41 | 1,804.74 | 1,392.11 | 1,401.7 | 1,192.60 | **1,995** |
| මිල දී ගැනුම් (මිලියන) | 908.97 | 1,541.49 | 1,186.80 | 1,520.6 | 1,282.50 | **2,381** |
| විකුණුම් (මිලියන) | 1,047.87 | 2,067.99 | 1,597.42 | 1,282.7 | 1,102.6 | **1,610** |
| ගණුදෙනු සංඛ්‍යාව | 75,477 | 130,085 | 115,948 | 60,516 | 65,923.0 | **83,140** |
| මිල දී ගැනුම් | 69,431 | 115,071 | 112,246 | 71,944 | 77,511.0 | **94,752** |
| විකුණුම් | 81,523 | 145,100 | 119,651 | 49,088 | 54,335.0 | **71,529** |
| **ණයකර වෙළෙඳපොළ** | | | | | | |
| **සාංගමික ණයකර** | | | | | | |
| මුළු පිරිවැටුම (රුපියල් 000) | 136,765 | 72,288 | 2,690,664.40 | 75,717.1 | 2,229,221.3 | **7,139,730.4** |
| ගණුදෙනු සංඛ්‍යාව | 42 | 92 | 62 | 39 | 173 | **401** |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය (000) | 1,020 | 693 | 25,861 | 740.4 | 19,998.8 | **56,909** |
| වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (මිලියන) | N/A | N/A | | 46,311.0 | N/A | **N/A** |
| **රාජ්‍ය ණයකර** | | | | | | |
| මුළු පිරිවැටුම (රුපියල් 000) | 98,977 | 45,673 | 28,356.80 | 6,128.0 | | |
| ගණුදෙනු සංඛ්‍යාව | 42 | 18 | 7 | 2 | | |
| ගණුදෙනු වූ ණයකර ප්‍රමාණය (000) | 102,778 | 46,794 | 28,912 | 6,743.6 | | |
| **ඒකක භාර** | | | | | | |
| ශුද්ධ වත්කම් වටිනාකම (රුපියල් මිලියන) | 9,952 | 22,228 | 24,059 | 31,062 | 54,304 | **127,356** |
| ඒකක හිමියන් සංඛ්‍යාව | 23,117 | 24,649 | 26,636 | 27,952 | 29,648 | **32,619** |
| නිකුත් කර ඇති ඒකක සංඛ්‍යාව (000) | 564,500 | 1,159 | 1,506 | 2,251 | 4,134 | **9,772** |
| කොටස්වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 6,036 | 11,349 | 9,555 | 8,944 | 9,453 | **14,591** |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති ප්‍රමාණය (රුපියල් මිලියන) | 3,363 | 9,289 | 10,326 | 5,449 | 17,825 | **60,897** |
| අනෙකුත් ආයෝජන උපකරණවල ආයෝජනය කර ඇති ප්‍රමාණය** (රුපියල් මිලියන) | 1,106 | 1,223 | 4,186 | 16,596 | 27,000 | **52,202** |

*තොරතුරු : කොළඹ කොටස් වෙළෙඳපොළ, ඒකක භාර කළමනාකරණ සමාගම්, වාණිජ පත්‍ර, තැන්පතු සහතික, බැඳුම්කර හා බැංකු තැන්පතු*

# මූල්‍ය ප්‍රකාශන

**මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**


විගණකාධිපති වාර්තාව 62
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 64
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 65
සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 66
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 67
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සෙස් අරමුදල 68
මුදල් ප්‍රවාහ ප්‍රකාශය - වන්දි අරමුදල 69
ගිණුම්කරණ ප්‍රතිපත්තීන් 70
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 72


**මූල්‍ය ප්‍රකාශන - පියවීම සහතික කිරීමේ අරමුදල**


විගණකාධිපති වාර්තාව 82
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 84
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 85
ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 86
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 87
ගිණුම්කරණ ප්‍රතිපත්ති 88

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/කේ/එස්ඊසී/1/14/3 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2015 ජුනි 08 දින

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදා ළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**මතය**

**------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**පාර්ලිමේන්තුවට වාර්තා කිරීම**

**---------------------------------**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කරනු ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | **53,079,602** | 47,739,360 |
| සෙස් අරමුදල | 2 | **49,057,155** | 48,664,796 |
| ජංගම වත්කම් | | | |
| තොග | 4 | **984,316** | 934,534 |
| ලැබිය යුතු දෑ | 5 | **5,432,548** | 2,663,416 |
| සෙස් අරමුදල | 2 | **2,398,681,457** | 2,144,578,340 |
| වන්දි අරමුදල | 3 | **293,242,099** | 267,950,575 |
| තැන්පතු, අත්තිකාරම් සහ පූර්ව ගෙවීම් | 6 | **6,210,649** | 8,000,888 |
| මුදල් හා මුදල් සමාන දේ | 7 | **19,805,415** | 24,811,873 |
| **මුළු වත්කම්** | | **2,826,493,242** | 2,545,343,782 |
| අරමුදල් සහ වගකීම් | | | |
| යෙදූ වූ අරමුදල් සහ සංචිත | | | |
| සමුච්චිත අරමුදල | 8 | **(16,838,197)** | 6,352,068 |
| සෙස් අරමුදල | 9 | **2,447,738,612** | 2,193,243,136 |
| වන්දි අරමුදල | 10 | **293,242,099** | 267,950,575 |
| ජංගම නොවන වගකීම් | | | |
| ප්‍රදාන - ප්‍රාග්ධන වියදම සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම | 12 | **48,675,770** | 42,207,192 |
| විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වන බැඳීම් | 13 | **23,146,179** | 21,606,766 |
| ජංගම වගකීම් | | | |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | 14 | **26,129,963** | 8,807,432 |
| පූර්ව ලැබීම් | | **4,398,816** | 4,418,064 |
| කල්බදු ණය හිමියෝ | 11 | **-** | 758,549 |
| **මුළු අරමුදල් සහ වගකීම්** | | **2,826,493,242** | 2,545,343,782 |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයන් සතු වේ.

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සඳහා සහ ඒ වෙනුවෙන්,

**වජිර විජේගුණවර්ධන**
*අධ්‍යක්ෂ ජනරාල්*
*ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව*

**තිලක් කරුණාරත්න**
*සභාපති*
*ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව*

කොළඹදී ය.
2015 මැයි 28 වෙනි දිනදීය.

## මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| ආදායම් | | | |
| තැරැව්කාර බලපත්‍ර ගාස්තු | | **5,366,368** | 4,163,816 |
| පරිපාලන බදු | | **2,460,174** | 3,225,066 |
| අධ්‍යාපන වැඩ සටහන් | | **4,614,910** | 7,009,985 |
| සම්මන්ත්‍රණ ගාස්තු-අනෙකුත් | | **846,430** | - |
| ප්‍රකාශන විකුණුම් | | **57,700** | 144,350 |
| විවිධ ආදායම් | | **11,579** | 16,506 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ | | **906,683** | (11,032) |
| ප්‍රදාන පිළිගැනීම | 12 | **15,804,195** | 15,276,487 |
| මුළු ආදායම් | | **30,068,039** | 29,825,178 |
| වියදම් | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(166,060,617)** | (159,203,688) |
| පරිපාලන හා ආයතනික පිරිවැය | 16 | **(108,071,048)** | (110,011,824) |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වියදම් | 17 | **(102,721,061)** | (66,228,055) |
| මූල්‍ය ගාස්තු | 18 | **(83,805)** | (85,112) |
| මුළු වියදම් | | **(376,936,531)** | (335,528,679) |
| වර්ෂය සඳහා ආදායමට වැඩි අතිරික්ත වියදම් | | **(346,868,492)** | (305,703,501) |
| මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | **333,678,227** | 318,547,041 |
| අතිරික්තය/(හිඟය) | | **(13,190,265)** | 12,843,540 |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසක් වේ.

## සංචිතවල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | සංචිත<br>රු. | සමුච්චිත<br>අරමුදල<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | | - | 9,508,528 | 9,508,528 |
| පූර්ව වර්ෂ ගැලපීම්- CMET ආදායම හඳුනා ගැනීමේ වෙනස | | - | - | 0 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කළ අරමුදල් | | - | (16,000,000) | (16,000,000) |
| | | - | (6,491,472) | (6,491,472) |
| වර්ෂය තුළ ආදායමට වැඩි අතිරික්ත වියදම් | | - | (305,703,501) | (305,703,501) |
| සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | - | 318,547,041 | 318,547,041 |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | - | 12,843,540 | 12,843,540 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | | 6,352,068 | 6,352,068 |
| | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | | - | 6,352,068 | 6,352,068 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කිරීම් | | - | (10,000,000) | (10,000,000) |
| | | - | (3,647,932) | (3,647,932) |
| වර්ෂය තුළ ආදායමට වැඩි අතිරික්ත වියදම | | - | (346,868,492) | (346,868,492) |
| සෙස් අරමුදලෙන් මාරු කිරීම් | | - | 333,678,227 | 333,678,227 |
| වර්ෂය සඳහා අතිරික්තය /(හිඟය) | | - | (13,190,265) | (13,190,265) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | | - | (16,838,197) | (16,838,197) |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| සෙස් අරමුදලෙන් මාරු කිරීමෙන් පසු ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **(13,190,265)** | 12,843,540 |
| ගැලපීම් | | | |
| ක්ෂය වීම් | 1 | **16,116,695** | 16,026,487 |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද (ලාභ)/ පාඩු | | **(906,683)** | 11,032 |
| ප්‍රදානයන් පිළිගැනීම | 12 | **(15,804,195)** | (15,276,487) |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 13 | **3,585,799** | 2,997,885 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **(10,198,649)** | 16,602,457 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම | | | |
| තොග (වැඩිවීම)/ අඩුවීම | | **(49,782)** | (305,650) |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/ අඩුවීම | | **(2,769,132)** | (879,036) |
| තැන්පතු, අත්තිකාරම් හා පූර්ව ගෙවීම් (වැඩිවීම)/ අඩුවීම | | **1,790,239** | (3,085,886) |
| පූර්ව ලැබීම් වැඩිවීම/ (අඩුවීම) | | **(19,248)** | 179,922 |
| ණයහිමියන් සහ උපචිත වියදම් වැඩිවීම/ (අඩුවීම) | | **17,322,531** | 2,348,662 |
| | | **16,274,607** | (1,741,988) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් උත්පාදිත මුදල් | | **6,075,958** | 14,860,469 |
| වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂික | | **(2,046,386)** | (1,403,316) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් | | **4,029,572** | 13,457,153 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම් | 1 | **(22,272,773)** | (7,432,959) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කිරීම් | | **(10,000,000)** | (16,000,000) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලද මුදල | | **1,722,518** | 68,552 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් | | **(30,550,255)** | (23,364,407) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා සෙස් අරමුදලෙන් මාරු කිරීම් | 12 | **22,272,773** | 7,432,959 |
| මූල්‍ය කල්බදු වැඩිවීම/ (අඩුවීම) | | **(758,549)** | (819,616) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/ (භාවිතා වූ) ශුද්ධ මුදල් | | **21,514,224** | 6,613,343 |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | | **(5,006,458)** | (3,293,911) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ) | | **24,811,873** | 28,105,784 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ආ) | | **19,805,415** | 24,811,873 |
| සටහන අ | | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | | |
| බැංකුවේ ඇති මුදල් | | **24,771,873** | 28,065,784 |
| අතැති මුදල් | | **40,000** | 40,000 |
| | | **24,811,873** | 28,105,784 |
| සටහන ආ | | | |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | | |
| බැංකුවේ ඇති මුදල් | 7 | **19,765,415** | 24,771,873 |
| අතැති මුදල් | 7 | **40,000** | 40,000 |
| | | **19,805,415** | 24,811,873 |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය - සෙස් අරමුදල
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| සෙස් අරමුදලේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **254,495,476** | 96,148,212 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **254,495,476** | 96,148,212 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම | | |
| කාර්ය මණ්ඩල ණය (වැඩිවීම)/අඩුවීම | **565,718** | 484,191 |
| ලැබිය යුතු සෙස් අරමුදල් (වැඩිවීම)/අඩුවීම | **470,755** | (1,168,813) |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | **216,659** | (216,659) |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **45,399,605** | (84,209,335) |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **(20,239,782)** | 86,464,170 |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙන් ලැබිය යුතු ප්‍රාග්ධන ලාභ (වැඩි වීම)/ අඩු වීම | **-** | 107,627 |
| කුලී තැන්පතු (වැඩිවීම)/අඩුවීම | **(1,183,908)** | (11,408,568) |
| උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම) | **(11,771)** | 11,771 |
| | **25,217,276** | (9,935,616) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ / (භාවිතා වූ) ශුද්ධ මුදල්** | **279,712,752** | 86,212,596 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලෙහි ආයෝජනය | **(13,578,193)** | (25,096,023) |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | **(171,679,656)** | 956,679,446 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | **(92,770,631)** | (1,021,000,241) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ / (භාවිතා වූ) ශුද්ධ මුදල්** | **(278,028,480)** | (89,416,818) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **1,684,272** | (3,204,222) |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ) | **5,499,017** | 8,703,239 |
| **වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඇ)** | **7,183,289** | 5,499,017 |
| සටහන ඇ | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | **1,759,017** | 2,193,239 |
| දෛනික ප්‍රතිමිල දී ගැනීම් මත ආයෝජන | **3,740,000** | 6,510,000 |
| | **5,499,017** | 8,703,239 |
| සටහන ඇ | | |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | **4,883,289** | 1,759,017 |
| දෛනික ප්‍රති මිලදී ගැනීම් මත ආයෝජනය | **2,300,000** | 3,740,000 |
| | **7,183,289** | 5,499,017 |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසක් වේ.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය - වන්දි අරමුදල
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| වන්දි අරමුදලේ ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **25,291,524** | 30,488,889 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | **25,291,524** | 30,488,889 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම | | |
| අනෙකුත් ගෙවිය යුතු වියදම් වැඩිවීම/(අඩුවීම) | **(15,863)** | 15,863 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **(51,370)** | 15,294,372 |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **7,115,333** | (14,177,989) |
| | **7,048,100** | 1,132,246 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/(භාවිතා වූ) ශුද්ධ මුදල්** | **32,339,624** | 31,621,135 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | |
| භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනය | **(44,608,391)** | 111,573,749 |
| ස්ථාවර තැන්පතු මත ආයෝජනය | **12,253,245** | (143,182,471) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ/(භාවිතා වූ) ශුද්ධ මුදල් | **(32,355,146)** | (31,608,722) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/ (අඩුවීම) | **(15,522)** | 12,413 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඉ) | **100,000** | 87,587 |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ (සටහන ඊ) | **84,478** | 100,000 |
| සටහන ඉ | | |
| වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | **100,000** | 62,218 |
| ඒක්ෂණ තැන්පතු | **-** | 25,369 |
| | **100,000** | 87,587 |
| සටහන ඊ | | |
| වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | |
| බැංකුවේ ඇති මුදල් | **84,478** | 100,000 |
| | **84,478** | 100,000 |

70 සිට 81 දක්වා පිටුවල අඩංගු වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසක් වේ.

## ගිණුම්කරණ ප්‍රතිපත්තීන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

### 1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 1.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යනු ලාභ උපයනු නොලබන ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකසා තිබේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයින් වගකිව යුතු වේ.

#### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සැලකිය යුතු අනාගත කාලයක් සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යෑමට ඇති හැකියාව කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් තක්සේරු කර ඇත. දැනගත හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩවම සිදු කිරීම පිණිස ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කොමිෂන් සභාවේ සාමාජිකයින්ට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මෙහෙයුම් කටයුතු ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි. ඒ අනුව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව එහි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පදනම මත පිළියෙල කිරීම සිදු කරයි.

#### 1.4 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත, ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකසා ඇති අතර, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුයාත සටහන් මගින් හෙළිදරව් කර ඇත.

#### 1.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ මුදල් හුවමාරු ගණුදෙනුවල දී ගණුදෙනුව සිදුවන අවස්ථාවේ පවතින විදේශ මුදල් හුවමාරු අනුපාතයට අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලබයි.

#### 1.6 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම්වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් හා හෙළිදරව් කිරීම් අවශ්‍ය තැන්හි දී යෝග්‍ය පරිදි සිදු කරනු ඇත.

#### 1.7 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම

යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමග සංගත වේ.

#### 1.8 සංසන්දනාත්මක අගයන්

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත් වන ආකාරයෙන් වෙනස්කම්වලට යෝග්‍ය පරිදි ගැලපීම් සිදු කර තිබේ.

### 2. වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

#### 2.1 දේපළ, පිරියත හා උපකරණ

**2.1.1 හිමිකම් සහිත දේපළ, පිරියත හා උපකරණ**

දේපළ, පිරියත හා උපකරණ ඒවායෙහි අනෙකුත් ආනුශංගික වියදම් ද සමග පිරිවැයට සටහන් කර ඇති අතර, ඒවායේ ප්‍රයෝජනවත් ආයු කාලය සලකා බලා ක්ෂය කිරීම සිදු කරයි. ප්‍රදානයන් වශයෙන් ලද ස්ථාවර වත්කම් පිරිවැයට ගිණුම්ගත කර අදාළ ක්ෂය කිරීම සංචිත ගිණුම්වලට අය කර ඇත. ඒ අනුව ආයතනයෙහි පහත සඳහන් වත්කම් සරල මාර්ග ක්‍රමය මගින් ඒවායෙහි ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය පුරා පහත සඳහන් අනුපාතයන් අදාළ කර ගනිමින් ක්ෂයවීම් සිදු කරයි.

| | |
|---|---|
| මෝටර් රථ | 10% |
| කල් බදු මෝටර් රථ | 25% |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා උපකරණ | 12.5% |
| කාර්යාලයීය උපකරණ හා විද්‍යුත් දත්ත සැකසීමේ උපකරණ | 20% |
| පුහුණු කිරීමේ උපකරණ | 20% |

සියලුම මිලට ගත් වත්කම් භාවිතයට ගත් දිනයේ සිට විකුණනු ලබන දිනය දක්වා ක්ෂය කිරීම සිදු කෙරේ.

#### 2.2 මෝටර් වාහන - කල්බදු

2002 වර්ෂයේ හඳුන්වා දුන් කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය යටතේ, සභාය අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඊට ඉහළ කාර්ය මණ්ඩලය තම පාරිශ්‍රමිකයෙහි කොටසක් ලෙස වාහනයක් ලැබීම සඳහා සුදුසුකම් ලබයි. එහෙත් 2012 වසර තුළ දී කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් ගනු ලැබූ තීරණයකට පසුව 2012 වර්ෂයෙන් පසුව කරනා නව බඳවා ගැනීම් සඳහා මෙම යෝජනා ක්‍රමය අදාළ නොවේ. 2014 වර්ෂය අවසානයේ දී ඉහත කී පහසුකම සඳහා සුදුසුකම් ලබන එහෙත් එය භාවිතා නොකළ කාර්ය මණ්ඩල සාමාජිකයින් ගණන හතර දෙනෙකි.

සියලුම අවදානම් සහ ප්‍රතිලාභයන් හිමිකාරීත්වය සමග ආනුශංගික වූ මූල්‍ය කල්බදු පදනම මත ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත පවරන ලද වත්කම් ඒවායේ මුදල් පිරිවැයට ප්‍රාග්ධන ගත කරනු ලැබේ. එසේ කල්බදු අයිතිය යටතේ වන වත්කම් තුළින් උද්ගතවන ක්ෂය සහ මූල්‍ය ගාස්තු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට 'හර' වන අතර, කල්බදු කුලී ගෙවීම, කල්බදු වගකීම්, අඩු කිරීම සඳහා හඳුනාගෙන ඇත.

මෙහිදී ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව කල්බදු වාරිකය ගෙවන අතර, අදාළ කාර්ය මණ්ඩල සාමාජිකයා කල්බදු වාරිකයට දායකත්වය සැපයිය යුතුය. මෙයට අමතරව, බලපත්‍ර ගාස්තු සහ වාහන නඩත්තුවට අදාළ සියලුම වියදම් එකී කාර්ය මණ්ඩල සාමාජිකයා විසින් දැරිය යුතු වේ. කල්බදු හිමිකමෙහි ප්‍රමාණයට වූ රක්ෂණ පිරිවැය ද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් ගෙවනු ඇත. වාහනේ අයිතිය පැවරීම කල්බදු දායකත්ව යෝජනා ක්‍රමය සඳහා දායක වූ කාර්ය මණ්ඩල සාමාජිකයා වෙත කල්බදු වාරික සියල්ල අවසන් වන මාස 48 කාලය අවසානයේ දී හෝ සාමාජිකයා විසින් කල්බදු වගකීම් සම්පූර්ණ වශයෙන් ගෙවා නිම කිරීමෙන් පසු පමණක් සිදු කෙරේ. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ ඉහත සඳහන් යෝජනා ක්‍රමය යටතේ තිබූ අවසන් මෝටර් රථය ද එම ක්‍රමය යටතේ අනුදන්වා ඇති පරිදි එහි කල්බදු කාල සීමාව අවසන් වීමට මාස කිහිපයකට පෙර සමාපනය කරන ලදී. සංගතතාවය පවත්වා ගැනීම සඳහා කල්බදු වාහන මුලින් තීරණය කළ 25% ක ක්ෂය කිරීම ඉහත සඳහන් මෝටර් රථය සඳහා ද අදාළ කර ගන්නා ලදී.

#### 2.3 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකු සහ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන සිදු කරනු ලබන අතර, පිරිවැය යටතේ දක්වනු ලැබේ.

### 2.4 තොග
තොගවල අගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකින් අඩු අගය යටතේ ය. තොග පිරිවැය ගණනය කිරීම, පෙර පිවිසුම් පෙර නිකුත් කිරීම් (FIFO) පදනම යටතේ සිදු කෙරේ.

ලෝකයේ වේගයෙන් වෙනස් වෙමින් පවතින වෙළෙඳපොළ තත්ත්වයන් හේතු කොට ගෙන ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ නීති රීති ද වේගයෙන් වෙනස් වීමට භාජනය වන බැවින් ප්‍රතිපත්තියක් ලෙස පුස්තකාල පොත්වලට අදාළ අගයන් කපා හැර තිබේ.

### 2.5 ලැබිය යුතු දෑ
ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට ලැබිය යුතු දෑ සටහන් කර ඇත.

## 3. වගකීම් හා ප්‍රතිපාදන
**3.1.1 විශ්‍රාමික ප්‍රතිලාභ**
1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම පිළිබඳ වගකීම පැන නගින්නේ ඔහු / ඇය අදාළ ආයතනයේ අඛණ්ඩව වසර පහක් සේවයේ නියුක්තව සිටියහොත් පමණි. මෙම වගකීම ඉටු කිරීමෙහිලා වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියලුම සේවකයින් සඳහා මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ ඔහුගේ වේතනයෙන් හරි අඩක් සැලකිල්ලට ගෙන අදාළ ප්‍රතිපාදනය ගණනය කරනු ලැබේ.

**3.1.2 නිශ්චිත දායක මුදල් සැලසුම**
ආයතනයේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබන අතර, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සේවකයාගේ මූලික වැටුපෙන් පිළිවෙලින් 12% හා 3% ක් මේ සඳහා දායක කරනු ලැබේ.

### 3.2 ගෙවිය යුතු ගිණුම්
ගෙවිය යුතු ගිණුම් පිරිවැය යටතේ ගණනය කෙරේ.

### 3.3 ප්‍රදාන
සෙස් අරමුදල මගින් මාරු කරනු ලබන ප්‍රාග්ධන වියදම් ප්‍රදානයන් වශයෙන් සලකා ක්‍රමවත් පදනමක් මත අදාළ වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය තුළ මූල්‍ය කාර්ය ප්‍රකාශයේ ආදායමක් ලෙස හඳුනා ගැනේ.

## 4. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
### 4.1 ආදායම් හඳුනා ගැනීම
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙහි ආදායම, තැරැව්කරුවන්ගේ බලපත්‍ර ගාස්තු, පරිපාලන අය බදු, ප්‍රකාශන අලෙවි කිරීම්, සම්මන්ත්‍රණ ආදායම් සහ අධ්‍යාපන වැඩ සටහන් ආදායම් යනාදියෙන් සමන්විත වේ. ඉහත සඳහන් සේවාවන්/ගාස්තුවලින් වන ආදායම අදාළ සේවාවන් ඉටු කරනු ලබන කාල පරිච්ඡේදය තුළදී ම හඳුනා ගැනේ.

### 4.2 ආයෝජන මත පොළිය
ආයෝජන මත පොළිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.3 අනෙකුත් ආදායම්
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 5. වියදම් හඳුනා ගැනීම
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව පවත්වාගෙන යාමෙහිලා දරනු ලබන සියලු වියදම් උපචිත පදනම මත හඳුනා ගන්නා අතර, එම වියදම් මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේ දී ආදායමෙන් අඩු කර පෙන්වයි.

## 6. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කොට ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දේ, අතැති මුදල්, සහ බැංකු ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ.

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

1 දේපළ පිරියත හා උපකරණ

| | මෝටර් වාහන රු. | ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ රු. | කාර්යාල උපකරණ සහ දත්ත සැකසුම් උපකරණ රු. | පුහුණු කිරීමේ උපකරණ රු. | මූල්‍ය කල්බදු වත්කම් (මෝටර් රථ) රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 31,753,186 | 25,315,735 | 83,877,952 | 3,723,801 | 3,000,000 | 147,670,674 |
| වර්ෂය තුළ අනුකාණ්ඩ අතර මාරු කිරීම් | - | 46,800 | (135,848) | 89,048 | - | - |
| වර්ෂය තුළ එකතු කිරීම් | 6,548,500 | 7,394,119 | 8,330,155 | - | - | 22,272,773 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (3,700,000) | (3,501,459) | (4,205,915) | (189,356) | (3,000,000) | (14,596,730) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 34,601,686 | 29,255,195 | 87,866,344 | 3,623,493 | - | 155,346,718 |
| සමුච්චිත ක්ෂයවීම් | | | | | | |
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 19,900,460 | 19,131,975 | 55,611,447 | 2,912,432 | 2,375,000 | 99,931,315 |
| වර්ෂය තුළ අනුකාණ්ඩ අතර මාරු කිරීම් | - | 46,800 | (133,121) | 86,321 | - | - |
| වර්ෂය සඳහා අය කිරීම් | 2,045,222 | 3,053,637 | 10,427,070 | 278,265 | 312,500 | 16,116,695 |
| වර්ෂය තුළ ඉවත් කිරීම් | (3,700,000) | (3,047,934) | (4,156,105) | (189,356) | (2,687,500) | (13,780,894) |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 18,245,683 | 19,184,479 | 61,749,292 | 3,087,662 | - | 102,267,116 |
| 2014 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 16,356,003 | 10,070,716 | 26,117,052 | 535,831 | - | 53,079,602 |
| 2013 දෙසැම්බර් 31 දිනට ලියා හල අගය | 11,852,726 | 6,183,760 | 28,266,505 | 811,368 | 625,000 | 47,739,360 |
| ප්‍රයෝජනවත් ආයු කාලය (වසර ගණන) | 10 | 8 | 5 | 5 | 4 | |

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **2 සෙස් අරමුදල** | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| කාර්ය මණ්ඩල ණය | | **19,244,199** | 20,035,748 |
| කුලී තැන්පතු | | **29,812,956** | 28,629,048 |
| | | **49,057,155** | 48,664,796 |
| ජංගම වත්කම් | | | |
| රාජ්‍ය ආයතන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදලේ ආයෝජනය | | **220,165,512** | 206,587,319 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | **956,999,661** | 785,320,005 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | **1,113,770,872** | 1,021,000,241 |
| | | **2,290,936,045** | 2,012,907,565 |
| මාස 12 කාලය තුළ ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | | **5,487,932** | 5,262,101 |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය | | **38,809,730** | 84,209,335 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය | | **53,996,276** | 33,756,494 |
| ලැබිය යුතු සෙස් අරමුදල් | | **2,268,185** | 2,738,940 |
| ලැබිය යුතු දෑ - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | | **-** | 216,659 |
| බැංකුවේ ඇති ශේෂය | | **7,183,289** | 5,499,017 |
| | | **107,745,412** | 131,682,546 |
| | | **2,398,681,457** | 2,144,590,111 |
| **මුළු වත්කම්** | | **2,447,738,612** | 2,193,254,907 |
| වගකීම් | | | |
| ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව වෙත කළ යුතු ගෙවීම් | | **-** | 11,771 |
| **ශුද්ධ වත්කම්** | | **2,447,738,612** | 2,193,243,136 |
| **3 වන්දි අරමුදල** | | | |
| ජංගම වත්කම් | | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | **152,583,879** | 107,975,488 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | **130,929,226** | 143,182,471 |
| | | **283,513,105** | 251,157,959 |
| භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොළිය | | **2,581,860** | 2,530,490 |
| ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය | | **7,062,656** | 14,177,989 |
| බැංකුවේ ඇති ශේෂය | | **84,478** | 100,000 |
| | | **9,728,994** | 16,808,479 |
| **මුළු වත්කම්** | | **293,242,099** | 267,966,438 |
| වගකීම් | | | |
| ශ්‍රී ලංකා සු.හා.වි.කො.ස වෙත කළ යුතු ගෙවීම් | | **-** | 15,863 |
| **ශුද්ධ වත්කම්** | | **293,242,099** | 267,950,575 |

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **4 තොග** | | | |
| ලිපිද්‍රව්‍ය, මුද්‍රණ සහ විදුලි පාරිභෝගික උපකරණ තොගය | | **984,316** | 934,534 |
| | | **984,316** | 934,534 |
| **5 ලැබිය යුතු දෑ** | | | |
| හර පත්‍රිකා ඇතුළු විවිධ ණයගැතියෝ | | **1,250,949** | 115,338 |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය | | | |
| ඉදිරි වර්ෂය තුල ලැබිය යුතු | | **1,505,100** | - |
| ඉදිරි වර්ෂයට පසු ලැබිය යුතු | | **203,900** | - |
| දුරකථන අත්තිකාරම් | | **331,192** | 680,890 |
| උත්සව අත්තිකාරම් | | **2,126,000** | 1,790,000 |
| ලැබිය යුතු එකතු කළ අගය මත බදු | | **-** | 61,781 |
| ලැබිය යුතු රක්ෂණ හිමිකම් | | **15,407** | 15,407 |
| | | **5,432,548** | 2,663,416 |
| **6 තැන්පතු, අත්තිකාරම් සහ පෙර ගෙවීම්** | | | |
| සුරක්ෂිතාගාර තැන්පතු-ලංකා බැංකුව | | **45,058** | 40,726 |
| ඉන්ධන තැන්පතු | | **60,000** | 60,000 |
| වාහන නඩත්තු සඳහා තැන්පතු | | **500** | 500 |
| ටෙලිකොම් සමාගම වෙත ඇති තැන්පතු | | **42,125** | 42,125 |
| ඩයලොග් සමාගම වෙත ඇති තැන්පතු | | **9,000** | 9,000 |
| උණු සහ ශීත ජලය ලබාදෙන ස්වයංක්‍රීය යන්ත්‍රය | | **28,000** | 28,000 |
| උසස් අධ්‍යාපනය සඳහා අනුග්‍රාහකත්වය - කොළඹ විශ්වවිද්‍යාලය | | **10,000** | 10,000 |
| සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | | **6,015,966** | 7,810,537 |
| | | **6,210,649** | 8,000,888 |
| **7 මුදල්** | | | |
| බැංකුවේ ඇති මුදල් | | **19,765,415** | 24,771,873 |
| අතැති මුදල් | | **40,000** | 40,000 |
| | | **19,805,415** | 24,811,873 |
| **8 සමුච්චිත අරමුදල** | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | | **6,352,068** | 9,508,528 |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය සඳහා සෙස් අරමුදලට මාරු කළ අරමුදල් | | **(10,000,000)** | (16,000,000) |
| වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය) | | **(13,190,265)** | 12,843,540 |
| වර්ෂය අවසානයේ ශේෂය | | **(16,838,197)** | 6,352,068 |

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **9 සෙස් අරමුදල** | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | | **2,193,243,136** | 2,097,094,924 |
| එකතු කළා : | | | |
| වර්ෂය තුළ ලැබූ සෙස් මුදල් | | **408,658,830** | 233,725,415 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොළිය | | **103,593,131** | 181,209,284 |
| ස්ථාවර තැන්පතු පොළිය | | **93,763,272** | 84,209,335 |
| අනෙකුත් ආයෝජන පොළිය | | **1,395,893** | 1,329,370 |
| ශ්‍රී ලංකා සු.හා.වි.කො.සභාවෙන් ලද අරමුදල් | | **10,000,000** | 16,000,000 |
| | | **2,810,654,262** | 2,613,568,328 |
| අඩු කළා : | | | |
| සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ මෙහෙයුම් හා ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් මාරු කිරීම් | | **355,951,000** | 325,980,000 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ අරමුදල් | | **-** | 94,250,000 |
| ස්ථාවර තැන්පතු පොළී මත අඩු කළ රඳවා ගැනීමේ බදු | | **6,842,805** | - |
| බැංකු ගාස්තු | | **121,845** | 95,192 |
| | | **362,915,650** | 420,325,192 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | | **2,447,738,612** | 2,193,243,136 |
| **10 වන්දි අරමුදල** | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | | **267,950,575** | 237,461,686 |
| වර්ෂය තුළ දී වැරදි සමථයකට පත් කිරීම මගින් ලැබූ මුදල | | **1,100,000** | - |
| එකතු කළා : ආයෝජන මත පොළිය - භාණ්ඩාගාර බිල්පත් | | **11,222,720** | 16,314,351 |
| ආයෝජන මත පොළිය - ස්ථාවර තැන්පතු | | **13,517,101** | 14,177,988 |
| | | **293,790,396** | 267,954,025 |
| අඩු කළා : ස්ථාවර තැන්පතු පොළී මත රඳවා ගැනීමේ බදු | | **543,937** | - |
| බැංකු ගාස්තු | | **4,360** | 3,450 |
| | | **548,297** | 3,450 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | | **293,242,099** | 267,950,575 |

# මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|
| **11 මූල්‍ය කල්බදු ණය හිමියෝ** | | |
| දළ කල්බදු වගකීම | - | 799,040 |
| අවිනිශ්චිත පොළී | - | (40,491) |
| | - | 758,549 |
| ඉදිරි වසර තුළ ගෙවිය යුතු - කල්බදු ණයහිමියන්ගේ ජංගම වගකීම් කොටස | - | 758,549 |
| ඉදිරි වසරට පසු ගෙවිය යුතු - කල්බදු ණය හිමියන්ගේ ජංගම නොවන වගකීම් කොටස | - | - |
| | - | 758,549 |
| **12 ප්‍රදානයන් - සෙස් අරමුදලෙන් ප්‍රාග්ධන වියදම් සඳහා මාරු කිරීම්** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **42,207,192** | 50,050,720 |
| ප්‍රාග්ධන වියදම් සඳහා වර්ෂය තුළ සෙස් අරමුදලෙන් මාරු කිරීම් | **22,272,773** | 7,432,959 |
| ප්‍රදානයන් හඳුනාගැනීම | **(15,804,195)** | (15,276,487) |
| වර්ෂය අවසානයේ ශේෂය | **48,675,770** | 42,207,192 |
| සටහන | | |
| ප්‍රදානයන් හඳුනා ගැනීම | | |
| පහත සඳහන් අනුපාතයන් යටතේ ප්‍රදානයන් හඳුනා ගැනේ. | | |
| මෝටර් වාහන | **10.00%** | 10.00% |
| කාර්යාල උපකරණ හා විද්‍යුත් දත්ත සැකසුම් උපකරණ හා අනෙකුත් | **20.00%** | 20.00% |
| පුහුණු කිරීමේ උපකරණ | **20.00%** | 20.00% |
| ගෘහභාණ්ඩ, සවිකිරීම් හා උපකරණ | **12.50%** | 12.50% |
| **13 විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා වන බැඳීම** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **21,606,766** | 20,012,197 |
| වර්ෂය සඳහා අය කිරීම් | **3,585,799** | 2,997,885 |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික | **(2,046,386)** | (1,403,316) |
| වර්ෂය අවසානයේ ශේෂය | **23,146,179** | 21,606,766 |

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **14 ණයහිමියන් සහ උපචිත වියදම්** | | | |
| දුරකථන, අන්තර්ජාල වියදම් | | **228,611** | 413,580 |
| විදුලිය | | **308,598** | 347,589 |
| කාර්‍ය මණ්ඩල වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය | | **464,439** | 388,044 |
| අධ්‍යක්ෂවරුන්ගේ ඉන්ධන ප්‍රතිපූර්ණය | | **35,655** | 70,633 |
| නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | **1,782,539** | 1,767,627 |
| අතිකාල ගෙවීම් | | **203,286** | 156,779 |
| බාහිර විගණන ගාස්තු | | **1,100,000** | 825,000 |
| අභ්‍යන්තර විගණන ගාස්තු | | **139,740** | 205,600 |
| වෘත්තීය ගාස්තු | | **227,500** | - |
| මහජන දැනුවත් කිරීම් | | **8,921,016** | 2,302,447 |
| කුරියර් ගාස්තු | | **-** | 7,528 |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය | | **12,062,140** | 480,000 |
| ගෙවිය යුතු එකතු කළ අගය මත බදු | | **498,165** | 105,395 |
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | | **8,675** | - |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | | **2,925** | - |
| විධායක යැපුම් දීමනාව | | **-** | 5,000 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | | **77,425** | 44,090 |
| කාර්ය මණ්ඩල පුහුණු - දේශීය | | **1,650** | 1,190,500 |
| සම්මන්ත්‍රණ වියදම් - CMET | | **19,000** | 110,250 |
| වෙළෙඳ බද්ද | | **5,000** | 10,000 |
| ගමන් වියදම් - දේශීය | | **11,247** | - |
| විදේශ සංචාර සඳහා වන රක්ෂණය | | **-** | 156,349 |
| බිඳ දමන යන්ත්‍ර නඩත්තුව | | **-** | 686 |
| ගෙවිය යුතු දෑ - සෙස් අරමුදල | | **-** | 216,659 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | | **32,352** | 3,676 |
| | | **26,129,963** | 8,807,432 |

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **15 කාර්‍ය මණ්ඩල පිරිවැය** | | | |
| කාර්‍ය මණ්ඩලයේ වැටුප් | | **86,978,135** | 82,065,746 |
| සභාපතිවරයාගේ දීමනා | | **900,000** | 900,000 |
| අතිකාල ගෙවීම් | | **1,466,350** | 1,495,885 |
| සේ.අ.අ. හා සේ.භා.අ. | | **13,595,107** | 12,679,165 |
| කාර්ය මණ්ඩල පාරිතෝෂික | 13 | **3,585,799** | 2,997,885 |
| ප්‍රසාද දීමනා | | **11,437,446** | 10,638,789 |
| නිවාඩු වෙනුවට ගෙවන මුදල් | | **2,074,787** | 2,032,563 |
| කාර්‍ය මණ්ඩලයේ වෛද්‍ය වියදම් හා රක්ෂණය | | **5,004,133** | 4,849,756 |
| කාර්‍ය මණ්ඩල හදිසි රක්ෂණ ආවරණ | | **827,020** | 640,286 |
| කාර්‍ය මණ්ඩල නිවාස ණය පොළී සහනාධාර | | **1,338,802** | 1,178,822 |
| කාර්‍ය මණ්ඩල සුභසාධනය | | **4,510,059** | 4,083,877 |
| විධායක යැපුම් | | **108,000** | 98,500 |
| අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ඉන්ධන ප්‍රතිපූර්ණ පිරිවැය | | **3,648,441** | 3,393,178 |
| අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා වාහන දීමනා | | **9,443,677** | 7,070,613 |
| කල්බදු සඳහා මූල්‍ය ගාස්තු | | **(23,740)** | 10,652 |
| විදෙස් ගමන් වියදම් සහ පුහුණු වියදම් | | **16,442,470** | 20,098,681 |
| කාර්‍ය මණ්ඩල පුහුණු වියදම්-දේශීය | | **2,130,583** | 2,043,342 |
| සාමාජික දායක මුදල් | | **699,632** | 512,265 |
| අධ්‍යයන සඳහා අනුග්‍රාහකත්වය* | | **1,017,139** | 354,664 |
| බඳවා ගැනීම් සඳහා දැන්වීම් ගාස්තු | | **365,475** | 1,715,581 |
| ආයතනික පුහුණුව ලබන්නන් සඳහා දීමනා | | **511,302** | 343,438 |
| | | **166,060,617** | 159,203,688 |

* ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ස්ථිර සේවකයන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා රු. 250,000/= ක උපරිමයකට යටත් වූ මුදලක් වසර තුනකට වරක් ආයතනයේ විධිවිධානවලට යටත්ව ලබා දෙන අතර, අදාළ පාඨමාලාව සහ විභාග සාර්ථකව සම්පූර්ණ කළ පසු අවුරුදු 2 ක කාලයක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සේවය කිරීමට ද සේවකයා බැඳී සිටී. වෙනයම් හේතුවක් හෝ ඉල්ලා අස්වීම හේතුවෙන් පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමට නොහැකි වූ සේවකයන් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් දරන ලද සම්පූර්ණ මුදල ආපසු ගෙවිය යුතු වේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ ද, එකඟ වූ සම්පූර්ණ කාලය ආයතනයට සේවය කිරීමට අසමත් වූ සේවකයන් සම්පූර්ණ කළ යුතු ඉතිරි සේවා කාලය සඳහා ගෙවිය යුතු මුදල සමානුපාතිකව ගණනය කර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවට ආපසු ගෙවිය යුතු වේ.

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **16 පරිපාලන හා ආයතනික වියදම්** | | | |
| කුලී සහ රථවාහන ගාල් කුලී | | **54,157,731** | 53,972,215 |
| විදුලි ගාස්තු | | **4,137,528** | 4,126,215 |
| කාර්යාල නඩත්තු | | **212,329** | 176,275 |
| කාර්යාල උපකරණ නඩත්තුව හා රක්ෂණය | | **3,455,132** | 8,125,058 |
| දුරකථන, අන්තර්ජාල, ඊ මේල් සහ වෙබ් | | **3,894,487** | 3,870,234 |
| මෝටර් වාහන ඉන්ධන, නඩත්තුව, බලපත්‍ර හා රක්ෂණය | | **2,858,197** | 2,146,928 |
| වෘත්තීය ගාස්තු | | **880,212** | 500,426 |
| සාමාජික ගාස්තු | | **1,135,500** | 985,895 |
| රැස්වීම් වියදම් | | **753,527** | 693,217 |
| ත්‍යාග හා විනෝදාස්වාද | | **288,747** | 207,327 |
| පුස්තකාල පොත් | | **39,114** | 25,490 |
| පුවත්පත් හා වාර ප්‍රකාශන | | **252,077** | 233,111 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | | **2,288,732** | 2,204,796 |
| දේශීය ගමන් වියදම් | | **525,347** | 385,226 |
| රක්ෂණ-සියලු අවදානම්, පොදු වගකීම්, ගිනි, මාර්ගස්ථ මුදල් | | **668,348** | 408,051 |
| තැපැල් හා මුද්දර ගාස්තු | | **85,830** | 1,886,924 |
| කුරියර් ගාස්තු | | **147,537** | 141,475 |
| නීති වියදම් | | **2,373,060** | 1,357,000 |
| විගණන ගාස්තු - අභ්‍යන්තර | | **277,580** | 205,600 |
| විගණන ගාස්තු - බාහිර | | **275,000** | 480,000 |
| පොදු වියදම් | | **477,470** | 138,689 |
| වෙළෙඳ බදු | | **5,000** | 10,000 |
| එකතු කළ අගය මත බදු | | **12,497,233** | 11,400,571 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | | **268,635** | 304,614 |
| ක්ෂය වීම් | 1 | **16,116,695** | 16,026,487 |
| | | **108,071,048** | 110,011,824 |
| **17 ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධන වියදම්** | | | |
| ප්‍රාග්ධන වෙළෙඳපොළ හා නිෂ්පාදිත සංවර්ධනය | | **36,102,668** | 15,938,352 |
| මහජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන් | | **48,708,493** | 38,755,180 |
| සම්මන්ත්‍රණ වියදම් | | **4,507,356** | 4,121,525 |
| අන්තර්ජාතික සාමාජික ගාස්තු - IOSCO | | **2,756,675** | 2,595,600 |
| ප්‍රචාරණ හා දැන්වීම් ගාස්තු | | **4,381,394** | 1,824,170 |
| වෙළෙඳපොළ ආවේක්ෂණ පිරිවැය | | **6,254,155** | 2,885,430 |
| විමර්ශන වියදම් | | **10,320** | 107,798 |
| | | **102,721,061** | 66,228,055 |

## මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

| | සටහන | 2014 රු. | 2013 රු. |
|---|---|---|---|
| **18 මූල්‍ය වියදම්** | | | |
| බැංකු ගාස්තු | | **83,805** | 85,112 |
| | | **83,805** | 85,112 |

### 19 බදුකරණය
1979 අංක 28 දරණ සංශෝධිත දේශීය ආදායම් පනත ප්‍රකාරව ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ආදායම් බදු අය කිරීමට යටත් නොවේ.

### 20 ප්‍රාග්ධන බැඳීම්
**DMS** ඉලෙක්ට්‍රොනික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් රු. 385,280 ක් වටිනා **HP Laserjet** බහුකාර්ය මුද්‍රණ යන්ත්‍ර හතරක් සහ පවර්නෙට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් රු. 94,248 ක් වටිනා දූවමය අල්මාරිය 2014 දෙසැම්බර් 31 දිනට පැවති
ප්‍රාග්ධන බැඳීම් වේ.

### 21 අසම්භාව්‍ය බැරකම්
2014 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය බැරකම් කිසිවක් නැත.

### 22 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්
2015 ජනවාරි මස ශ්‍රී ලාංකික නව රජය ස්ථාපිත කිරීමෙන් පසු ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වෙනස් විය.

- තිලක් කරුණාරත්න මහතා - සභාපති සහ පත්කළ සාමාජික
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- අර්ජුන හේරත් මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- රජීව් අමරසූරිය මහතා - පත්කළ සාමාජික
- දිල්ෂානි ගයත්‍රි විජයවර්ධන මිය - පත්කළ සාමාජික
- මරීනා ප්‍රනාන්දු මිය - පත්කළ සාමාජික
- එස්.ආර්. ආටිගල මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- සුරේෂ් ෂාහ් මහතා - පත්කළ සාමාජික
- රනිල් ටී. විජේසිංහ මහතා - පත්කළ සාමාජික
- පී. සමරසිරි මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික

### 23 සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය කිරීම
කොමිසමේ පහත සඳහන් සාමාජිකයින් 2014 පූර්ණ වර්ෂය තුළ ධූරය දරමින් සිටිති.

- ආචාර්ය නාලක ගොඩහේවා මහතා - සභාපති සහ පත් කළ සාමාජික
- ලෝලිත අබේසිංහ මහතා - පත් කළ සාමාජික
- මොහමඩ් සුරේෂ් හිෆාස් හෂීම් මහතා - පත් කළ සාමාජික
- බී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා - පත් කළ සාමාජික
- ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා - පත් කළ සාමාජික
- ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික
- අර්ජුන හේරත් මහතා - නිල බලයෙන් පත් වූ සාමාජික

කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් වසර තුළ දී දරන ලද සම්බන්ධතාවයන් පහත වගුවෙන් දක්වා ඇත.

| නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආචාර්ය නාලක ගොඩහේවා මහතා | ශ්‍රී ලංකා කේටරින් සර්විසස් | අධ්‍යක්ෂ |
| ලෝලිත අබේසිංහ මහතා | ලැයිස්තුගත සමාගම් මණ්ඩල අධ්‍යක්ෂ ධුරයක් නොමැත. | |
| මොහමඩ් සුරේෂ් හිෆාස් හෂීම් මහතා | ඩිවලොප්මන්ට් ඉන්ටර්ප්ලෑන් සිලෝන් සමාගම | අධ්‍යක්ෂ |
| | කෙරී මාල්ෂිප් ලොජිස්ටික්ස් ලංකා (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| ඩී.ඩී.ඩබ්.ඒ. සිල්වා මහතා | ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය | සභාපති |
| | ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | සභාපති |
| | අපි වෙනුවෙන් අපි කළමනාකරණ මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | පෙට්‍රෝලියම් කර්මාන්ත අමාත්‍යාංශය - විශේෂ ස්ථාවර අමාත්‍ය මණ්ඩල පත්වීම් ප්‍රසම්පාදන කමිටුව | සාමාජික |
| | වෙස්ට් කෝස්ට් පවර් (පුද්.) සමාගම | මණ්ඩල සාමාජික |
| ආචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා | - | |
| පී.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා | යුනියන් බැංකුව | ස්වාධීන අධ්‍යක්ෂ |
| | හඹන පෙට්‍රොකෙමිකල්ස් ලිමිටඩ් | ස්වාධීන අධ්‍යක්ෂ |
| | කමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පී එල් සී | ස්වාධීන අධ්‍යක්ෂ |
| | තැප්‍රොබේන් හෝල්ඩිංග්ස් පී එල් සී | ස්වාධීන අධ්‍යක්ෂ |
| | සිලෝන් ලෙදර් ප්‍රඩක්ට්ස් පී එල් සී | ස්වාධීන අධ්‍යක්ෂ |
| | ඉම්පීරියල් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් | ස්වාධීන අධ්‍යක්ෂ |
| | කමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | ස්වාධීන අධ්‍යක්ෂ |
| | තෝමස් කුක් ට්‍රැවල්ස් - ශ්‍රී ලංකා | ස්වාධීන අධ්‍යක්ෂ |
| | බ්‍රැක් ලංකා ෆිනෑන්ස් පී එල් සී | ස්වාධීන අධ්‍යක්ෂ |
| | ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි ලිමිටඩ් | සභාපති |
| | CEISOT (පුද්ගලික) සමාගම | සභාපති |
| ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා | ලංකා විදුලි බල මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | මණ්ඩල අධ්‍යක්ෂ |
| | නාගරික සංවර්ධන අධිකාරිය | කළමනාකරණ මණ්ඩලය |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ලිට්‍රෝ ගෑස් ලිමිටඩ් | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ශ්‍රී ලංකා ප්‍රතිපත්ති ආයතනය | මණ්ඩල අධ්‍යක්ෂ |
| | පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | මණ්ඩල අධ්‍යක්ෂ |
| | සෙවන අරමුදල | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ලංකා සීනි සමාගම | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා කාබන් ෆන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ් | කළමනාකරණ අධ්‍යක්ෂ සහ මණ්ඩල සාමාජික |
| ඩී.එන්.ආර්. සිරිවර්ධන මහතා | ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය | සාමාජික |
| | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| අර්ජුන හේරත් මහතා | ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලය | අධ්‍යක්ෂ |
| | පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | අධ්‍යක්ෂ |
| | අර්නස්ට් ඇන්ඩ් යන්ග් | හවුල්කරු |
| | කන්ෆෙඩරේෂන් ඔෆ් ඒෂියන් ඇන්ඩ් පැසිෆික් අකවුන්ටන්ට්ස් | අධ්‍යක්ෂ |
| | සවුත් ඒෂියන් ෆෙඩරේෂන් ඔෆ් අකවුන්ටන්ට්ස් | අධ්‍යක්ෂ |

වෙළෙඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාරික ගණුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන් අතර වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගණුදෙනුවක් සිදු නොවීය.

# විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එෆ්බී/කේ/එස්ජීඑෆ්/1/14/4    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ජුනි 08 දින

සභාපති,
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව.

**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත ප්‍රකාර ඇතිකරන ලද පියවීම් සහතික කිරීමේ අරමුදල සම්බන්ධයෙන් වූ 1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 11(ඇ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34    +94-11-2887223    oaggov@sltnet.lk    www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 48,059,546 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 56,244,470 ක් වූයෙන් රු.8,184,924 ක මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් දැක්වුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව පොළී ආදායම රු.7,214,825 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 අරමුදලේ කටයුතු
---------------------

1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 5(අ) ඡේදය පරිදි මධ්‍යම තැන්පතු පද්ධතියේ නිශ්කාෂන සාමාජිකයින් අතර අර්බුද වාර්තා වී නොතිබුණ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වන්දි ගෙවීමක් සිදුකර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - පියවීම සහතික කිරීමේ අරමුදල
දෙසැම්බර් 31 දිනට

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | **468,319,230** | 435,743,484 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | **124,680,473** | 98,881,487 |
| ලැබිය යුතු මුදල් | 5 | **10,999,631** | 21,330,438 |
| බැංකුවේ ඇති මුදල් | | **158,198** | 26,424,697 |
| **මුළු වත්කම්** | | **604,157,532** | 582,380,106 |
| සංචිත සහ වගකීම් | | | |
| සංචිත | | | |
| ප්‍රදානයන් - භාණ්ඩාගාරය | | **50,000,000** | 50,000,000 |
| ප්‍රදානයන් - සෙස් අරමුදල | | **100,000,000** | 100,000,000 |
| ප්‍රදානයන් - කොළඹ කොටස් හුවමාරුව | | **100,000,000** | 100,000,000 |
| සමුච්චිත අරමුදල | | **353,889,651** | 305,830,105 |
| | | **603,889,651** | 555,830,105 |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු වියදම් | 6 | **267,881** | 26,550,001 |
| | | **267,881** | 26,550,001 |
| **මුළු සංචිත හා වගකීම්** | | **604,157,532** | 582,380,106 |

88 සිට 90 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකරුවන් සතු වගකීමකි.

පියවීම් සහතික කිරීමේ අරමුදල වෙනුවෙන්

**වජිර විජේගුණවර්ධන**
*භාරකරු-පියවීම් සහතික කිරීමේ අරමුදල*

**තිලක් කරුණාරත්න**
*භාරකරු-පියවීම් සහතික කිරීමේ අරමුදල*

කොළඹදී ය.
2015 මැයි 28 වෙනි දිනදීය.

## මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය - පියවීම සහතික කිරීමේ අරමුදල
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ආදායම් | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය මත පොළිය | **38,377,130** | 53,475,225 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජනය මත පොළිය | **10,656,015** | 2,772,745 |
| | **49,033,145** | 56,247,970 |
| අඩුකළා : | | |
| වියදම් | | |
| විගණන ගාස්තු | **10,000** | - |
| බැංකු ගාස්තු | **1,450** | 3,500 |
| ස්ථාවර තැන්පතු පොළී මත රඳවා ගැනීමේ බදු අඩු කිරීම් | **962,149** | - |
| මුළු වියදම් | **973,599** | 3,500 |
| වර්ෂය සඳහා වියදමට වැඩි ආදායම | **48,059,546** | 56,244,470 |

88 සිට 90 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

## ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය - පියවීම සහතික කිරීමේ අරමුදල
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| සමුච්චිත අරමුදල | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **305,830,105** | 249,585,635 |
| වර්ෂය සඳහා ශුද්ධ ආදායම | **48,059,546** | 56,244,470 |
| **වර්ෂය අවසානයේ ශේෂය** | **353,889,651** | 305,830,105 |

88 සිට 90 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය - පියවීම් සහතික කිරීමේ අරමුදල
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ආදායම | | **48,059,546** | 56,244,470 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් | | | |
| අනෙකුත් ලැබීම් (වැඩි වීම) / අඩුවීම | 5 | **10,330,807** | 18,742,331 |
| අනෙකුත් ගෙවීම් (වැඩි වීම) / අඩුවීම | 6 | **(26,282,120)** | 26,231,975 |
| | | **(15,951,313)** | 44,974,306 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | **32,108,233** | 101,218,776 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ | | | |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | | **(32,575,746)** | 23,894,240 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | **(25,798,986)** | (98,881,487) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(58,374,732)** | (74,987,247) |
| මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(26,266,499)** | 26,231,529 |
| කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ | | **26,424,697** | 193,168 |
| **කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ (සටහන අ)** | | **158,198** | 26,424,697 |
| සටහන අ | | | |
| කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ | | | |
| බැංකුවේ ඇති මුදල් | | **158,198** | 26,424,697 |
| | | **158,198** | 26,424,697 |

88 සිට 90 දක්වා පිටුවල අඩංගු සටහන් මූල්‍ය ප්‍රකාශනවල සංගත කොටසකි.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති - පියවීම සහතික කිරීමේ අරමුදල

## 1 සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ පියවීම සහතික කිරීමේ අරමුදල යනු ලාභ උපයනු නොලබන ආයතනයක් වන අතර, ශ්‍රී ලංකා රාජ්‍ය ආයතන ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශනයන් සකස් කර තිබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකාර මණ්ඩලය වගකිව යුතු වේ.

### 1.3 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පියවීම් සහතික කිරීමේ අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව භාරකාර මණ්ඩලය විසින් තක්සේරු කර තිබේ. අවිනිශ්චිත අනාගතයක් දක්වා මෙහෙයුම් පැවැත්ම අඛණ්ඩව සිදු කිරීම පිණිස පියවීම් සහතික කිරීමේ අරමුදලට ප්‍රමාණවත් සම්පත් ඇති බවට භාරකාර මණ්ඩලයට සාධාරණ අපේක්ෂාවක් තිබේ. අනාගතය සම්බන්ධයෙන් පවත්නා සියලුම තොරතුරු සැලකිල්ලට ගනිමින් භාරකාර මණ්ඩලය මෙහෙයුම් ඇවර කිරීමේ හෝ අවසන් කිරීමේ අවශ්‍යතාවයක් ඇති බව පූර්වේක්ෂණය නොකරයි.

### 1.4 පිළියෙල කිරීමේ පදනම

පියවීම් සහතික කිරීමේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර, ඒවා ආසන්නතම රුපියලට වටයා ඇත. මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත ය. යෝග්‍ය අවස්ථාවන්හි දී ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල දක්වා ඇත.

### 1.5 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් වල කරුණු සම්බන්ධව වර්තමාන මූල්‍ය ප්‍රකාශනයට අවශ්‍ය ගැලපීම් හා හෙළිදරව් කිරීම් අවශ්‍ය තැන්හි දී යෝග්‍ය පරිදි සිදු කරනු ඇත.

### 1.6 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

යොදා ගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ සංගත වේ.

### 1.7 සංසන්දනාත්මක අගයන්

සංසන්දනාත්මක අගයන් ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළ ඉදිරිපත් වන ආකාරයෙන් වෙනස්කම්වලට යෝග්‍ය පරිදි ගැලපීම් සිදු කර තිබේ.

## 2 වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

### 2.1 ආයෝජන

බලපත්‍රලාභී රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතුවල සහ රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත්වල පමණක් ආයෝජනය සිදු කර ඇති අතර, පිරිවැය යටතේ දක්වා ඇත.

### 2.2 ලැබිය යුතු දෑ

ඇස්තමේන්තුගත උපලබ්ධි වන අගයට ලැබිය යුතු අගයන් සඳහන් කර ඇත.

## 3 වගකීම් හා ප්‍රතිපාදන

### 3.1 විශ්‍රාමික ප්‍රතිලාභ

පියවීම් සහතික කිරීමේ අරමුදලේ පරිපාලනමය කටයුතු භාරකරුවෙකු හරහා සිදු කරන බැවින් සහ අරමුදලේ සේවයේ නියුක්ත පූර්ණකාලීන සේවක මඩුල්ලක් නොමැති බැවින් 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

### 3.2 ගෙවිය යුතු මුදල්

ගෙවිය යුතු මුදල්, මුදල් පිරිවැය යටතේ ගණනය කෙරේ.

## 4 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

### 4.1 ආදායම් හඳුනා ගැනීම

ආයෝජන මත පොළිය උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 4.2 වියදම් හඳුනා ගැනීම

අරමුදල පවත්වාගෙන යාම සඳහා දරූ සියලු වියදම්, වියදමට වැඩි අතිරික්ත ආදායම ගණනය කිරීමේ දී ආදායමෙන් අඩු කර පෙන්වා ඇත.

### 4.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කොට ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දේ අතැති මුදල් සහ බැංකු ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ.

## 5 ලැබිය යුතු දෑ

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| ලැබිය යුතු පොළිය | | |
| - භාණ්ඩාගාර බිල්පත් | **9,052,006** | 18,557,693 |
| - ස්ථාවර තැන්පතු | **1,947,625** | 2,772,745 |
| | **10,999,631** | 21,330,438 |

## 6 ගෙවිය යුතු දෑ

| | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|
| විගණන ගාස්තු | **267,881** | 257,882 |
| ලංකා බැංකුවට ගෙවිය යුතු | **-** | 26,292,119 |
| | **267,881** | 26,550,001 |

## 7 ප්‍රාග්ධන බැඳීම්

2014 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොවිය.

## 8 අසම්භාව්‍ය වගකීම්

2014 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොවිය.

## 9 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

2015 ජනවාරි මස ශ්‍රී ලාංකීය නව රජය ස්ථාපිත කිරීමෙන් පසු පියවීම් සහතික කිරීමේ අරමුදලෙහි භාරකාරයන් වනුයේ
තිලක් කරුණාරත්න මහතා - සභාපති, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
වජිර කුලතිලක මහතා - සභාපති, කොළඹ කොටස් හුවමාරුව
රජීව බණ්ඩාරණායක මහතා - අධ්‍යක්ෂ ජනරාල්, කොළඹ කොටස් හුවමාරුව
වජිර විජේගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
එස්.ආර්. ආටිගල මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

## 10 සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය කිරීම

ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද, කොළඹ කොටස් හුවමාරුවේ සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා ද, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ද පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවන් ලෙස කටයුතු කරති.

පහත සඳහන් භාරකරුවන් 2014 වසර තුළ ධුරයන් දරන ලදී.

- ආචාර්ය නාලක ගොඩහේවා මහතා - ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සභාපති
- ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා - මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්
- රජීව බණ්ඩාරනායක මහතා - ප්‍රධාන විධායක නිලධාරී, කොළඹ කොටස් හුවමාරුව

වජිර කුලතිලක මහතා කොළඹ කොටස් හුවමාරුවේ සභාපති ලෙස 2014 ජූනි 05 වන දින වැඩ භාර ගත්තේ ය. කොළඹ කොටස් හුවමාරුවේ සභාපති ලෙස නිල බලය පදනම් කරගෙන 2014 ජූනි 05 දින සිට පියවීම් සහතික කිරීමේ අරමුදලේ භාරකරුවකු ලෙස ඔහුව පත් කරන ලදී.

ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා කොළඹ කොටස් හුවමාරුවේ සභාපති ධුරයෙන් ඉවත් වීමත් සමගම මෙහි භාරකරුවෙකු ලෙස එම ධුරයෙන් 2014 ජූනි 05 වන දින සිට ඉවත් විය.

වර්ෂය තුළ අරමුදලේ භාරකරුවන් විසින් දරණ ලද සම්බන්ධතාවය පහත වගුවෙහි දක්වා ඇත.

| භාරකරුගේ නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ආචාර්ය නාලක ගොඩහේවා මහතා | ශ්‍රී ලංකා කේටරින් සර්විසස් | අධ්‍යක්ෂ |
| | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව | සභාපති |
| වජිර කුලතිලක මහතා | එන්.ඩී.බී. ඉන්වෙස්ට්මන්ට් බැන්ක් ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| | එන්.ඩී.බී. සිකියුරිටීස් (පුද්) සමාගම | අධ්‍යක්ෂ |
| | එන්.ඩී.බී. වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| | එන්.ඩී.බී. කැපිටල් ලිමිටඩ් - බංග්ලාදේශය | අධ්‍යක්ෂ |
| | එන්.ඩී.බී. කැපිටල් හෝල්ඩිංග්ස් ලිමිටඩ් | අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී |
| | එන්.ඩී.බී. සිපිර් පාර්ට්නර්ස් ලංකා (පුද්:) සමාගම | අධ්‍යක්ෂ |
| | එන්.ඩී.බී. සිපිර් පාර්ට්නර්ස් ලිමිටඩ් - මොරීෂස් | අධ්‍යක්ෂ |
| | එමරල්ඩ් ශ්‍රී ලංකා ෆන්ඩ් ලිමිටඩ් - මොරීෂස් | අධ්‍යක්ෂ |
| | කොළඹ කොටස් හුවමාරුව | සභාපති |
| ආචාර්ය බී.එම්.එස්. බටගොඩ මහතා | ලංකා විදුලි බල මණ්ඩලය | මණ්ඩල සාමාජික |
| | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් | මණ්ඩල අධ්‍යක්ෂ |
| | නාගරික සංවර්ධන අධිකාරිය | කළමනාකරණ මණ්ඩල |
| | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ලිත්‍රෝ ගෑස් ලිමිටඩ් | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය | මණ්ඩල අධ්‍යක්ෂ |
| | පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනය | මණ්ඩල සාමාජික |
| | සෙවන අරමුදල | මණ්ඩල අධ්‍යක්ෂ |
| | ශ්‍රී ලංකා කාබන් ෆන්ඩ් (පුද්) සමාගම | කළමනාකරණ අධ්‍යක්ෂ සහ මණ්ඩල අධ්‍යක්ෂ |
| | ලංකා සීනි සමාගම | මණ්ඩල සාමාජික |
| | මූල්‍ය හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | නියෝජ්‍ය භාණ්ඩාගාරික ලේකම් |
| රජීව බණ්ඩාරනායක මහතා | කොළඹ කොටස් හුවමාරුව | ප්‍රධාන විධායක නිලධාරී |

## ගිණුම්කරණ ප්‍රතිපත්ති - පියවීම සහතික කිරීමේ අරමුදල

සමාලෝචිත වර්ෂය තුළ දී අරමුදලේ භාරකරුවන් වශයෙන් පත්ව ධුර දැරීම අවසන් වූ සාමාජිකයින්ගේ ධුර දැරීම් පිළිබඳ විස්තරයක් පහත දක්වෙන සටහනෙහි දක්වා ඇත.

| භාරකරුගේ නම | ආයතනයේ නම | සම්බන්ධතාවය |
|---|---|---|
| ක්‍රිෂාන් බාලේන්ද්‍ර මහතා | ජෝන්කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | ජේ කේ මාකටින් සර්විසස් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී | අධ්‍යක්ෂ |
| | නෙක්සස් නෙට්වර්ක් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | ජෝන් කීල්ස් කැපිටල් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | ජෝන් කීල්ස් බී පී ඕ හෝල්ඩිංග්ස් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | ජෝන් කීල්ස් බී පී ඕ සොලියුෂන්ස් ඉන්දියා (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | බ්‍රිටිෂ් ඕවර්සීස් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | වෝල්ඩොක් මැකන්සී ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| | අලයිඩ් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | අධ්‍යක්ෂ |
| | ජෝන් කීල්ස් බී පී ඕ ඉන්ටර්නැෂනල් (පුද්.) සමාගම | අධ්‍යක්ෂ |
| | ජෝන් කීල්ස් බී පී ඕ සොලියුෂන්ස් කැනඩා ඉන්ක්. | අධ්‍යක්ෂ |

වෙළෙඳපොළ මිල යටතේ වූ සාමාන්‍ය ව්‍යාපාරික ගණුදෙනු හැරුණු විට ඉහත කී පාර්ශවයන් අතර වර්ෂය තුළ දී වෙනත් කිසිදු ගණුදෙනුවක් සිදු නොවීය.

# සටහන්

# සටහන්

## ආයතනික තොරතුරු


**කාර්යාලයීය ලිපිනය**
28 හා 29 වන මහල
නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
ඇවිලන් චතුරස්‍රය
කොළඹ 01.
ශ්‍රී ලංකාව

**දුරකථන**
+94 11 2331013-6
+94 11 2439144-8

**ෆැක්ස්**
+94 11 2439149

**ඊ මේල්**
mail@sec.gov.lk

**අන්තර්ජාලය**
www.sec.gov.lk


**නෛතික තත්ත්වය**
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව 1991 අංක 26 හා 2003 අංක 18 සහ 2009 අංක 47 දරණ පනත් මගින් සංශෝධිත 1987 අංක 36 දරණ ව්‍යවස්ථාදායක පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් වේ. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු විෂය පථය යටතට ගැනේ.

**ගිණුම් වර්ෂය**
2014 දෙසැම්බර් 31

**විගණකවරුන්**
විගණකාධිපතිවරයා

**බැංකුකරුවන්**
ලංකා බැංකුව
සම්පත් බැංකුව
කොමර්ෂල් බැංකුව
හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ්


optima
Design & Concept by: Optima Designs (Pvt) Ltd.
Printed by: Printel (Pvt) Ltd.

www.sec.gov.lk